උසස් පෙළ නව විෂය නිර්දේශය

ජීව විද්‍යාව

ප්‍රකාශනය සහ බෙදාහැරීම

PRO WORDS BOOK SHOP

No. 31/7, Minuwangoda Road, Gampaha.

පොත් ගෙන්වාගැනීම සඳහා විමසීම්

0712 897547

උසස් පෙළ නව විෂය නිර්දේශය

ජීව විද්‍යාව

1985-2019

නව විෂය නිර්දේශයට අනුව
සංශෝධනය කළ සහ වර්ගීකරණය කළ

බහුවරණ

BOOK 04

5 වන ඒකකය | සත්ත්ව ආකාරය සහ ක්‍රියාකාරීත්වය

5 ඒකකය සත්ත්ව ආකාරය හා ක්‍රියාකාරීත්වය

නිපුණතාව 5.1.0 : සතුන්ගේ ව්‍යුහය හා වර්ධනය
නිපුණතා මට්ටම 5.1.1: සත්ත්ව පටක

(01) අපිච්ඡද පිළිබඳ පහත සඳහන් කුමන ප්‍රකාශය අසත්‍යද?
1. අපිච්ඡද දරණු පටල මත තැන්පත් වේ.
2. අපිච්ඡද සඳහා පැහැදිලි රුධිර සැපයුමක් නොමැත.
3. ශරීර පිටස්තරයේ ඇති අපිච්ඡද පමණක් ස්ථරීභූත වේ.
4. සෛල ආසන්නව ඇසිරී ඇත.
5. අපිච්ඡද වල පෘෂ්ඨ දෙකක් අඩංගු වේ. (1986 - Z)

(02) අරියල පටකය;
1. විශේෂණය වූ පටකයක් සේ සැලකිය හැකිය.
2. වැඩි වශයෙන්ම චර්මයට යටින් පිහිටයි
3. අපිච්ඡද හා ඊට යටින් පිහිටි පටක බැඳ තබයි
4. පූරක ස්වල්පයක් පමණක් සහිතයි.
5. වැඩි වශයෙන්ම ප්‍රත්‍යාස්ථ තන්තු සහිතයි. (1987 - Z)

(03) මිනිසාගේ ශරීරයෙහි වැඩි වශයෙන්ම දක්නට ලැබෙන සම්බන්ධක පටක වර්ගය කුමක්ද?
1. අරියල 2. මේද 3. ශ්වේත තන්තුමය
4. කහ ප්‍රත්‍යාස්ථ 5. අස්ථි (1988 - Z)

(04) පහත සඳහන් ඒවා අතරින් විලිබිත පේශි තන්තුවක් සංකෝචනය වීමේ දී කෙටි වනුයේ කුමක්ද?
1. එන්ඩොමයිසියම 2. සාකොමියරය 3. ඇක්ටීන් සූත්‍රිකාව
4. මයෝසීන් සූත්‍රිකාව 5. Z රේඛාව (1990 - Z)

(05) සියලු අපිච්ඡද,
1. එකස්තරීයයි. 2. දරණු පටල මත පිහිටයි. 3. බාහිරව පිහිටයි
4. එන්සයිම ස්‍රාවය කරයි 5. අවශෝෂණ කෘත්‍යයන් ඉටු කරයි (1990 - Z)

(06) පහත සඳහන් වගන්ති අතරින් සම්බන්ධක පටක පිළිබඳ නිවැරදි වගන්තිය වන්නේ කුමක්ද?
1. අස්ථිවල පූරකය $CaSO_4$ මගින් ශක්තිමත් වී ඇත
2. කාටිලේජ වල පූරකයෙහි රුධිර වාහිනී ජාලයක් ඇත.
3. තන්තුමය සංඝටකයක් රුධිරයෙහි නොමැත.
4. කොලජන් තන්තු දක්නට ලැබෙන්නේ තන්තුමය සම්බන්ධක පටක වල පමණි
5. අරියල පටකයෙහි තන්තු ස්වල්පයක් ද පූරකය විශාල ප්‍රමාණයක් ද ඇත. (1990 - Z)

(07) පහත සඳහන් ඒවා අතරින් තනි සෛලයක් හෝ සෛල කොටසක් හෝ නොවන්නේ කුමක්ද?
1. ස්නායු තන්තුව 2. කොලැජන් තන්තුව 3. කංකාල පේශි තන්තුව
4. කුකුල් ඩිම්බය 5. මිනිසු ශුක්‍රාණුව (1992 - Z)

(08) සිනිඳු පේශි ප්‍රධාන පේශි පටකය ලෙසට නොපිහිටන්නේ පහත සඳහන් අවයව අතරෙන් කුමන අවයවයෙහිද?
1. දිව 2. මුත්‍රාශය 3. පෙනහැල්ල 4. ආමාශය 5. ධමනිය (1992 - Z)

(09) පහත සඳහන් වගන්ති අතරින් කාටිලේජ පිළිබඳ වැරදි වගන්තිය කුමක්ද?
1. එය සම්බන්ධක පටක වර්ගයකි.
2. පූරකය ප්‍රෝටීන සහ $CaCO_3$ සහිත වේ.
3. එයට විශේෂ වර්ගයක පූරකයක් ඇත.
4. එහි කොන්ඩ්‍රොසයිට ඇත.
5. පූරකයෙහි රුධිර වාහිනී නොමැත (1992 - Z)

(10) පහත සඳහන් වගන්ති අතරින් සිනිඳු පේශි තන්තු පිළිබඳ වැරදි වනුයේ කුමක්ද
1. මේවා විලේඛ රහිතයි.
2. මේවා බහු න්‍යෂ්ටිකයි
3. මේවායේ අන්තරස්ථාපිත මඩල නොමැත
4. මේවා සිලින්ඩරාකාර හැඩැතිය.
5. මේවා ක්‍රියා කරන්නේ අනිච්ඡානුගවය. (1993 - Z)

(11) පහත සඳහන් වගන්ති අතරින් ස්තරීභූත අපිච්ඡද පිළිබඳ වැරදි වන්නේ කුමක්ද?
1. මතුපිට ස්තර කොරොස් විය හැකිය.
2. ඝනාභ සෛල තිබිය හැකියි
3. ඒවායෙහි පුළුල්ව පැතිරුණු රුධිර කේශනාලිකා ජාල ඇත.
4. සමහර අපිච්ඡද ස්‍රාවී කෘත්‍යයක් ඉටු කරයි.
5. අන්තර්සෛලීය ද්‍රව්‍ය ස්වල්ප ප්‍රමාණයක් ඇත. (1993 - Z)

(12) මිනිසාගේ සරල ඝනාකාර අපිච්ඡදය දක්නට ලැබෙන්නේ,
1. පෙනහලු වල ගර්ත ය. 2. රුධිර කේශනාලිකා වල ය
3. මුත්‍රාශ බිත්තියෙහි ය 4. ක්ෂුද්‍රාන්ත ආස්තරයෙහි ය.
5. වෘක්කානුවෙහි විදූර සංවලිත නාලිකාවෙයි ය (1994 - Z)

(13) ආලෝක අන්වීක්ෂයක් භාවිතා කර හඳුනා ගැනීම සඳහා ශිෂ්‍යයෙකුට මිනිස් අවයවයක හරස්කඩක් සහිත කදාවක් දී ඇත. සරල ඝනාකාර අපිච්ඡදයෙන් ආස්තරණය වූ නාලිකා වල වෘත්තාකාර හා දිගටි කඩ විශාල සංඛ්‍යාවක් ඔහු නිරීක්ෂණය කරයි. මෙම කදාවෙහි ඇති හරස් කඩ,
1. තයිරොයිඩ ග්‍රන්ථියෙහි ය 2. වෘක්කයෙහි ය 3. අක්මාවෙහි ය
4. අග්න්‍යාශයෙහි ය 5. වෘෂණයෙහි ය (1995 - Z)

(14) මිනිස් දේහයෙහි ඇති පහත සඳහන් ව්‍යුහ අතරින් පක්ෂ්මධර අපිච්ඡදයකින් ආස්තරණය වී ඇත්තේ කුමක්ද?
1. අන්ත්‍රය 2. ධමනිය 3. ශිරාව 4. ඩිම්බ ප්‍රණාලය
5. මුත්‍ර මාර්ගය (1995 - Z)

(15) පක්ෂ්මධර අපිච්ඡදය,
1. මුත්‍රාශය ආස්තරණය කරයි. 2. යෝනි මාර්ගය ආස්තරණය කරයි.
3. ශ්වාසනාලිකා ආස්තරණය කරයි. 4. ක්ෂුද්‍රාන්තය ආස්තරණය කරයි.
5. ශුක්‍රධර නාලිකා ආස්තරණය කරයි. (1996 - Z)

(16) මිනිසුන්ගේ කෙටිම ජීවිත කාලයක් සහිත සෛල වනුයේ,
1. රක්තාණු ය 2. නියුරෝන ය 3. සුදු රුධිරාණු ය 4. ශුක්‍රාණු ය
5. ඩිම්බ ය (1996 - Z)

(17) මිනිසාගේ ඝනාකාර අපිච්ඡදය ඇත්තේ,
1. බෝමන් ප්‍රාවරයේ ය 2. මුත්‍රාශයේ ය 3. මහාන්ත්‍රයේ ය
4. තයිරොයිඩ් ග්‍රන්ථියේ ය 5. රුධිර වාහිනී වල ය (1997 - Z)

(18) මිනිස් අවයවයක හරස්කඩක්, ආලෝක අන්වීක්ෂයක මැදි බලය යටතේ පරීක්ෂා කිරීමේදී මධ්‍ය පෙදෙසක සිට අරීය ව, විහිදෙන සමාන සෛල වලින් යුත් සෛල පේළි සහිත ප්‍රදේශ දක්නට ලැබුණි. මෙම හරස් කඩ,
1. වෘක්කයෙහි විය හැකිය 2. අක්මාවෙහි විය හැකිය
3. අග්න්‍යාශයෙහි විය හැකිය 4. වෘෂණයෙහි විය හැකිය
5. තයිරොයිඩයෙහි විය හැකිය (1997 - Z)

(19) පහත සඳහන් වගන්ති අතරින් මිනිසාගේ කංකාල පේශි තන්තු පිළිබඳ ව අසත්‍ය වනුයේ කුමක්ද?
1. ඒවායෙහි විලිඛිත පෙනුමක් ඇත
2. ඒවා සිලින්ඩරාකාර ය
3. ඒවා සාමාන්‍යයෙන් ඉච්ඡානුග පාලනය යටතේ පවතියි.
4. ඒවා බහු න්‍යෂ්ටික වේ
5. ඒවා සමෙහි රෝමෝද්ගාමක පේශිවල ඇත. (1997 - Z)

(20) ප්‍රතිදේහ නිපදවන රුධිර සෛල වනුයේ,
1. මොනෝසයිට ය 2. නියුට්‍රොපිල ය 3. වසා සෛල ය
4. බේසොපිල ය 5. ඉයොසිනොපිල ය (1998 - Z)

(21) කංකාල පේශි තන්තුවක්,
1. බහු න්‍යෂ්ටිකය 2. ශාඛනය වී ඇත 3. එක් සාකොමියරයක් දරයි
4. මයිටොකොන්ඩ්‍රියා සුළු සංඛ්‍යාවක් සහිත ය
5. තර්කු හැඩය ගනියි. (1998 - Z)

(22) මිනිසුන්ගේ ස්තරීභූත අපිච්ඡදයක් නොමැත්තේ,
1. අපිචර්මයේ ය 2. මුඛ කුහරයේ ය 3. ගුදයේ ය
4. යෝනි මාර්ගයේ ය 5. ශ්වාසනාලයේ ය (1998 - Z)

(23) මිනිසාගේ ස්තරීභූත ශල්කමය අපිච්ඡදය,
1. අපිචර්මයෙහි පිහිටා ඇත.
2. ස්‍රාවීය කෘත්‍යයක් ඉටු කරයි.
3. පැතලි සෛල වලින් පමණක් සමන්විත වෙයි.
4. ඇඳෙන සුළු ය 5. වාහිනීමය ය (1999 - Z)

(24) පහත සඳහන් ඒවා අතරින් කාටිලේජ පිළිබඳ ව අසත්‍ය වන්නේ කුමක්ද?
1. එය සියලු පෘෂ්ඨවංශීන්ට ඇත 2. එහි රුධිර වාහිනී නොමැත.
3. කොන්ඩ්‍රොයිටින් සල්පේට් ඇත 4. එය සම්බන්ධක පටකයකි.
5. පුනරාවර්ථන ඒකක සහිත වේ. (1999 - Z)

(25) මිනිස් දේහයෙහි, සරල ශල්කමය අපිච්ඡදයක් ඇත්තේ,
1. අන්නස්‍රෝතයේ ය. 2. මුත්‍රාශයේ ය.
3. ශ්වාසනාලයේ ය. 4. තයිරොයිඩ ග්‍රන්ථියේ යි.
5. බෝමන් ප්‍රාවරයේ ය. (2000 - Z)

(26) පහත සඳහන් වගන්ති අතරෙන් මිනිසාගේ මේද පටකය සම්බන්ධයෙන් වැරදි වගන්තිය වනුයේ කුමක් ද?
1. එය ශක්ති ප්‍රභවයක් ලෙස ක්‍රියා කරයි.
2. එය චර්මයෙහි ඇත.
3. එය තාප යාමනය සඳහා ඉවහල් වේ.
4. සාමාන්‍යයෙන් මෙය පුරුෂයන්ට වඩා ස්ත්‍රීන්ගේ ඇත.
5. එහි කොලැජන් තන්තු තදින් ඇසිරී ඇත. (2000 - Z)

(27) වැඩිම ජල ප්‍රතිශතයක් අඩංගු පටකය වනුයේ,
1. රුධිර ය. 2. කාටිලේජ ය. 3. අරියල පටක ය.
4. මේද පටක ය. 5. අස්ථි ය. (2000 - Z)

(28) කංකාල පේශි තන්තුවක්,
1. තර්කුරූපී හැඩයක් ගනී. 2. විලේඛ දරයි.
3. අනිච්ඡානුග සංකෝචනය දක්වයි. 4. ඒකන්‍යෂ්ටික ය.
5. කිසි විටෙකත් විඩාවට පත් නොවේ. (2001)

(29) ශිෂ්‍යයෙක් සත්ත්ව පටකයක් ආලෝක අන්වීක්ෂයෙන් පරීක්ෂා කිරීමේ දී එහි සෛල දරණු පටලයක් මත පිහිටන බව නිරීක්ෂණය කළේ ය. මෙම පටකයේ තිබීමට වඩාත් ම ඉඩ ඇත්තේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. රතු රුධිර සෛල 2. කොලැජන් තන්තු 3. විශාල පූරකය
4. කහ තන්තු 5. පක්ෂ්ම (2002)

(30) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් හෘත් පේශී තන්තුවක් සහ සිනිඳු පේශී තන්තුවක් යන දෙක ම පිළිබඳ ව නිවැරදි වනුයේ කුමක් ද?
1. ඒවි විලිබිත ය.   2. ඒවා තර්කු හැඩැති ය.
3. ඒවා කිසිවිටෙකත් විඩාවට පත් නොවේ.   4. ඒවා ශාඛනය වී ඇත.
5. ඒවා අනිච්ඡානුග පාලනයට යටත් ය. (2002)

(31) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් කංකාල පේශි තන්තුවක් පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
1. එහි සංකෝචන ක්‍රියාවලිය ස්වයංසාධක ස්නායු පද්ධතිය මගින් පාලනය වේ.
2. එය කිසි විටෙකත් විඩාවට පත් නොවේ.
3. එය ශාඛනය වී නොමැත.
4. එය සාකොමියර රැසක් දරයි.
5. එය ඒකන්‍යෂ්ටික ය. (2003)

(32) එක් හිමොග්ලොබින් අණුවක් සමග සම්බන්ධ වන ඔක්සිජන් අණු ගණන,
1. එකකි.   2. දෙකකි.   3. තුනකි.   4. හතරකි.   5. පහකි. (2004)

(33) මිනිසාගේ සරල ශල්කමය අපිච්ඡද දක්නට ලැබෙනුයේ,
1. අපිචර්මයේ සහ මුඛ කුහරයේ ය.
2. ස්වේද ග්‍රන්ථි ප්‍රණාල සහ බේට ග්‍රන්ථි ප්‍රණාලවල ය.
3. මුත්‍රාශයේ සහ බෝමන් ප්‍රාවරයේ ය.
4. ගර්ත සහ රුධිර කේශනාලිකාවල ය.
5. තයිරොයිඩ ග්‍රන්ථියේ සහ වෘක්කාණුවල සංවලිත නාලිකාවල ය. (2004)

(34) ප්‍රතිදේහ නිපදවීම හා සම්බන්ධ සුදු රුධිරාණු වන්නේ,
1. නියුට්‍රොෆිල ය.   2. බෙසෝෆිල ය.   3. ඉයොසිනොෆිල ය.
4. මොනොසයිට ය.   5. වසා සෛල ය. (2004)

(35) මිනිසාගේ සරල ශල්කමය අපිච්ඡදය දැකිය හැක්කේ,
1. තයිරොයිඩ ග්‍රන්ථියේ ය.   2. වකුගඩුවේ ය.   3. අන්නස්‍රෝතයේ ය.
4. සමේ ය.   5. දිවේ ය. (2005)

(36) මිනිස් රුධිර සෛල පිළිබඳ නිවැරදි වනුයේ පහත සඳහන් කුමන වගන්තියේ ද?
1. සියලුම සුදු රුධිරාණු ඛණ්ඩිකා වලට බෙදුනු න්‍යෂ්ටි දරයි.
2. මොනොසයිට ප්‍රතිදේහ නිපදවීමට ඉවහල් වේ.
3. සියලුම රුධිර සෛල ඇටමිදුළු වල නිපදවේ.
4. රතු රුධිරාණු හිමොළුරිත්‍රීන් ගබඩා කරයි.
5. බේසොෆිල රුධිර කැටි ගැසීම සඳහා වැදගත් වේ. (2005)

(37) මිනිස් හෘත් පේශි තන්තු පිළිබඳ නිවැරදි වගන්තිය/වගන්ති තෝරන්න.
(A) ඒවා අන්තරස්ථාපිත මඬල් දරයි.
(B) ඒවා දිගු සිලින්ඩරාකාර සෛල වේ.
(C) ඒවාට ස්වකීය රිද්මයානුකූල ලෙස සංකෝචනය වීමේ හැකියාව ඇත.
(D) ඒවා කිසිවිටෙකත් විඩාවට පත් නොවේ.
(E) ඒවා නිර්විලිබිත ය. (2005)

(38) පහත සඳහන් ප්‍රකාශ අතරින් මිනිසාගේ කංකාල පේශි තන්තු පිළිබඳ නිවැරදි වනුයේ කුමක් ද?
(A) ඒවා දිගු සිලින්ඩරාකාර සෛල ය.   (B) ඒවා විලිබිත ය.
(C) ඒවා ඒක න්‍යෂ්ටිකය.   (D) ඒවා කංකාල පද්ධතියට බැඳී ඇත.
(E) ඒවා අනිච්ඡානුග ය. (2006)

(39) පහත සඳහන් ප්‍රකාශ අතුරින් මිනිසාගේ සිනිඳු පේශි තන්තු පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද/කුමන ඒවා ද?
(A) ඒවා විලේඛ නොදරයි.   (B) ඒවා ඒකන්‍යෂ්ටික ය.
(C) ඒවා ආහාර මාර්ගයේ නැත   (D) ඒවා අනිච්ඡානුග ය.
(E) ඒවා අස්ථිවලට සම්බන්ධ වේ. (2007)

(40) මිනිසාගේ සරල ශල්කමය අපිච්ඡද සෛල තිබෙන්නේ,
1. ආන්ත්‍රික අභ්‍යන්තර ආස්තරයේ ය.   2. ගර්තවල ය.
3. සමේ අපිචර්මයේ ය.   4. මුත්‍රාශයේ ය.
5. වෘක්කාණුවල සංවලිත නාලිකාවල ය. (2008)

(41) හෘත් සහ සිනිඳු පේශි තන්තු යන දෙවර්ගයම,
(A) අනිච්ඡානුග වේ.   (B) සිලින්ඩරාකාර වේ.
(C) ඒකන්‍යෂ්ටික වේ.   (D) විඩාවට පත් නොවේ.
(E) විලිබිත ය. (2008)

(42) පහත සඳහන් ඒවා අතුරින් කවරක් සම්බන්ධක පටකවල කෘත්‍යයක් නොවේ ද?
1. සන්ධාරණය   2. පරිවහනය   3. අවශෝෂණය
4. සංචිත කිරීම   5. ප්‍රතිශක්ති ආරක්ෂාව (2009)

(43) සිනිඳු පේශි,
1. කිසිවිටෙකත් විඩාවට පත් නොවේ.
2. කංකාල පේශිවලට වඩා වේගයෙන් සංකෝචනය විය හැකි ය.
3. කණ්ඩරා සමඟ සම්බන්ධ නොවේ.
4. සිලින්ඩරාකාර හැඩයක් ගන්නා තන්තුවලින් සමන්විත වේ.
5. න්‍යෂ්ටි එකක් හෝ දෙකක් දරන සෛලවලින් තැනී ඇත. (2010)

(44) මිනිසාගේ අවයවයක හරස්කඩක් අන්වීක්ෂයෙන් පරීක්ෂා කළ විට කොලැජන් තන්තු හා සෛල දරන ගර්තිකා නිරීක්ෂණය කරන ලදී. මෙම අවයවය විය හැක්කේ,
1. අක්මාවයි.   2. ගුදයයි.   3. හිස් කබල.
4. ශ්වාසනාලය   5. වෘක්කයයි. (2011)

(45) මිනිසාගේ කංකාල පේශි සංකෝචනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වනුයේ කුමක් ද?
1. එය ආරම්භ වීම සඳහා චාලක ස්නායු උත්තේජනයක් අත්‍යවශ්‍ය ය.
2. මයොසීන් හිස් සහ ඇක්ටින් බන්ධන ස්ථාන අතර හරස් සේතු සෑදේ.
3. ඇක්ටින් සූත්‍රිකා කෙටි වේ.
4. I - පටි කෙටි වේ.
5. හරස් සේතු සෑදීම සඳහා කැල්සියම් අයන අත්‍යවශ්‍ය වේ. (2013)

(46) පහත සඳහන් ඒවා අතුරෙන් අපිච්ඡද පටකවල කෘත්‍යයක් නොවන්නේ කුමක් ද?
1. සන්ධාරණය 2. පරිවහනය 3. ආරක්ෂාව
4. ස්‍රාවය 5. අවශෝෂණය (2017)

(47) සාමාන්‍ය තත්ත්ව යටතේදී තන්තු දක්නට නොලැබෙන සම්බන්ධක පටකය වන්නේ,
1. අරියල පටකයයි 2. මේද පටකයයි 3. රුධිරයයි
4. කාටිලේජයයි 5. අස්ථියි

නිපුණතාව 5.2.2 : මිනිස් ආහාර මාර්ග පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍යය

(01) අක්මාවේ පහත සඳහන් කෘත්‍යයන් අතුරින් සමස්ථිතික කෘත්‍යයක් නොවන්නේ කුමක්ද?
1. ග්ලයිකොජන් ගබඩා කිරීම.
2. ග්ලයිකොජන් ග්ලූකෝස් බවට පරිවර්තනය කිරීම.
3. කාබෝහයිඩ්‍රේට මේද බවට පරිවර්තනය කිරීම.
4. යූරියා නිෂ්පාදනය.
5. විටමින් K නිෂ්පාදනය (1987 - Z)

(02) මිනිසාගේ ආහාර මාර්ගයෙහි පහත සඳහන් කොටස්වලින් මිනිස් සිරුරෙහි ඉහළින්ම පිහිටා තිබෙන්නේ කුමන කොටසද?
1. මහාන්ත්‍රය 2. ක්ෂුද්‍රාන්තය 3. උණ්ඩුකය
4. ආමාශය 5. ග්‍රහණිය (1989 - Z)

(03) පහත සඳහන් වගන්ති අතරෙන් මිනිස් අක්මාව පිළිබඳව අසත්‍ය වගන්තිය වන්නේ කුමන වගන්තිය ද?
1. එය දේහයෙහි දෙවනුවට විශාලතම ඉන්ද්‍රිය යි.
2. යූරියා නිපදවන්නේ ප්‍රධාන වශයෙන් අක්මාව තුළ ය.
3. කුෆර් සෛල, හානිවූ රතු රුධිරාණු රුධිරයෙන් ඉවත් කරයි.
4. අක්මාවෙන් ජීරණ කෘත්‍යයක් ඉටු නොකරයි.
5. සමහර විටමින් වර්ග අක්මාවෙහි ගබඩා කරනු ලැබේ. (1991 - Z)

(04) අන්ධභාවය ඇතිවිය හැක්කේ පහත සඳහන් කුමන විටමිනයෙහි ඌනතාව නිසාද?
1. A 2. C 3. B_{12} 4. K 5. D (1993 - Z)

(05) මිනිස් දේහයේ දෙවනුවට විශාල ඉන්ද්‍රියය වනුයේ, (1993 - Z)
1. අක්මාව ය. 2. සම ය. 3. හෘද ය. 4. අමාශය ය. 5. වෘක්කය

(06) මිනිස් දේහය තුළ විෂ හා ඖෂධවල විෂහරණය කරනුයේ ප්‍රධාන වශයෙන්,
1. ප්ලීහාව තුළ ය. 2. තයිරොයිඩය තුළ ය. 3. අක්මාව තුළ ය
4. ආමාශය තුළ ය. 5. අග්න්‍යාශය තුළ ය. (1993 - Z)

(07) මිනිස් අක්මාව,
1. දේහයේ විශාලම අවයවය වේ. 2. ඛණ්ඩිකා පහකින් සමන්විත වේ.
3. යූරියා සංශ්ලේෂණය කරයි. 4. අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියා කරයි.
5. ලයිපේස් ස්‍රාවය කරයි. (1994 - Z)

(08) පහත සඳහන් විටමින අතුරෙන් කුමන විටමිනයෙහි ඌනතාව රුධිරය කැටිගැසීම කෙරෙහි බලපෑ හැකි ද?
1. A 2. B_{12} 3. C 4. D 4. K (1994 - Z)

(09) මිනිසා තුළ උක් සීනි ජීර්ණය ආරම්භ වන්නේ,
1. මුඛ කුහරයේ හි දීය. 2. ආමාශයෙහි දීය. 3. ග්‍රහණියෙහි දීය.
4. ශූන්‍යාන්ත්‍රකයෙහි දීය. 5. ශේෂාන්ත්‍රකයෙහි දීය. (1995 - Z)

(10) පහත වගන්ති අතරෙන් මිනිසාගේ ආමාශය පිළිබඳ අසත්‍ය වනුයේ කුමක් ද?
1. එය ආහාර මාර්ගයෙහි වැඩියෙන්ම ප්‍රසාරණය විය හැකි කොටසය.
2. එය J හැඩැති ය.
3. එය අම්ලකාරක සෛල දරයි.
4. එහි පාර්ශ්වික සෛල මගින් පෙප්සිනෝජන් ස්‍රාවය කරයි.
5. එය අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියා කරයි. (1995 - Z)

(11) මිනිසාගේ පහත සඳහන් ක්‍රියාවලි අතරින් කැල්සියම් අයන අවශ්‍ය නොවන්නේ කුමකටද?
1. දත් සෑදීමට ය.
2. කංකාල පේශි සංකෝචනයට ය.
3. නියුරෝන ක්‍රියා විභවය ජනනය කිරීමටය.
4. රුධිරය කැටි ගැසීමට ය.
5. සමහර එන්සයිම සක්‍රිය කිරීමට ය. (1995 - Z)

(12) වැඩිහිටි මිනිසෙකුගේ අක්මාවෙහි සිදු නොවන්නේ,
1. විටමින් A ගබඩා කිරීම. 2. ඇමයිනෝ අම්ල ඇමයින්හරණය ය.
3. ග්ලයිකෝජන් සංචිත කිරීම ය. 4. රක්තාණු නිපදවීම ය.
5. හානිකර ද්‍රව්‍ය විෂහරණය ය. (1997 - Z)

(13) මිනිසාගේ ආහාරයේ ඇති ඩයිසැකරයිඩ ජීරණය කරන එන්සයිම ස්‍රාවය කරනු ලබන්නේ,
1. බෙට ග්‍රන්ථි මගින් ය. 2. ආමාශය මගින් ය. 3. අග්න්‍යාශය මගින් ය.
4. ක්ෂුද්‍රාන්තය මගින් ය. 5. මහාන්ත්‍රය මගින් ය. (1998 - Z)

(14) පහත සඳහන් වගන්ති අතුරෙන් මිනිස් ආමාශය පිළිබඳ ව අසත්‍ය වනුයේ කුමක් ද?
1. එය පෙප්සින් ස්‍රාවය කරයි.
2. එය ජීර්ණ පද්ධතියෙහි වැඩියෙන් ම ප්‍රසාරණය විය හැකි කොටස ය.
3. එය අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියා කරයි.
4. එය විදුර කෙලවරෙහි ආලාර චක්‍ර පිධානයක් ඇත.
5. එය ජලය අවශෝෂණය කරයි. (1999 - Z)

- 15 හා 16 වැනි ප්‍රශ්න පහත දැක්වෙන වගුව මත පදනම් වී ඇත. මෙම වගුවේ පළමුවැනි තීරුවේ මිනිසාගේ ජීර්ණ එන්සයිම තුනක් දී ඇත. එම එන්සයිම නිපදවෙන ප්‍රධාන ස්ථාන දෙවැනි තීරුවේත් ඒවා ක්‍රියා කරන උපස්ථර තුන්වැනි තීරුවේත් දක්වා ඇත.

1 තීරුව එන්සයිම	2 තීරුව නිපදවෙන ප්‍රධාන ස්ථානය	3 තීරුව උපස්තරය
A - ලයිපේස්	E - වෘක්ක	P - නියුක්ලියෝටයිඩ
B - රෙනින්	F - ක්ෂුද්‍රාන්ත්‍රය	Q - ලිපිඩ
C - නියුක්ලියෝටයිඩේස්	G - අග්න්‍යාශය	R - ඇන්ජියෝටෙන්සින්

(15) A, B හා C එන්සයිම නිපදවෙන ප්‍රධාන ස්ථානවල නිවැරදි අනුපිළිවෙළ වනුයේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?
1. F, G, E 2. E, G, F 3. G, E, F 4. G, F, E 5. F, E, G (2000)

(16) A, B හා C එන්සයිම ක්‍රියාකරන උපස්තරවල නිවැරදි අනුපිළිවෙළ වනුයේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?
1. Q, P, R 2. R, Q, P 3. P, R, Q 4. Q, R, P 5. R, P, Q (2000)

(17) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් මිනිසාගේ අක්මාව පිළිබඳව නිවැරදි වන්නේ කුමක් ද?
1. එය දේහයේ ඇති විශාලම අවයවයයි.
2. එය ප්‍රධාන වශයෙන්ම උදර කුහරයේ ඉහළ වම් ප්‍රදේශයේ පිහිටයි.
3. එය හිමොග්ලොබින් සංස්ලේෂණය කරයි.
4. එය ආහාර ජීර්ණයේ දී යම් කාර්යභාරයක් ඉටු කරයි.
5. එය උෂ්ණත්ව යාමනය සඳහා සහභාගී නොවේ.

(18) පහත සඳහන් කුමන විටමිනයේ ඌනතාවක් විදුරුමස්වලින් රුධිරය වහනය වීම සඳහා දායක වේද?
1. A 2. B_6 3. C 4. E 5. K (2001)

(19) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් මිනිස් බේටය පිළිබඳව වැරදි ප්‍රකාශය වන්නේ,
1. එය ශ්ලේෂ්මල ග්‍රන්ථිවල හා බේට ග්‍රන්ථිවල ස්‍රාවයන්ගේ මිශ්‍රණයකි.
2. එය දත් දිරායාම අඩු කිරීමට උපකාරී වේ.
3. එහි බේට ඇමයිලේස් අඩංගු ය. 4. එයට බැක්ටීරියානාශක හැකියාවක් ඇත.
5. බේට ඇමයිලේස් ආහාර ගුලි ග්‍රසනිකාවට තල්ලු කරයි (2002)

(20) මිනිසාගේ ජීර්ණ එන්සයිම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
1. ඇමයිලේස් මගින් පිෂ්ටය මෝල්ටෝස් බවට හරවනු ලැබේ.
2. ලයිපේස් මගින් මේදය, මේද අම්ල සහ ග්ලිසරෝල් බවට හරවනු ලැබේ.
3. පෙප්සීන් මගින් ප්‍රෝටීන ඇමයිනෝ අම්ල බවට හරවනු ලැබේ.
4. ලැක්ටේස් මගින් ලැක්ටෝස් ග්ලූකෝස් සහ ග්ලැක්ටෝස් බවට හරවනු ලැබේ.
5. කයිමොට්‍රිප්සින් මගින් ප්‍රෝටීන, වඩාත් කුඩා පොලිපෙප්ටයිඩ බවට පත් කරයි. (2003)

(21) විටමින් E පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරෙන් නිවැරදි වන්නේ කුමක්ද?/කුමන ඒවාද?
(A) එය නොමැති වීම ස්නායු පද්ධතියේ පරිහානියට දායක වේ.
(B) එය එළවලු තෙල් වල ඇත.
(C) එය ජලයේ ද්‍රාව්‍යය ය.
(D) ඌන වූ විට රක්තහීනතාව ඇතිවේ.
(E) එහි ඌනතාව නිසා රාත්‍රී අන්ධතාව ඇති වේ. (2003)

(22) පහත සඳහන් ප්‍රකාශ අතරින් මිනිසාගේ ආහාර මාර්ගය පිළිබඳව නිවැරදි වන්නේ කුමක් ද?
1. ආන්ත්‍රික ග්‍රන්ථි පිහිටනුයේ අංගුලිකා තුලය.
2. අධිග්‍රහණය කරනු ලබන විටමින බොහොමයක් අවශෝෂණය කරනු ලබනුයේ ක්ෂුද්‍රාන්ත්‍රයේදීය.
3. කුඩා පොලිපෙප්ටයිඩ ජීර්ණය ආරම්භ වනුයේ මුඛ කුහරය තුළදී ය.
4. පේශි ස්ථර වඩාත්ම හොඳින් විකසනය වී ඇත්තේ ක්ෂුද්‍රාන්ත්‍රයේදීය.
5. මහාන්ත්‍රය විටමින් B_{12} නිපදවෙන ප්‍රධාන ස්ථානයයි. (2004)

(23) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිසාගේ ජීර්ණ එන්සයිම පිළිබඳ නිවැරදි වන්නේ කුමක් ද?
1. පිෂ්ටය, ඇමයිලේස් මගින් මෝල්ටෝස් සහ ග්ලූකෝස් බවට පත් කෙරේ.
2. ප්‍රෝටීන, පෙප්සීන් මගින් පෙප්ටෝන සහ ඇමයිනෝ අම්ල බවට පත් කෙරේ.
3. ප්‍රෝටීන, කයිමොට්‍රිප්සීන් මගින් වඩාත් කුඩා පොලිපෙප්ටයිඩ බවට පත් කරයි.
4. ලැක්ටෝස්, ලැක්ටේස් මගින් ග්ලූකෝස් සහ ෆ්‍රැක්ටෝස් බවට පත් කෙරේ.
5. කේසිනෝජන්, රෙනින් මගින් පොලිපෙප්ටයිඩ බවට පත් කෙරේ. (2006)

(24) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් මිනිසාගේ අක්මාව පිළිබඳ වැරදි වන්නේ කුමක් ද?
1. එය දේහයේ පිහිටි විශාලම ග්‍රන්ථියය.
2. එය දේහයේ ප්‍රධානම සංචායක මධ්‍යස්ථානයයි.
3. එය ලිපිඩ ජීර්ණයට ඉවහල් වේ.
4. එය උෂ්ණත්ව යාමනය සඳහා දායක වේ.
5. එයින් පිත ස්‍රාවය වීම කොලිසිස්ටොකයිනීන් මගින් උත්තේජනය වේ. (2006)

(25) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිස් අග්න්‍යාශය පිළිබඳව වැරදි වන්නේ කුමක් ද?
1. එය බාහිරාසර්ග ග්‍රන්ථියක් මෙන්ම අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ද ක්‍රියා කරයි.
2. අග්න්‍යාශයික යුෂයේ සක්‍රීය ප්‍රෝටියොලිටික එන්සයිම දෙකක් අන්තර්ගත වේ.
3. අග්න්‍යාශයික යුෂය ආමලසයේ ආම්ලිකතාව උදාසීන කිරීමට උපකාරී වේ.
4. ලැන්ගර්හැන්දිපිකා වලට හානි සිදුවීම නිසා මධු මේහය ඇතිවීමට පුළුවන.
5. සික්‍රටීන් අග්න්‍යාශයේ ක්‍රියාකාරීත්වය යාමනය කරයි. (2007)

(26) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිස් මහාන්ත්‍රය පිළිබඳ ව වැරදි වන්නේ කුමක් ද?
1. එය කොටස් 3 කි.
2. එය ශ්ලේෂ්මලය ස්‍රාවය කරයි.
3. එය මල සෑදෙන ස්ථානයකි.
4. එය දේහයේ ජල ප්‍රතිශෝෂණය සිදුවන ප්‍රධාන ම ස්ථානයයි.
5. ක්ෂුද්‍රාන්තය සමඟ T සන්ධියකින් සම්බන්ධ වේ. (2007)

(27) මිනිසාගේ සාමාන්‍ය නිරෝගීතාව සඳහා සෝඩියම් හා කැල්සියම් අයන වැදගත් වේ. මෙම අයන දෙවර්ගය ම අවශ්‍ය වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් සඳහා ද?
1. අස්ථි ශක්තිමත් කිරීම 2. පේශි සංකෝචනය
3. හිමෝග්ලොබින් සංස්ලේෂණය 4. රුධිර කැටි ගැසීම
5. එන්සයිම සක්‍රිය කිරීම (2007)

(28) මිනිසාගේ ඛේටය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. එය ඛේට ග්‍රන්ථිවල සහ ශ්ලේෂ්මල ග්‍රන්ථිවල ස්‍රාවයන්ගේ මිශ්‍රණයකි.
2. එහි එන්සයිම එකකට වඩා අඩංගුය.
3. සමහර නයිට්‍රජනීය අපද්‍රව්‍ය එහි අඩංගු වේ.
4. එය කථනයට උදව් වේ.
5. පිෂ්ඨය සම්පූර්ණයෙන් ජීර්ණය කිරීම සඳහා එය අත්‍යවශ්‍ය වේ. (2009)

(29) මිනිසාගේ ජීර්ණ පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. ආහාර මාර්ගයේ සමහර ප්‍රදේශවල කංකාල පේශි තන්තු පිහිටයි.
2. ආමාශයික කුහරය ඝනාකාර අපිච්ඡදයෙන් ආස්තරණය වේ.
3. ආන්ත්‍රික යුෂයේ සහ අග්න්‍යාශයික යුෂයේ ලයිපේස් අඩංගු වේ.
4. මහාන්ත්‍රයේ දී ජලය 7L ප්‍රතිශෝෂණය වේ.
5. ඩයිසැකරයිඩ මත ක්‍රියා කරන එන්සයිම අග්න්‍යාශයික යුෂයේ ඇත. (2010)

(30) ගැස්ට්‍රයිටිස් සඳහා දායක වන සාධකයක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. මධ්‍යසාර භාවිතය
2. උදෑසන ආහාර වේල නොගැනීම.
3. ක්ෂය රෝගය
4. මානසික ආතතිය
5. තන්තු ඌන ආහාර ගැනීම (2011)

(31) දරුවෙක් පහත දක්වෙන විටමින ඌනතා ලක්ෂණ පෙන්වයි.
(a) විඩාව (b) රක්තහීනතාව (c) තුවාල සුවවීම ප්‍රමාද වීම
ඔහු ඌනතාවයක් දක්වන විටමින වනුයේ,
1. පැන්ටොතෙනික් අම්ලය, ෆෝලික් අම්ලය හා ඇස්කෝබික් අම්ලය
2. තයමින්, නියසීන් සහ රයිබොෆ්ලේවින් ය.
3. රයිබොෆ්ලේවින්, විටමින් B_{12} සහ බයොටින් ය.
4. විටමින් A, විටමින් D සහ විටමින් C ය.
5. විටමින් B_{12}, විටමින් E සහ විටමින් K ය. (2012)

(32) මිනිසාගේ පහත සඳහන් කුමන එන්සයිමය මගින් ඉටු කරන කාර්යය වෙනත් එන්සයිමයක් මගින් ආදේශ කළ නොහැකි ද?
1. ඩයිපෙප්ටිඩේස් 2. ට්‍රිප්සින් 3. කයිමොට්‍රිප්සින්
4. කාබොක්සිපෙප්ටිඩේස් 5. මෝල්ටේස් (2013)

(33) විටමින පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. මිනිසා තුළ කිසිම විටමිනයක් සංශ්ලේෂණය කළ නොහැකි ය.
2. ධාන්‍ය, විටමින් A වලින් පොහොසත් ප්‍රභවයකි.
3. විටමින් D ඌනතාව ළමුන් තුළ ඔස්ටියොමැලේෂියාව ඇති කරයි.
4. විටමින් E ප්‍රතිඔක්සිකාරයකයක් ලෙස ක්‍රියා කරයි.
5. මිනිසුන්ගේ විටමින් B_6 අවශෝෂණය සඳහා අන්තරස්ථ සාධකයක් අත්‍යවශ්‍ය වේ. (2014)

(34) මානව අග්න්‍යාශයික යුෂය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) එය ආම්ලික ස්‍රාවයකි. (B) එය මේද තෛලෝදකරණය කරයි.
(C) එය ස්‍රාවය වීම සික්‍රටීන් මගින් උත්තේජනය වේ.
(D) ප්‍රෝටියොලිටික එන්සයිමවල අක්‍රිය පූර්වග එහි ඇත.
(E) එය ස්‍රාවය වීම ප්‍රත්‍යානුවේගී උත්තේජන නිසා අඩු වේ. (2014)

(35) මිනිස් ආමාශය
(A) උදර කුහරයේ ඉහළ ප්‍රදේශයේ පිහිටා ඇත.
(B) අන්තරාසර්ග සහ බහිරාසර්ග පටක දරයි.
(C) ඛේටයේ ඇති එන්සයිමවලට කෘත්‍යමය ලෙස සමාන එන්සයිම ස්‍රාවය කරයි.
(D) ලිපිඩ ජීර්ණයේ අන්ත ඵල සුළු ප්‍රමාණයක් අවශෝෂණය කරයි.
(E) pH අගය 4 - 5 වන තරලයක් සහිත යි. (2015)

(36) රක්තහීනතාව පහත සඳහන් කුමන විටමින ඌනතාව නිසා ඇතිවන ආබාධයක් ද?
1. A, D, තයමින් 2. B_{12}, B_6, ෆෝලික් අම්ලය 3. K, B_1, බයොටින්
4. B_5, B_3, B_1 5. B_1, B_2, පැන්ටොතෙනික් අම්ලය (2016)

(37) අග්න්‍යාශයික යුෂය සහ ආන්ත්‍රික යුෂය යන දෙකෙහිම ඇත්තේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. පෙප්ටයිඩේස් 2. ලයිපේස් 3. සුක්‍රේස්
4. රයිබොනියුක්ලියේස් 5. ට්‍රිප්සිනෝජන් (2017)

(38) මිනිසාගේ ජීරණ අන්ත්‍රවල අවශෝෂණය පිළිබඳව නිවැරදි වන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශය ද?/ප්‍රකාශ ද?

(A) ග්ලූකෝස් ක්ෂුද්‍රාන්ත්‍රයේ දී සක්‍රියව අවශෝෂණය කෙරේ.

(B) ක්ෂුද්‍රාන්ත්‍ර අංගුලිකාවල අපිච්ඡද සෛල තුළදී ට්‍රයිග්ලිසරයිඩ සංශ්ලේෂණය කෙරේ.

(C) ක්ෂුද්‍රාන්ත්‍ර අංගුලිකාවල රුධිර කේශනාලිකා තුළට ඇමයිනෝ අම්ල විසරණය මගින් අවශෝෂණය කෙරේ.

(D) මේද අම්ල සහ ග්ලිසරෝල් ක්ෂුද්‍රාන්ත්‍ර අංගුලිකාවල වසා නාල තුළට අවශෝෂණය කෙරේ.

(E) ක්ෂුද්‍රාන්ත්‍ර අංගුලිකාවල අපිච්ඡද සෛල තුළට ෆ්‍රක්ටෝස් සක්‍රිය ව අවශෝෂණය කෙරේ. (2018)

(39) මිනිසාගේ ආහාර වල ඇති න්‍යෂ්ටික අම්ල ජීර්ණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක්ද?

1. එය ආමාශයේ දී ආරම්භ වේ.
2. නියුක්ලියොටයිඩේස් මගින් DNA නියුක්ලියොටයිඩ බවට බිඳ හෙළනු ලැබේ.
3. නයිට්‍රජනීය භෂ්ම ජීර්ණය කිරීම සඳහා නියුක්ලියොසයිඩේස් සහභාගී වේ.
4. අග්න්‍යාශයික නියුක්ලියේස් මගින් RNA නියුක්ලියොටයිඩ බවට බිඳ හෙළනු ලැබේ.
5. ආන්ත්‍රික නියුක්ලියොටයිඩේස්, නයිට්‍රජනීය භෂ්ම මත ක්‍රියා කරයි. (2019)

(40) සතුන් අතර දක්නට ලැබෙන විවිධ ආකාරයේ බුදින්නන් සඳහා නිවැරදි නිදසුනක් සහිත ප්‍රතිචාරය තෝරන්න.

	බුදින්නන් ආකාරය	නිදසුන
1.	උපස්තර බුදින්නන්	කාවාටි
2.	තරල බුදින්නන්	ඉහඳ පණුවන්
3.	පෙරා බුදින්නන්	මට්ටි
4.	උපස්තර බුදින්නන්	කුඩිත්තන්
5.	තොග වශයෙන් බුදින්නන්	සූටික්කන්

(2019)

නිපුණතාව 5.3.0 : සතුන් තුළ සංසරණය හා වායු හුවමාරු ක්‍රියාවලි

නිපුණතාව 5.3.1 : සතුන්ගේ සංසරණ පද්ධතිවල සංවිධානය

(01) පහත සඳහන් වගන්ති අතරින් සතුන්ගේ රුධිර සංසරණ පද්ධති පිළබඳ අසත්‍ය වනුයේ,

1. විවෘත සංසරණ පද්ධති සියලුම ආත්‍රොපෝඩාවන්ට ආවේණික වේ.
2. සංවෘත සංසරණ පද්ධති වල ඔක්සිජනීකරණය වූ හා ඔක්සිජනීහරණය වූ රුධිරයෙහි මිශ්‍රවීමක් සිදුවිය හැකිය.
3. මිනිසාගේ ඔක්සිජන් පරිවහනය වැඩිපුරම සිදුවන්නේ ප්ලාස්මය ඔස්සේය.
4. පෘෂ්ඨවංශීන්ගේ රුධිරය හා පටක අතර ද්‍රව්‍ය හුවමාරුව කේශනාලිකා හරහා සිදුවේ.
5. SA ගැටය ක්ෂීරපායී හෘදයේ ගතිකරය වේ. (1997 Z)

(02) රුධිර සංසරණ පද්ධති පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ කුමන ප්‍රකාශය / ප්‍රකාශ ද?

(A) සියලුම පෘෂ්ඨවංශීන්ට ඇත්තේ සංවෘත රුධිර සංසරණ පද්ධතියකි.

(B) රුධිර සංසරණ පද්ධතියක තිබීම සියලු ම සතුන්ගේ ආවේණික ලක්ෂණයකි.

(C) ද්විත්ව සංසරණයක් සහිත සියලු ම සතුන්ට උදරීය හෘදයක් ඇත.

(D) පෘෂ්ඨවංශීන්ගේ රුධිර සංසරණ පද්ධති මූලික සැලැස්මකින් පරිණාමය වී ඇත.

(E) මොලුස්කාවන් තුළ සංවෘත සංසරණ පද්ධතියක් දැකිය හැකිය. (2000)

(03) පහත සඳහන් සතුන් අතරින් ඒක සංසරණයක් සහිත සංවෘත රුධිරවාහිනී පද්ධතියක් ඇත්තේ කුමන සත්ත්වයාට ද?

1. කැරපොත්තා 2. ගැඩවිලා 3. පසැගිල්ලා 4. මිනිසා
5. බරවා පණුවා (2004)

(04) මිනිස් දේහය තුළ නිපදවෙන යූරියා අණුවක් නිෂ්පාදිත ස්ථානයේ සිට බහිස්‍රාවී ස්ථානය දක්වා ගමන් කිරීමේදී පසුකරන රුධිර වාහිනී නිවැරදි අනුපිළිවෙලින් දක්වනුයේ පහත සඳහන් ඒවා අතුරින් කුමක්ද?

1. යාකෘතික ශිරාව → අධර මහා ශිරාව → පුප්ඵුසීය ශිරාව → පුප්ඵුසීය ධමනිය → මහා ධමනිය වෘක්කීය ධමනිය
2. කේශනාලිකා → අනුශිරා → ශිරා → අධර මහා ශිරාව → වෘක්කීය ශිරාව
3. යාකෘතික ශිරාව → අධර මහා ශිරාව → පුප්ඵුසීය ධමනිය → පුප්ඵුසීය ශිරාව → මහා ධමනිය වෘක්කීය ධමනිය
4. කේශනාලිකා → අනුශිරා → ශිරා → පුප්ඵුසීය ශිරාව → පුප්ඵුසීය ධමනිය → මහා ධමනිය → වෘක්කීය ධමනිය
5. කේශනාලිකා → ධමනිකා → ධමනි → මහා ධමනිය → චර්මීය ධමනි → ධමනිකා → කේශනාලිකා (2010)

(05) සතුන් අතර දක්නට ලැබෙන රුධිර සංසරණ පද්ධති මෙසේය.

A) විවෘත සංසරණ පද්ධතිය B) සංවෘත සංසරණ පද්ධතිය

C) සංවෘත ද්විත්ව සංසරණ පද්ධතිය

ඉහත සඳහන් A, B හා C රුධිර සංසරණ පද්ධති ඇති සතුන් නිවැරදි අනුපිළිවෙලින් දක්වනුයේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

1. මකුළුවා, ගොළුබෙල්ලා, මීයා 2. පත්තෑයා, Ichthyophis, වවුලා
3. මකුළුවා, ගැඩවිලා, කැස්බෑවා 4. මුහුදු ඉකිරියා, මෝරා, කපුටා
5. කැරපොත්තා, Nereis, බූවල්ලා (2011)

(06) මෙම ප්‍රශ්නය පහත සඳහන් සතුන්ගේ රුධිර සංසරණ පද්ධති මත පදනම් වේ.

a. කැස්බෑවා b. හම්බෙල්ලා c. *Ichthyophis* d. කැරපොත්තා
e. පත්තෑයා f. මකුළුවා g. වැරහැලි පරාවා

විවෘත සංසරණ පද්ධතියක් ඇත්තේ ඉහත සඳහන් කුමන සත්ත්වයන්ටද?

1. a, c සහ g ට පමණි 2. a සහ c ට පමණි 3. b සහ e ට පමණි
4. b, d, e සහ f ට පමණි 5. d සහ f ට පමණි (2013)

(07) සත්ත්වයින්ගේ රුධිර සංසරණ පද්ධති පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. නෙමටෝඩාවන්ට සහ එකයිනොඩර්මේටාවන්ට රුධිර සංසරණ පද්ධති නොමැත.
2. කෘමීන්ට සහ පටි පණුවන්ට විවෘත රුධිර සංසරණ පද්ධති ඇත.
3. ඇනලීඩාවන්ට සහ මත්ස්‍යයන්ට සංවෘත රුධිර සංසරණ පද්ධති ඇත.
4. ක්ලෝරොක්රුවෝරින් ක්‍රස්ටේශියිවන්ගේ ශ්වසන වර්ණකයක් ලෙස ක්‍රියා කරයි.
5. කර්ණික කෝෂික (AV) ගැටය මිනිස් හෘදයේ ගතිකරය ලෙස ක්‍රියා කරයි. (2017)

(08) සතුන්ගේ සංසරණ පද්ධති පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. උදරීය හෘදයක් සහිත විවෘත සංසරණ පද්ධතියක් මොලුස්කාවන්ට ඇත.
2. නෙමටෝඩාවන්ට ඇත්තේ සංවෘත සංසරණ පද්ධතියකි.
3. හීමොඑරිත්‍රින් යනු ක්‍රස්ටේශියාවන්ගේ රුධිර වර්ණකයයි.
4. මිනිස් හෘදයේ ගතිකරය AV ගැටයයි.
5. මිනිස් හෘදයේ මයිටර් කපාටය පිහිටන්නේ වම් කර්ණිකාව සහ වම් කෝෂිකාව අතරය. (2018)

නිපුණතාව 5.3.2 : මානව රුධිර සංසරණ පද්ධතියේ ව්‍යුහය එහි කෘත්‍යයට අදාළව

(01) වෛද්‍යවරයෙකු විසින් රුධිර පීඩනය වාර්තා කිරීමේදී සාමාන්‍යයෙන් 120/80 වැනි සංඛ්‍යා දෙකක් දෙනු ලැබේ. මේවා මගින් නියෝජනය වන පීඩනය තිබෙන්නේ,
1. කෝෂිකාවේ බිත්තියේ ය.
2. ආකුංචය සහ විස්තාරයේ දී කර්ණිකාවේ ය.
3. ආකුංචය සහ විස්තාරයේ දී කෝෂිකාව තුළ ය
4. ආකුංචය සහ විස්තාරයේ දී ධමනිය තුළ ය.
5. ආකුංචය සහ විස්තාරය සිදුවන විට ශිරාව තුළ ය. (1987 Z)

(02) පහත සඳහන් වගන්ති වලින් වැරදි වන්නේ කුමක්ද? වසා සහ රුධිරය සමාන වන්නේ ඒවායේ,
1. ශ්වේතානු අඩංගු බැවිනි
2. හිමෝග්ලොබින්
3. පෝෂ්‍ය ද්‍රව්‍ය අඩංගු බැවිනි
4. අපද්‍රව්‍ය අඩංගු බැවිනි
5. අයන අඩංගු බැවිනි (1988 Z)

(03) ක්ෂීරපායී කංකාල පේශි අධික කේශනාලිකා ඝනත්වයකින් සමන්විත වේ. මෙය අවශ්‍ය වනුයේ,
1. කේශනාලිකා උපරිම රුධිර පීඩනයක් දරන නිසාය.
2. රුධිරයත්, පටකයත් අතර ද්‍රව්‍ය හුවමාරුව සිදුවන්නේ කේශනාලිකා වලින් හෙයිනි
3. කේශනාලිකා තුළින් රුධිරය ගමන් කරන්නේ ඉතා සෙමින් බැවිනි.
4. ධමනි අග්‍ර වලදී තරලය රුධිරයෙන් පිට වී ශිරා අග්‍ර අසල දී නැවත ඇතුල්වන හෙයිනි.
5. කේශනාලිකා වලින් පිටවන තරලයෙන් වැඩි කොටසක් ආපසු ඒවාට පැමිණෙන හෙයිනි. (1989 Z)

(04) පහත සඳහන් ඒවා අතරින් මිනිසාගේ හෘද ස්පන්දනය යාමනය කිරීමෙහි ලා කෘත්‍යයක් ඉටු නොකරන්නේ කුමන එකද?
1. හෝමෝන
2. අනුවේගී ස්නායු
3. SA ගැටය
4. AV ගැටය
5. තැලමස (1991 Z)

(05) මිනිස් හෘදය පිළිබඳ පහත සඳහන් වගන්ති අතරින් වැරදි වගන්තිය කුමක්ද?
1. එහි බිත්තිය ස්තර තුනකින් සමන්විත වේ.
2. AV ගැටය ගතිකරය ලෙස බොහෝ විට ක්‍රියා කරයි.
3. එයට කිරීටක ධමනි මගින් ඔක්සිජනීකෘත රුධිරය සැපයේ.
4. මහාධමනි කපාටය තැනී ඇත්තේ අඩසඳ තුණ්ඩ තුනකිනි.
5. වම් කර්ණිකාවට පුප්ඵුසීය ශිරා හතරක් විවෘත වේ. (1994 Z)

(06) සාමාන්‍ය මිනිස් හෘදයේ ගතිකරය පිහිටා ඇත්තේ,
1. දකුණු හෘත් කර්ණිකා බිත්තියේ ඉහළ ප්‍රදේශයේ ය.
2. වම් හෘත් කර්ණිකා බිත්තියේ ඉහළ ප්‍රදේශයේ ය.
3. හෘත් කර්ණික - කෝෂික කපාට වලට ආසන්නව හෘත් කර්ණික ආවාරයේ ය.
4. හෘත් කෝෂික ආවාරයේ ඉහළ ප්‍රදේශයේ ය.
5. වම් හෘත් කර්ණිකා බිත්තියේ පහළ ප්‍රදේශයේය (1995 Z)

(07) පහත සඳහන් ඒවා අතරින් මිනිසාගේ වසා පද්ධතිය පිළිබඳව අසත්‍ය වන්නේ කුමක්ද?
1. ප්ලීහාව වසා අවයවයකි
2. එහි වාහිනී වල කපාට ඇත.
3. එය අන්තරාල තරල පරිමාව යාමනය කිරීමට උපකාරී වේ.
4. එය ප්‍රතිශක්තියෙහි ලා වැදගත් මෙහෙයක් ඉටු කරයි.
5. එය ආහාර මාර්ගයෙහි ඇමයිනෝ අම්ල අවශෝෂණය හා සම්බන්ධය (1997 Z)

(08) පහත දැක්වෙන රූප සටහන මගින් සාමාන්‍ය ECG සටහනක් දැක්වේ. හෘත් කර්ණිකාවල සංකෝචනය නිරූපණය කෙරෙනුයේ එහි,



1. P මගිනි
2. Q මගිනි
3. R මගිනි
4. S මගිනි
5. T මගිනි (2002)

(09) පහත සඳහන් ඒවා අතරින් මිනිසාගේ අධ්‍යාතතිය ඇති කිරීම සඳහා හේතු විය නොහැක්කේ කුමක්ද?
1. රුධිරයේ අඩු ඝනත්ව ලිපෝප්‍රෝටීන වල ඉහළ මට්ටම
2. අධික ලෙස මත්පැන් පානය කිරීම
3. නින්දට බාධා වීම
4. මානසික සහනය
5. වියපත් වීම (2003)

(10) පහත සඳහන් ප්‍රකාශ අතරින් මිනිසාගේ රුධිර පීඩනය පිළිබඳ ව වැරදි වන්නේ කුමක්ද?
1. විවේකීව සිටින විට සාමාන්‍ය නිරෝගී පරිණත පුද්ගලයෙකුගේ රුධිර පීඩනය 120/80 වේ.
2. ආකුංච රුධිර පීඩනය විස්තාර රුධිර පීඩනයට වඩා වැඩි ය.
3. ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතියේ සක්‍රියතාව රුධිර පීඩනය වැඩි කරයි.

4. ධමනි බිත්ති වල මේද තැන්පත් වීම මගින් අත්‍යාතතිය ඇතිවීමට හැකිය.
5. රුධිර පීඩනය ධමනි බිත්ති වල ප්‍රත්‍යස්ථතාව මත රඳා පවතී. (2006)

(11) පහත සඳහන් ඒවා අතරින් මිනිසාගේ හෘත් ස්පන්දන සීග්‍රතාව වැඩි කිරීමට දායක නොවන්නේ කුමක්ද?
1. ඇඩ්රිනලින් 2. තයිරොක්සින්
3. ලිංග හෝර්මෝන 4. රුධිර pH අගය අඩුවීම
5. ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම (2010)

(12) මිනිසාගේ වසා පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි වන්නේ කුමක්ද?
1. අන්තරාල තරලයෙන් අධික ප්‍රමාණයක් මෙම පද්ධතිය මගින් එකතු කෙරේ.
2. එය රුධිර සංසරණ පද්ධතිය හා සම්බන්ධය.
3. වසා ගැටිති වසා පද්ධතියේ කොටසකි.
4. එය ප්‍රතිශක්ති ප්‍රතිචාර හා සම්බන්ධය.
5. ශිරා මෙන්, වසා වාහිනී ද කපාට නොදරයි (2012)

(13) මිනිසාගේ SA ගැටය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. එය දකුණු හෘත් කර්ණිකාවේ බිත්තියේ අන්තර්හෘත්කර්ණික ආවාරයට ආසන්නව පිහිටයි.
2. පර්කින්ජේ තන්තු එයින් ආරම්භ වේ.
3. හෘදයේ ගතිකරයෙන් ලැබෙන ආවේග මගින් එය උත්තේජනය වේ
4. හෘත් ස්පන්දනය සඳහා උත්තේජය එයින් ආරම්භ වේ.
5. එය ස්නායු පටකයෙන් සමන්විතය. (2013)

(14) මානව හෘදය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. එය දිගු සිලින්ඩරාකාර තන්තු වලින් සමන්විත වේ.
2. දකුණු හෘත්කර්ණික කෝෂික කපාටය ද්විතුණ්ඩ වේ.
3. ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම නිසා හෘත් ස්පන්දන සීග්‍රතාව වැඩිවේ.
4. හෘත් කර්ණිකා ආකුංචයේ කාල සීමාව තත්පර 0.1 කි.
5. හෘත් කෝෂික විධ්‍රැවණය, විද්‍යුත් කන්තුක රේඛා සටහනක (ECG) T තරංගයෙන් නිරූපණය වේ. (2014)

(15) මන්දාතතියට හේතුවක් විය නොහැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. කම්පනය 2. ඩෙංගු රක්තපාත උණ 3. අඩු පෝෂණය
4. අධික රුධිර පීඩනය 5. වෘක්කවලට හානි සිදුවීම (2015)

(16) මිනිස් හෘදයේ සන්නායක පද්ධතියේ කොටසක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. හෘද් රජ්ජු 2. කර්ණික කෝෂික (AV) ගැටය
3. හිස් කළඹ 4. සයිනෝ - හෘත්කර්ණික (SA) ගැටය
5. පර්කින්ජේ තන්තු (2016)

නිපුණතාව 5.3.3 : රුධිරයේ කාර්යයන්

(01) රුධිර කැටියක් ප්‍රධාන වශයෙන් සමන්විත වනුයේ,
1. පට්ටිකා වලිනි 2. ෆෛබ්‍රින් වලිනි 3. ත්‍රොම්බ්‍රින් වලිනි
4. ෆෛබ්‍රිනෝජන් වලිනි 5. ත්‍රොම්බොප්ලාස්ටින් වලිනි (1989 Z)

(02) වැඩිහිටි නිරෝගී මිනිසෙකුගේ රුධිරයෙහි බහුලවම ඇති සුදු රුධිරාණු වර්ගය වන්නේ,
1. බේසොපිල ය 2. ඉයොසිනොපිල ය 3. වසා සෛල ය
4. මොනොසයිට ය 5. නියුට්‍රොපිල ය (1991 Z)

(03) පහත සඳහන් විටමින් අතරින් කුමන විටමිනයෙහි ඌනතාව මිනිස් රුධිරය කැටි ගැසීම කෙරෙහි බලපෑ හැකිද?
1. A 2. B_{12} 3. C 4. D 5. K (1994 Z)

(04) යකඩ සහිත ශ්වසන වර්ණකයක් දිය වූ රුධිර ප්ලාස්මයක් ඇත්තේ,
1. ක්‍රස්ටේසියාවන්ට ය 2. ඇනලිඩාවන්ට ය 3. උභයජීවීන්ට ය
4. පක්ෂීන්ට ය 5. උරගයින්ට ය (1996 Z)

(05) ප්‍රතිදේහ නිපදවන රුධිර සෛල වනුයේ,
1. මොනොසයිට ය 2. නියුට්‍රොෆිල ය 3. වසා සෛල ය
4. බේසොපිල ය 5. ඉයොසිනොපිල ය (1998 Z)

(06) පහත සඳහන් ඒවා අතරින් සාමාන්‍ය නිරෝගී වැඩිහිටි මිනිසෙකුගේ හිමොග්ලොබින් පිළිබඳ අසත්‍ය වනුයේ කුමක්ද?
1. එය ඔක්සිජන් කෙරෙහි අධික බන්ධුතාවයක් දක්වයි.
2. එහි යකඩ Fe^{2+} ආකාරයෙන් ඇත.
3. එය රක්තාණුවල සහ රුධිර ප්ලාස්මාවෙහි ඇත
4. එය කාබන්ඩයොක්සයිඩ් පරිවහනය කරයි
5. එය රුධිර pH යාමනය හා සම්බන්ධය. (1999 Z)

(07) එක් හිමොග්ලොබින් අණුවක් සමඟ සම්බන්ධ වන ඔක්සිජන් අණු ගණන,
1. එකකි 2. දෙකකි 3. තුනකි 4. හතරකි 5. පහකි (2004)

(08) යම් පුද්ගලයෙකුගේ රුධිර ඝනය B^+ නම් ඔහුට පාරවිලයනය කළ නොහැක්කේ පහත සඳහන් කුමන රුධිර ගණය සහිත පුද්ගලයෙකුගේ රුධිරය ද?
1. O^- 2. O^+ 3. B^- 4. B^+ 5. A^- (2007)

(09) මානව රුධිරය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. එය සුළු වශයෙන් ආම්ලිකය.
2. සුදු රුධිරාණු බහුතරයක් කණිකාමය නොවන සෛල වේ.
3. හිමොග්ලොබින් කාබන් මොනොක්සයිඩ් වලට වඩා වැඩි බන්ධුතාවක් ඔක්සිජන් වලට දක්වයි.

4. එය සමස්ථිතිය පවත්වා ගැනීමට උපකාරී වේ.
5. O රුධිර ගණය සහිත පුද්ගලයෙකුට A සහ B ඇග්ලුටිනෝජන් දෙවර්ගයම ඇත. (2014)

(10) මිනිස් රුධිරය පිළිබඳව වැරදි ප්‍රකාශය තෝරන්න.
1. එය විශේෂිත සම්බන්ධක පටකයකි
2. පරිණත රක්තාණුවක්, න්‍යෂ්ටිය සහ මයිටොකොන්ඩ්‍රියා යන දෙකම නොදරයි.
3. නියුට්‍රොෆිල සහ මොනොසයිට භක්ෂසෛලකතාව දක්වන සුදු රුධිරාණු වේ.
4. කාබන්ඩයොක්සයිඩ් වලින් වැඩිම ප්‍රමාණයක් පරිවහනය කෙරෙනුයේ හීමොග්ලොබින් සමඟ සම්බන්ධ වීමෙනි.
5. එය දේහ උෂ්ණත්වය යාමනය කිරීමට උපකාරී වේ. (2016)

(11) මිනිස් රක්තාණු පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?/කුමන ඒවාද?
(A) ඒවා රතු ඇට මිදුලු තුළ නිපදවේ.
(B) ඒවා ඔක්සිජන් සහ කාබන්ඩයොක්සයිඩ් යන දෙකම පරිවහනය කරයි.
(C) රුධිරය 1μm ක රක්තානු මිලියන 4 - 6 ඇත.
(D) නිර්වායු ශ්වසනයෙන් ATP නිපදවයි
(E) නිරෝගී පරිණත පුරුෂයෙකුගේ රක්තානු ගෝලාකාර වේ. (2018)

(12) මන්දාතනියේ ඵලවිපාකයක් විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. සිහිමූර්ජා වීම
2. වෘක්ක වලට හානි වීම
3. අභ්‍යන්තර රුධිර ගැලීම්
4. හෘත් ස්පන්දනය වැඩිවීම
5. ආඝාතය (2019)

නිපුණතාව 5.3.4 : සත්ත්ව රාජධානියේ ව්‍යුහ විවිධත්වය

නිපුණතාව 5.3.5 : මිනිසාගේ ශ්වසන පද්ධතියේ ව්‍යුහ සහ කෘත්‍යය

(01) උස් ප්‍රදේශ වාසීහු මුහුදු මට්ටම වාසීන් සමඟ සන්සන්දනය කළ විට සමහර කායික විද්‍යාත්මක වෙනස්කම් පෙන්නුම් කරයි. පහත සඳහන් වෙනස්කම් අතරින් ඔවුන් පෙන්නුම් නොකරන ලක්ෂණය කුමක්ද?
1. පෙනහළු වාතනය වන වේගය වැඩිවීම
2. පෙනහළු පරිමාව වැඩි වීම
3. රතු රුධිරාණු සංඛ්‍යාව ඉහළ යෑම
4. හිමොග්ලොබින් වැඩිවීම
5. රුධිර පීඩනය අධික වීම (1986 Z)

(02) මිනිසාගේ ශ්වසන පද්ධතිය සම්බන්ධව පහත සඳහන් වගන්ති අතරින් වැරදි වන්නේ කුමක්ද?
1. ගර්තවල බහුස්තර බිත්ති ඇත.
2. වායු හුවමාරුව සිදුවන්නේ ගර්තික පෘෂ්ඨයේ දී ය
3. පෙනහැල්ලක් වෙනම කුටීරයක ආවරණය වී ඇත.
4. ශ්වාසනාලිකා කාටිලේජ මුදු මගින් දරා ඇත.
5. ආශ්වාසය සිදුවන්නේ පෙනහැල්ලත් පරිසරයත් අතර ඇති පීඩන වෙනස්කම් හේතුකොටගෙනය (1989 Z)

(03) පහත සඳහන් වගන්ති අතරින් නීරෝගී සාමාන්‍ය වැඩිහිටි පුද්ගලයෙකුගේ පෙනහැලි පිළිබඳව වැරදි වනුයේ කුමක්ද?
1. පෙනහැලි, පටල ස්ථර දෙකක් මගින් වට වී ඇත.
2. ඔක්සිජන්හරණය වූ රුධිරය පෙනහැලි දක්වා ගෙනයන්නේ පුප්ඵුශීය ධමනි මගිනි.
3. ගර්තවල බිත්ති ප්‍රධාන වශයෙන් ම තැනී ඇත්තේ ශල්කමය අපිච්ඡද සෛල වලිනි.
4. ගර්ත හැකිලීමෙන් වලක්වන පොස්පොලිපිඩයක් පෙනහැලි මගින් ස්‍රාවය වේ.
5. ආශ්වාස වාතය සියල්ලම පෙනහැලි තුළට ඇතුලු වේ. (1996 Z)

(04) මිනිසාගේ උදම් පරිමාව යනු,
1. සාමාන්‍ය ආශ්වාසයක දී පෙනහැලි තුලට ගන්නා සහ පිට කරන වාත පරිමාව ය.
2. සාමාන්‍ය ප්‍රාශ්වාසයකට පසුව පෙනහැලි තුළ රැඳී තිබෙන වාත පරිමාව ය.
3. ගැඹුරු ආශ්වාසයක දී පෙනහැලි තුළට ගමන් කරන වාත පරිමාව ය.
4. ප්‍රාශ්වාසයක් සිදු වූ වහාම ශ්වාසනාලය හා ශ්වාසනාල ශාඛා තුළ රැඳී තිබෙන වාත පරිමාව ය.
5. සාමාන්‍ය ලෙස හුස්ම ගැනීමේ දී විනාඩියකට පෙනහැලි තුලට ගන්නා වාත පරිමාව ය. (1998 Z)

(05) පහත සඳහන් වගන්ති අතරින් මිනිසාගේ සාමාන්‍ය ආශ්වාසය පිළිබඳව වැරදි වනුයේ කුමක්ද?
1. එය සක්‍රිය ක්‍රියාවලියකි.
2. ආශ්වාසයේදී මහා ප්‍රාචීරයෙහි මධ්‍ය පෙදෙස එස වේ.
3. ආශ්වාසයේදී අන්තර්පර්ශුක පේශි සංකෝචනය වේ.
4. එය සිදුවනුයේ පෙනහැලි තුල පීඩනය වායුගෝලීය පීඩනයට වඩා අඩු වූ විට ය.
5. එය සුෂුම්නා ශීර්ෂකය මගින් පාලනය වේ. (1998 Z)

(06) පහත සඳහන් ඒවා අතරින් මිනිසාගේ ශ්වසන පද්ධතියේ කෘත්‍යයක් නොවන්නේ කුමක්ද?
1. ශබ්දය නිපදවීම
2. ආඝ්‍රාණය
3. රුධිර pH යාමනය
4. ආශ්වාසක වාතය සිසිල් කිරීම
5. නයිට්‍රජනීය බහිස්‍රාවය (2000 Z)

(07) මිනිසාගේ ශ්වසනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය වනුයේ කුමක්ද?
1. ශ්වසනයේ මූලික රිද්මය පාලනය කරනු ලබන්නේ මස්තිෂ්කයේ පිහිටි ශ්වසන මධ්‍යස්ථාන වලිනි.
2. ශ්වසනය සඳහා අන්තර්පර්ශුක පේශි දායක වේ.
3. ශ්වසන වායු හුවමාරුව සිදුවනුයේ ගර්තවල දී සහ ගර්තික ප්‍රණාල වලදී ය.
4. ආශ්වාසය සක්‍රිය ක්‍රියාවලියක් වන අතර ප්‍රාශ්වාසය නිෂ්ක්‍රිය ක්‍රියාවලියකි.
5. රුධිරයේ ඔක්සිජන් වල ආංශික පීඩනයට සංවේදී රසායනික ප්‍රතිග්‍රාහක ශීර්ෂපෝෂී ධමනි වල පිහිටයි. (2000)

(08) දේහ පෘෂ්ඨය හරහා ශ්වසන වායු හුවමාරු වීම,
(A) භෞමික ජීවිතය සඳහා අනුවර්තනයක් නොවේ.
(B) පෘෂ්ඨ වර්ගඵලය /පරිමා අනුපාතය වැඩි විට කාර්යක්ෂමව සිදුවේ .
(C) සක්‍රිය පරිවහනය මගින් සිදුවේ.
(D) පෘථිවිය මත ජෛව විවිධත්වය වැඩිවීම සඳහා දායක වූ ප්‍රධාන ලක්ෂණයකි
(E) සියලු මොලුස්කාවන් තුළ විවෘත සංසරණ පද්ධතියක් දැකිය හැකිය. (2001)

(09) පහත සඳහන් ශ්වසන ව්‍යුහ අතුරින් රුධිරය සමඟ නොගැටෙනුයේ කුමන ව්‍යුහයද?
1. බාහිර ජලක්ලෝම 2. අභ්‍යන්තර ජලක්ලෝම
3. ශ්වාසනාල 4. පත් පෙනහැලි
5. පෙනහැලි (2002)

(10) පහත සඳහන් ප්‍රකාශ අතරින් මිනිසාගේ ශ්වසනය යාමනය කිරීම පිළිබඳ ව වැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?
1. රුධිරයේ pH අගය අඩුවීම ශ්වසන වේගය වැඩි කරයි.
2. පෙනහැලි වල ප්‍රසාර ප්‍රතිග්‍රාහක උත්තේජනය වීම ආශ්වාසය නවතයි
3. ශ්වසන මධ්‍යස්ථානය පිහිටනුයේ වැරෝලි සේතුවේ සහ හයිපොතැලමසේ ය
4. යාමනය සඳහා ඉවහල් වන රසායනික ප්‍රතිග්‍රාහක ශීර්ෂපෝෂී ධමනි වල පිහිටයි.
5. ශ්වසන ක්‍රියාවලිය යාමනය වන්නේ අනිච්ඡානුග යාන්ත්‍රණයකිනි (2003)

(11) මිනිසාගේ ශ්වසන පද්ධතියේ පහත සඳහන් ග්‍රන්ථි අතරින් එහි ක්‍රියාකාරීත්වයන් සමඟ වැරදි ලෙසට යුගලනය වී ඇත්තේ කුමක්ද?
1. නාසය - ඇතුල් වන වාතය තෙත් හා උණුසුම් කරයි.
2. ග්‍රසනිකාව - ශ්ලේෂ්මල නිපදවයි.
3. ස්වරාලය - ශබ්දය නිපදවයි
4. ශ්වාසනාලය - ආගන්තුක ද්‍රව්‍ය ඉවත් කරයි.
5. ගර්ථ - වායු හුවමාරු කරයි. (2005)

(12) වාහිනීමය නොවූ ශ්වසන ව්‍යුහයක් ඇත්තේ,
1. අනෙලීඩාවන්ගේ ය 2. ක්‍රස්ටේසියාවන්ගේ ය 3. කෘමීන්ගේ ය
4. මොලස්කාවන්ගේ ය 5. මත්ස්‍යයන්ගේ ය (2005)

(13) පහත සඳහන් ප්‍රකාශ අතරින් සතුන්ගේ ශ්වසනය පිළිබඳ වැරදි වන්නේ කුමක්ද?
1. ශ්වසනපෘෂ්ඨවල දී වායු හුවමාරුව සෑම විට ම සිදුවන්නේ විසරණය මගිනි.
2. පත් පෙනහැලි මකුළුවන්ගේ ශ්වසන ව්‍යුහ වේ.
3. ඇනලීඩාවන්ගේ දක්නට ලැබෙන එක් ශ්වසන වර්ණයක් වන්නේ හීමෝසයනීන්ය.
4. විවේකී ව සිටින විට සාමාන්‍ය නිරෝගී පරිණත පුද්ගලයෙකුගේ උදම් පරිමාව 500ml පමණ වේ.
5. මිනිසාගේ පෙනහැලි වල ඇති ඇදීම සඳහා ප්‍රතිග්‍රාහක උත්තේජනය වීම මගින් ආශ්වාසය නවතී. (2006)

(14) මිනිසාගේ වාතාශ්‍රය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි වන්නේ කුමක්ද?
1. එය පෙනහැලි තුළට හෝ ඉන් පිටතට වාතය ගමන් කරවන යාන්ත්‍රික ක්‍රියාවලියයි.
2. ආශ්වාසයේ දී ප්‍රාචීරය ඉහිල් වේ.
3. විවේකී ව සිටින විට ප්‍රාශ්වාස නිෂ්ක්‍රිය ක්‍රියාවලියකි.
4. සාමාන්‍ය වාතාශ්‍රය රිද්මයානුකූල සහ අනිච්ඡානුග වේ.
5. සුෂුම්නා ශීර්ෂකයේ ඇති ශ්වසන මධ්‍යස්ථානය ආශ්වාස නිශේධනය කරන අතර ප්‍රාශ්වාසය උත්තේජනය කරයි. (2009)

(15) සත්ත්වයන් අතර දක්නට ලැබෙන ශ්වසන ව්‍යුහ කිහිපයක් සහ එම ව්‍යුහ දරන සතුන් අයත් වන වංශ පහත දක්වේ. එහි සඳහන් ශ්වසන ව්‍යුහ වංශ සංකලන අතුරින් වැරදි වන්නේ කුමක්ද?

	ශ්වසන ව්‍යුහය	වංශය
1.	බාහිර ජලක්ලෝම	ඇනලීඩා
2.	ශ්වාසනාල	ආත්‍රොපෝඩා
3.	පත් පෙනහැලි	මොලස්කා
4.	පෙනහැලි	කෝඩේටා
5.	දේහ පෘෂ්ඨය	කෝඩේටා

(2010)

(16) සත්ත්ව රාජධානිය තුළ දැකිය හැකි ශ්වසන ව්‍යුහ සමහරක් පහත දක්වේ.
A. පෙනහැලි B. පත් පෙනහැලි C. ශ්වාසනාල
D. අභ්‍යන්තර ජලක්ලෝම E. බාහිර ජලක්ලෝම F. දේහාවරණය
පෘෂ්ඨවංශීන් ශ්වසන වායු හුවමාරුව සඳහා භාවිතා කරනුයේ ඉහත සඳහන් ඒවායින් කුමක් ද/ කුමන ඒවාද?
1. A පමණි 2. A සහ D පමණි 3. A, D සහ E පමණි
4. A, D, E සහ F පමණි 5. A, C, D, E සහ F ට පමණි (2011)

(17) සිගරට් දුම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. එයට දීර්ඝකාලීන ලෙස නිරාවරණය වීම නිසා ශ්වසන මාර්ග අපිච්ඡදයේ ජනක ස්තරයේ සෛලවල ක්‍රියාකාරීත්වය අඩු වේ.
2. එය ශ්වසන මාර්ග අපිච්ඡදයේ ඇති කලස් සෛල හා පක්ෂ්මධර සෛල උත්තේජනය කර ඒවායේ ක්‍රියාකාරීත්වය වැඩි කරයි.
3. එය හෘත් ස්පන්දන සීඝ්‍රතාව සහ රුධිරය ඔස්සේ ඔක්සිජන් පරිවහනය කිරීම වැඩි කරයි.
4. එය පර්යන්ත රුධිර වාහිනී විස්තාරණය කර සමට සැපයෙන රුධිර පරිමාණය වැඩි කරයි.
5. එය පෙනහැලි පටකයෙන් ජාරක එන්සයිම විශාල ප්‍රමාණයක් නිදහස් කිරීමට දායක වේ. (2012)

(18) පහත සඳහන් ශ්වසන ව්‍යුහ අතුරෙන් පෘෂ්ඨවංශීන්ගේ මෙන්ම අපෘෂ්ඨවංශීන්ගේ ද දැකිය හැක්කේ කුමන ව්‍යුහය ද?
(A) අභ්‍යන්තර ජලක්ලෝම (B) පත් පෙනහැලි (C) දේහ පෘෂ්ඨය
(D) බාහිර ජලක්ලෝම (E) ශ්වාසනාල (2015)

(19) මිනිසාගේ ශ්වසන පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. බාහිර අන්තර්පර්ශුක පේශිවල සංකෝචනය නිසා ආශ්වාසය සිදු වේ.
2. ශ්වාසනාල කුහරය ස්තම්භික අපිච්ඡදයෙන් ආස්තරණය වේ.
3. දකුණු පෙහැල්ල ඛණ්ඩිකා දෙකකින් සමන්විත වේ.
4. පෙනහැලි තුළදී ශ්වසන වායු හුවමාරුව සඳහා ශක්තිය අවශ්‍ය වේ.
5. ස්වරාලයේ ස්වර තන්ත්‍ර ඇදීමට ලක් වී කටහඬ නිපදවයි. (2016)

(20) ආශ්වාසයේදී පහත සඳහන් ඒවායින් කුමක් සිදුවේද?
1. බාහිර අන්තර්පර්ශුක පේශි ඉහල් වීම
2. මහා ප්‍රාචීරය ඉහිල් වීම
3. උරතලය ඉදිරියට චලනය වීම
4. ප්ලූරා කුහරයේ පීඩනය වැඩිවීම
5. ගර්ත තුළට අන්තර්සෛලය තරලය ගලා ඒම (2017)

(21) මිනිසාගේ ආශ්වාස ප්‍රාශ්වාස කිරීම යාමනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. එය සුෂුම්නා ශීර්ෂකයේ සහ හයිපොතැලමසේ පිහිටි ශ්වසන මධ්‍යස්ථාන මගින් යාමනය වේ
2. සුෂුම්නා ශීර්ෂකයේ පිහිටි ආශ්වාස මධ්‍යස්ථානය උත්තේජනය වීම නිසා බාහිර අන්තර්පර්ශුක පේශි වලට ස්නායු ආවේග සැපයේ.
3. ධමනි රුධිරයේ pH අගය වැඩිවීම නිසා මහා ධමනියේ රසායන ප්‍රතිග්‍රාහක උත්තේජනය වේ.
4. පෙනහැලි වල ප්‍රසාර ප්‍රතිග්‍රාහක උත්තේජනය වීම නිසා ප්‍රාශ්වාස මධ්‍යස්ථානය නිෂේධනය වේ.
5. ප්‍රාශ්වාස මධ්‍යස්ථානය උත්තේජනය වීම නිසා මහා ප්‍රාචීරය සංකෝචනය වේ. (2018)

(22) දුම්බීම,
(A) ශ්වසන මාර්ගයේ කලස් සෛල මගින් ශ්ලේෂ්මලය ස්‍රාවය වීම උත්තේජනය කරයි.
(B) ක්ෂයරෝගය ඇති කරයි.
(C) රුධිරයේ ඔක්සිජන් පරිවහනය අඩු කරයි.
(D) ශ්වසන මාර්ගයේ පක්ෂමවල ක්‍රියාව නිශේධනය කරයි.
(E) හෘත් ස්පන්දනය අඩු කරයි. (2019)

(43) සත්ත්වයින්ගේ ශ්වසන වර්ණක පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.
(A) මයොග්ලොබින් අස්ථික මත්ස්‍යයින්ගේ ඇත.
(B) හීමොග්ලොබින් මොලුස්කාවන්ගේ ඇත.
(C) ක්ලෝරෝක්ලුවරින් ඇනලීඩාවන්ගේ ඇත.
(D) හීමොඑරිතින් ඇනලීඩාවන්ගේ ඇත.
(E) හීමොසයනින් උරගයින්ගේ ඇත. (2019)

නිපුණතාව 5.4.0 : ප්‍රතිශක්තිය

නිපුණතාව 5.4.1 : ප්‍රතිශක්ති ආකාර

(01) සක්‍රිය ප්‍රතිශක්තිය, අක්‍රිය ප්‍රතිශක්තියට වඩා ඵලාදායී වන්නේ, සක්‍රිය ප්‍රතිශක්තිය,
1. රෝගයෙන් ක්ෂණික ආරක්ෂාව සපයන නිසාය.
2. ශරීරයේ අහිතකර ප්‍රතික්‍රියා ඇති කිරීමේ හැකියාව අඩු බැවිනි
3. දීර්ඝ කාලයක් පවතින නිසාය
4. ප්‍රතිදේහ නිෂ්පාදනයකින් තොර නිසාය
5. ආවේණික වන නිසාය (1991 B)

(02) නීරෝගී දරුවන්ට පෝලියෝ එන්නත් ලබාදීමෙන් ලබන ප්‍රතිශක්තිය නිදසුනක් වන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරකටද?
1. කෘත්‍රිම නිෂ්ක්‍රිය ප්‍රතිශක්තිය 2. කෘත්‍රිම සක්‍රිය ප්‍රතිශක්තිය
3. ස්වභාවික සක්‍රිය ප්‍රතිශක්තිය 4. ස්වභාවික අක්‍රිය ප්‍රතිශක්තිය
5. වාර්ගික ප්‍රතිශක්තිය (1994 B)

(03) පෝලියොමයලටිස් රෝගයට එරෙහිව නීරෝග දරුවන් එන්නත් කිරීම නිදසුන් වන්නේ,
1. කෘත්‍රිම අක්‍රිය ප්‍රතිශක්තියට 2. කෘත්‍රිම සක්‍රිය ප්‍රතිශක්තිය
3. ස්වභාවික සක්‍රිය ප්‍රතිශක්තියට 4. ස්වාභාවික අක්‍රිය ප්‍රතිශක්තිය
5. කෘත්‍රිමව ප්‍රේරණය කළ ස්වභාවික ප්‍රතිශක්තියට (2005)

(04) මානව ප්‍රතිටෙටනස් ඉම්යුනොග්ලොබියුලීන් එන්නත් කිරීමෙන් පසු කෙනෙකු තුල ඇති වන ප්‍රතිශක්තිය හඳුන්වන්නේ,
1. ස්වාභාවික පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය ලෙසය
2. ස්වාභාවික පරිචිත ප්‍රවේණික ප්‍රතිශක්තිය ලෙසය
3. ස්වාභාවික පරිචිත සක්‍රිය ප්‍රතිශක්තිය ලෙසය
4. කෘත්‍රිම පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය ලෙසය
5. කෘත්‍රිම පරිචිත සක්‍රිය ප්‍රතිශක්තිය ලෙසය (2008)

(05) මිනිසාගේ දේහ තරලවල ඇති පහත සඳහන් එන්සයිම අතුරින් කවරක් බැක්ටීරියා සෛල බිත්ති විනාශ කිරීමට සමත් වේද?
1. ලෙසතිනේස් 2. හයිලුරොනිඩේස් 3. ලයිසොසයිම්
4. පොස්පොලිපේස් 5. ඇමයිලේස් (2009)

(06) සරම්ප වැනි බෝවන රෝගයකින් සුවය ලබන කෙනෙකු තුල පහත සඳහන් කුමන ප්‍රතිශක්ති වර්ගය වර්ධනය වේද?
1. ස්වභාවික පරිචිත සක්‍රිය ප්‍රතිශක්තිය
2. ස්වභාවික පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය
3. කෘත්‍රිම පරිචිත සක්‍රිය ප්‍රතිශක්තිය
4. කෘත්‍රිම පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය
5. ප්‍රවේණිකව පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය (2009)

(07) රෝග ආසාදනය කරන ක්ෂුද්‍රජීවීන්ගේ ආක්‍රමණය හා වර්ධනය වැළැක්වීමට හා මැඩ පැවැත්වීමට නීරෝගී මිනිස් දේහය තුල යාන්ත්‍රණ රැසක් විකසනය වී ඇති බැවින් එවැනි ක්ෂුද්‍රජීවීන්ට නිරාවරණය වන සියලුම පුද්ගලයෝ රෝගී නොවෙති. එවැනි යාන්ත්‍රණයක් නොවන්නේ පහත සඳහන් ඒවා අතුරින් කුමක්ද?
1. ක්ෂුද්‍ර ජීවීන් සඳහා සම භෞතික බාධකයක් ලෙස කිරීම
2. කඳුළු හා ශ්ලේෂ්මල ස්‍රාවයන් ක්ෂුද්‍ර ජීවී ආක්‍රමණ පාලනය කිරීම
3. ආමාශයික යුෂයේ අඩු pH අගය ක්ෂුද්‍ර ජීවී ආක්‍රමණ පාලනය කිරීම
4. ප්‍රදාහක ප්‍රතිචාර
5. මිනිස් දේහයේ සිටින සාමාන්‍ය ක්ෂුද්‍ර ජීවී සංහතිය මගින් නිපදවනු ලබන ප්‍රතිජීවක ආක්‍රමණික ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීම (2012)

(08) BCG එන්නත ඇතුල් කිරීම උදාහරණයක් වන්නේ,
1. කෘත්‍රිම පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය සඳහාය
2. කෘත්‍රිම පරිචිත සක්‍රිය ප්‍රතිශක්තිය සඳහාය
3. ස්වභාවික පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය සඳහාය
4. ටෙටනස් වැළැක්වීම සඳහා සාමාන්‍යයෙන් සිදුකරන මහජන සෞඛ්‍ය පිළිවෙතක් සඳහාය.
5. ස්වභාවික පරිචිත සක්‍රිය ප්‍රතිශක්තිය සඳහාය. (2014)

(09) පහත සඳහන් කවරක්/කවර ඒවා මිනිස් සිරුරේ විශිෂ්ට නොවන ආරක්ෂක යාන්ත්‍රණ ලෙස සැලකේද?
(A) ස්වභාවික ක්ෂුද්‍රජීවී ආසාදනයක් නිසා ප්‍රතිදේහ සෑදීම.
(B) කලල බන්ධය හරහා මවගේ සිට භ්‍රෑණයට ලැබෙන ප්‍රතිදේහ
(C) සාමාන්‍ය ආසාදනයක දී හෝ පටක හානියකදී හෝ ප්‍රදාහක ප්‍රතිචාරය ඇතිවීම.
(D) වයිරස ආසාදනයක් නිසා රුධිරයේ ඉන්ටර්ෆෙරෝන් නිපදවීම.
(E) බෙලහීන කරන ලද ක්ෂුද්‍ර ජීවී සෛල එන්නත් කිරීමෙන් ප්‍රතිදේහ සෑදීම (2015)

(10) පහත සඳහන් කවරක් සක්‍රිය ප්‍රතිශක්තිකරණය සඳහා භාවිත කරනු ලබන, ජාන විකරණය කරනු ලැබූ එන්නතක් ද?
1. ප්‍රතිටෙටනස් එන්නත 2. හෙපටයිටිස් B එන්නත 3. ප්‍රතිරේබීස් එන්නත
4. මුඛ පෝලියෝ එන්නත 5. BCG එන්නත (2016)

(11) මිනිසාගේ සහජ ප්‍රතිශක්තියේ දී අභ්‍යන්තර ආරක්ෂණ සඳහා මැදිහත් වන සෛල වන්නේ,
1. T සෛල සහ B සෛල යි
2. T සෛල සහ භක්ෂක සෛල යි
3. B සෛල සහ භක්ෂක සෛල යි
4. ස්වභාවික නාශක සෛල සහ T සෛල යි
5. ස්වභාවික නාශක සෛල සහ භක්ෂක සෛල යි (2019)

නිපුණතාව 5.5.0 : බහිස්ස්‍රාවය

නිපුණතාව 5.5.1 : පරිවෘත්තීය හා බහිස්‍රාවී ඵල අතර සබඳතාව

(01) යූරියා සම්බන්ධව පහත සඳහන් වගන්ති අතරින් වැරදි වගන්තිය කුමක්ද? එය,
1. අක්මාවෙහි සංස්ලේෂණය වේ. 2. ප්‍රෝටීන බිඳ හෙලීමෙන් ව්‍යුත්පන්න වේ.
3. ක්ෂීරපායීන්ගේ පමණක් හමු වේ. 4. ජලයෙහි ද්‍රාව්‍ය වේ.
5. ශරීරය තුළ එකතු වුවහොත් විෂ වේ. (1989 Z)

(02) පහත සඳහන් වගන්ති අතරින් මිනිස් වෘක්කයෙහි සංග්‍රාහක ප්‍රණාලය පිළිබඳව වැරදි වනුයේ කුමක්ද?
1. එය වෘක්කාණුවෙහි කොටසකි.
2. එහි වැඩි කොටසක් මජ්ජාව තුළ පිහිටා ඇත.
3. සංග්‍රාහක ප්‍රණාල කිහිපයක් එක්ව පිරමීඩයක් සාදයි.
4. එක් එක් සංග්‍රාහක ප්‍රණාලයට වෘක්කාණු ගණනාවක් සම්බන්ධ වේ.
5. එය ADH තිබිය දී ජලය ප්‍රතිශෝෂණය කරයි. (1989 Z)

(03) පහත සඳහන් එක් ප්‍රතිචාරයක දක්වා ඇති ප්‍රධාන බහිස්‍රාවී ඵලය එය ඉදිරිපිට දී ඇති සත්ත්ව කාණ්ඩයට අදාළ නොවේ. මෙම ප්‍රතිචාරය තෝරන්න.

	සත්ත්ව කාණ්ඩය	ප්‍රධාන බහිස්‍රාවී ඵලය
1.	සීලන්ටරේටාවන්	ඇමෝනියා
2.	උභයජීවී කීටයන්	ඇමෝනියා
3.	උරගයින්	යූරියා
4.	ක්ෂීරපායීන්	යූරියා
5.	පක්ෂීන්	යූරික් අම්ලය

(1998 Z)

(04) බහිස්‍රාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි වන්නේ කුමක්ද?
1. එය ජීවය සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි.
2. බහිස්‍රාවී ඵලයක් ලෙස ඇමෝනියා නිපදවීමට ශක්තිය අවශ්‍ය නොවේ.
3. බහිස්‍රාවී ඵලයක් ලෙස යූරික් අම්ලය නිපදවීමේ දී කාබන් හානිය අධික වේ.
4. ක්ෂීරපායීන්ගේ නයිට්‍රජනීය බහිස්‍රාවයේ ප්‍රථම ඵලය යූරියා ය.
5. බහිස්‍රාවී ඵලයක් ලෙස යූරික් අම්ලය නිපදවීමේ දී ජල සංරක්ෂණය උපරිම වේ. (2012)

(05) නයිට්‍රජනීය බහිස්‍රාවයේ අන්තඵලයක් නොවන්නේ පහත සඳහන් ඒවා අතරින් කුමක්ද?
1. ඇමෝනියා 2. යූරියා 3. ක්‍රියටිනීන් 4. යූරික් අම්ලය
5. පිත් වර්ණක (2012)

(06) නයිට්‍රජනීය බහිස්ස්‍රාවයේ අන්තඵල පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද?
1. පෘෂ්ඨවංශීන්ගේ විෂ අඩු ම නයිට්‍රජනීය බහිස්ස්‍රාවී ද්‍රව්‍යය යූරියා ය.
2. යූරියාවල අධික ද්‍රාව්‍යතාව නිසා එය බහිස්ස්‍රාවය කිරීමට අධික ජල ප්‍රමාණයක් අවශ්‍යය.

3. යූරියා බහිස්‍රාවය කිරීම නිසා දේහයෙන් සිදු වන කාබන් හානිය අධිකය.
4. ජලජ පක්ෂීන්ගේ ප්‍රධාන නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය යූරික් අම්ලයය.
5. ක්‍රියටින් යනු ක්ෂීරපායින්ගේ නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලයකි.

(07) බහිස්‍රාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. බිලිරුබින් බහිස්‍රාවී ඵලයක් ලෙස සැලකේ.
2. සෑම සතෙකුගේ ම ප්‍රථම නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය ඇමෝනියා වේ.
3. දේහයෙන් සිදුවන කාබන් හානිය සැලකූ විට යූරික් අම්ල නිෂ්පාදන අවාසිදායක වේ.
4. මිනිසාගේ යූරියා නිපදවන ප්‍රධාන ස්ථානය වෘක්කයයි.
5. වෘක්කිකා දේහයේ අභ්‍යන්තරයට හා බාහිරයට විවෘත වේ. (2014)

(08) බහිස්‍රාවය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. බහිස්‍රාවය සිදු නොවුනහොත් රුධිර pH අගය වෙනස් විය හැකිය.
2. මලපහ කිරීම බහිස්‍රාවී ආකාරයකි.
3. පිත්ත වර්ණක මිනිසාගේ බහිස්‍රාවී ඵලයක් වේ.
4. නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය ලෙස යූරික් අම්ලය නිපදවන විට කාබන් හානිය උපරිම වේ.
5. බහිස්‍රාවී ඵලයක් ලෙස ඇමෝනියා නිපදවීමට ශක්තිය අවශ්‍ය නොවේ. (2016)

(09) බහිස්‍රාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. සමස්ථිතිය පවත්වා ගැනීම සඳහා බහිස්‍රාවය අත්‍යවශ්‍ය ය.
2. බහිස්‍රාවය යනු දේහයෙන් නයිට්‍රජනීය අපද්‍රව්‍ය ඉවත් කිරීම ය.
3. මිනිසුන්ගේ පිත්ත වර්ණක, වෘක්ක සහ ආහාර මාර්ගය මගින් බහිස්‍රාවය කෙරේ.
4. වෘක්කිකා, ඇනලීඩාවන්ගේ සහ මොලස්කාවන්ගේ බහිස්‍රාවී ව්‍යුහයි.
5. ක්ෂීරපායින්ගේ නයිට්‍රජනීය බහිස්‍රාවයේ ප්‍රථම ඵලය ඇමෝනියා ය. (2017)

නිපුණතාව 5.5.2 : සතුන්ගේ බහිස්‍රාවී ව්‍යුහයන්ගේ විවිධත්වය

(01) හරිත ග්‍රන්ථි බහිස්‍රාවී අවයව වනුයේ,
1. පැතලි පණුවන්ගේ ය. 2. ඇනෙලිඩාවන්ගේ ය.
3. මොලුස්කාවන්ගේ ය. 4. ක්‍රස්ටේසියාවන්ගේ ය. 5. කෘමීන්ගේ ය.
(2004)

(02) සත්ත්ව රාජධානිය තුළ දැකිය හැකි බහිස්‍රාවී ව්‍යුහ සමහරක් සහ එම ව්‍යුහ දරන සතුන්ට නිදසුන් පහත දක්වා ඇත. එම බහිස්‍රාවී ව්‍යුහය - නිදසුන් සම්බන්ධතා අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. ලවණ ග්‍රන්ථි - තිලාපියා 2. හරිත ග්‍රන්ථි - ඉස්සා
3. වෘක්කිකා - කුඩැල්ලා 4. සිළු සෛල - *Bipalium*
5. මැල්පිගීය නාලිකා - මී මැස්සා (2011)

(03) සත්ත්වයින්ගේ බහිස්‍රාවී ව්‍යුහ පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. කැස්බෑවන්ගේ ලවණ ග්‍රන්ථි පිහිටනුයේ ජම්බාලිය ආසන්නයේ ය.
2. මිනිසාගේ ස්වේද ග්‍රන්ථි අපිචර්මයේ ගැඹුරු ස්තරවල ද පිහිටයි.

3. ක්‍රස්ටේශියාවන්ගේ හරිත ග්‍රන්ථි අන්නස්‍රෝතයට පූර්ව ව පිහිටයි.
4. කෘමීන්ගේ මැල්පිගීය නාලිකා විවෘත වනුයේ දේහයේ උදරීය පෘෂ්ඨයෙනි.
5. සිළු සෛල පැතලි පණුවන් සහ නිඩාරියාවන් තුළ දැකිය හැකිය. (2015)

(04) බහිස්‍රාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. නෙමටෝඩාවන්ට ඇත්තේ අන්වායාම නාල සහිත සරල බහිස්‍රාවී පද්ධතියකි.
2. වෘක්කිකා යනු ඇනලිඩාවන්ගේ පමණක් දැකිය හැකි බහිස්‍රාවී ව්‍යුහ වේ.
3. මිනිසුන්ගේ යූරියා සංශ්ලේෂණය සිදුවන ප්‍රධාන ස්ථානය වෘක්කයයි.
4. ජල සංරක්ෂණය උපරිම වන්නේ නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය ලෙස යූරියා නිපදවන විටය.
5. කරදිය අස්ථික මත්ස්‍යයින්ගේ ප්‍රධාන නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය ඇමෝනියා ය. (2018)

(05) දී ඇති සත්ත්ව කාණ්ඩයේ ප්‍රධාන ප්‍රතිචාරයේ ද?

	සත්ත්ව කාණ්ඩය	ප්‍රධාන නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය
1.	ක්ෂීරපායීන්	යූරික් අම්ලය
2.	පක්ෂීන්	යූරියා
3.	මැඩියන්	යූරික් අම්ලය
4.	මෝරුන්	යූරියා
5.	කෘමීන්	ඇමෝනියා

(2019)

නිපුණතාව 5.5.3 : මානව මූත්‍ර පද්ධතියේ දළ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) අවිදුර සංවලිත නාලිකාවේ Na^+ ප්‍රතිශෝෂණය වළක්වන ඖෂධයක් මගින් පහත සඳහන් කුමන ක්‍රියාව පොළඹවයි ද?
1. අවිදුර නාලිකාවේ ජලය ප්‍රතිඅවශෝෂණය කිරීම. 2. මූත්‍රා පිට කිරීම අඩු කිරීම.
3. මූත්‍රාවල ග්ලූකෝස් පෙන්නුම් කිරීම. 4. රුධිර පරිමාව වැඩි කිරීම.
5. නිදහස් වන ADH ප්‍රමාණය අඩු කිරීම. (1986 Z)

(02) වකුගඩුවෙන් ඉටු නොවන කෘත්‍යය වනුයේ,
1. පටක තරල පෙරීම ය. 2. හෝර්මෝන ස්‍රාවය ය.
3. ජල සහ ලවණ තුල්‍යතාව යාමනය කිරීම ය. 4. මූත්‍ර සෑදීම ය.
5. රුධිර පීඩනය පාලනය කිරීමය. (1989 Z)

(03) මිනිස් වෘක්කාණුවෙහි ග්ලූකෝස් ප්‍රතිශෝෂණය සිදු වන්නේ.
1. අවිදුර සංවලිත නාලිකාවෙහි ය.
2. හෙන්ලේ පුඩුවෙහි අවරෝහණ බාහුවෙහි ය.
3. හෙන්ලේ පුඩුවෙහි ආරෝහණ බාහුවෙහි ය.
4. විදූර සංවලිත නාලිකාවෙහි ය.
5. සංග්‍රාහක ප්‍රණාලයෙහි ය. (1992 Z)

(04) සාමාන්‍ය මිනිස් වෘක්කයෙහි පෙරීමේ ක්‍රියාවලියේ දී පෙරනයට ගමන් කරනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. රක්තාණු 2. ඇල්බියුමින් 3. ශ්වේතාණු
4. පට්ටිකා 5. ග්ලූකෝස් (1994 Z)

(05) රුධිරයේ ADH ඇති විට දී හෝ නැති විට දී මිනිසාගේ මුත්‍රධර නාලිකාවල වැඩිම ජල ප්‍රතිශෝෂණයක් සිදුවනුයේ,
1. අවිදූර සංවලිත නාලිකාවෙහි ය.
2. හෙන්ලේ පුඩුවෙහි අවරෝහණ බාහුවෙහි ය.
3. හෙන්ලේ පුඩුවෙහි අවරෝහණ බාහුවෙහි ය.
4. විදූර සංවලිත නාලිකාවෙහි ය.
5. සංග්‍රාහක ප්‍රණාලයෙහි ය. (1995 Z)

(06) පහත සඳහන් වගන්ති අතරෙන් සාමාන්‍ය මිනිස් වෘක්කය පිළිබඳ ව වැරදි වනුයේ කුමක් ද?
1. එය පිහිටා ඇත්තේ ප්‍රතිඋදරච්ඡදව ය.
2. එය අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියා කරයි.
3. මූත්‍ර නිපදවීමේ දී භෞතික ක්‍රියාවලි සහභාගී වේ.
4. ගුච්ඡිකා පෙරනයේ ආස්‍රැති පීඩනය, ගුච්ඡිකාව තුළ ඇති රුධිරයේ ආස්‍රැති පීඩනයට සමාන වේ.
5. එහි බරට සාපේක්ෂව උදර කුහරයෙහි පිහිටි අන් සියලු අවයවයන්ට වඩා වැඩි රුධිර ප්‍රමාණයක් එයට ලැබේ. (1995 Z)

(07) නිරෝගී වැඩිහිටි පුද්ගලයෙකුගේ වෘක්කාණුවක් තුළ දී ගුච්ඡිකා පෙරනයෙහි අඩංගු පහත සඳහන් ද්‍රව්‍ය අතුරෙන් සම්පූර්ණයෙන් ම ප්‍රතිශෝෂණය වනුයේ කුමක් ද?
1. K^+ 2. ග්ලූකෝස් 3. යූරියා 4. PO_4^{3-} 5. Cl^- (1996 Z)

(08) පහත සඳහන් ඒවා අතුරින් මිනිස් වෘක්කයේ කෘත්‍යයක් නොවනුයේ කුමක් ද?
1. යූරියා සංස්ලේෂණය 2. රුධිර පීඩනය යාමනය
3. ග්ලූකෝස් ප්‍රතිශෝෂණය 4. රුධිර pH යාමනය
4. වැඩිපුර ජලය බැහැර කිරීම (1997 Z)

(09) පහත සඳහන් වගන්ති අතුරින් මිනිසාගේ වෘක්කාණුව පිළිබඳ ව අසත්‍ය වනුයේ කුමක්ද?
1. එය වෘක්කයේ කෘත්‍යමය ඒකකය යි.
2. සංග්‍රාහක ප්‍රණාලය වෘක්කාණුවට අයත් නැත.
3. ග්ලූකෝස් ප්‍රතිශෝෂණය එහි විදූර සංවලිත නාලිකාවේ දී සිදු වේ.
4. ජලයේ අනිවාර්ය ප්‍රතිශෝෂණණය එහි අවිදූර සංවලිත නාලිකාවේ දී සිදු වේ.
5. බාහික වෘක්කාණු වෘක්කයක් තුළ වැඩිපුර පවතී. (1998 Z)

(10) මිනිසාගේ මුත්‍රධර නාලිකාවක ගුච්ඡිකා පෙරනයෙහි පරිමාවේ විශාල අඩුවීමක් සිදුවනුයේ,
1. අවිදූර සංවලිත නාලිකාවෙහි ය.
2. හෙන්ලේ පුඩුවෙහි අවරෝහණ බාහුවෙහි ය.
3. හෙන්ලේ පුඩුවෙහි ආරෝහණ බාහුවෙහි ය.
4. විදූර සංවලිත නාලිකාවෙහි ය.
5. සංග්‍රාහක ප්‍රණාලයෙහි ය. (1999 Z)

(11) නිරෝගී සාමාන්‍ය පුද්ගලයෙකුගේ වෘක්කාණුවක් තුළ දී,
1. අතිපරිස්‍රාවනය සිදු වනුයේ අවිදූර සංවලිත නාලිකාවේ දීය.
2. පෙරනය විදූර සංවලිත නාලිකාවට ලඟාවීමට ප්‍රථම සෝඩියම් අයන සම්පූර්ණයෙන්ම ප්‍රතිශෝෂණය කෙරේ.
3. පෙරනයේ ඇති සියලුම ග්ලූකෝස් අවිදූර සංවලිත නාලිකාවේ දී ප්‍රතිශෝෂණය කෙරේ.
4. හෙන්ලේ පුඩුවේ අවරෝහණ බාහුවේ ජලය සඳහා පාරගම්‍යතාව ADH මගින් වැඩිවේ.
5. පෙරනයේ ඇති ඇමයිනෝ අම්ල ප්‍රතිශෝෂණය සම්පූර්ණ වනුයේ හෙන්ලේ පුඩුවේ ආරෝහණ බාහුවේදී ය. (2000)

(12) මිනිස් වෘක්කය පිළිබඳ සත්‍ය වනුයේ පහත සඳහන් වගන්ති අතරෙන් කුමන එක/ඒවාද?
(A) එය රතු රුධිරාණු සෛල නිපදවීම සඳහා ඉවහල් වේ.
(B) එය රුධිරයෙහි pH යාමනය කරයි. (C) එහි නාලිකා ග්ලූකෝස් ස්‍රාවය කරයි.
(D)එය දේහයේ වූ ප්‍රධාන ආස්‍රැතියාමක අවයවය වේ.
(E) එය යූරියා සංශ්ලේෂණය කරයි. (2005)

(13) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිසාගේ වෘක්කාණුව පිළිබඳව නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවාද?
(A) එක් සංග්‍රාහක ප්‍රණාලයකට වෘක්කාණු කිහිපයක් විවෘත වේ.
(B) ADH විදූර සංවලිත නාලිකාව මත ක්‍රියා කරයි.
(C) අනිවාර්ය ජල ප්‍රතිශෝෂණය අවිදූර සහ විදූර සංවලිත නාලිකාවල දී සිදු වේ.
(D) Na^+ වෘක්කාණුවේ සෑම ප්‍රධාන කොටසකින් ම සක්‍රීය ලෙස ප්‍රතිශෝෂණය වේ.
(E) අතිපරිශ්‍රාවණය බෝමන් ප්‍රාවරයේ දී සිදු වේ. (2007)

(14) ග්ලූකෝස් සහිත මුත්‍රා නිපදවීමට වැඩි හැකියාවක් ඇත්තේ මිනිස් වෘක්කාණුවේ පහත දක්වෙන කුමන කොටසට හානි වීමෙන් ද?
1. අවිදූර සංවලිත නාලිකාව. 2. හෙන්ලේ පුඩුවේ අවරෝහණ බාහුව.
3. හෙන්ලේ පුඩුව. 4. හෙන්ලේ පුඩුවේ ආරෝහණ බාහුව.
5. විදූර සංවලිත නාලිකාව (2008)

(15) මිනිසාගේ වෘක්කාණුවේ අවිදූර සංවලිත නාලිකාව පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. එය බෝමන් ප්‍රාවරයට සම්බන්ධ ය.
2. එහි කුහරය ඝනාකාර අපිච්ඡදයෙන් ආස්තරණය වී ඇත.
3. එය අනිවාර්ය ජල ප්‍රතිශෝෂණය සිදුවන ස්ථානය යි.
4. එය Na^+ සක්‍රීය ව ප්‍රතිශෝෂනය කරයි. 5. එය K^+ ස්‍රාවය කරයි. (2009)

(16) නිරෝගී පරිණත සාමාන්‍ය පුද්ගලයකුගේ ගුච්ඡිකා පෙරනයේ අඩංගු විය නොහැක්කේ පහත සඳහන් ඒවායින් කුමක් ද?/කුමන ඒවා ද?
1. ඇල්බියුමින් 2. පට්ටිකා 3. ග්ලූකෝස්
4. ඇමයිනෝ අම්ල 5. විටමින (2010)

(17) මිනිසාගේ වෘක්කය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?/කුමන ඒවා ද?

(A) බාහික වෘක්කාණුවල ගුච්ඡිකා ඇති කේශනාලිකා සංඛ්‍යාව ජක්ෂ්ට මජ්ජා වෘක්කාණුවල ගුච්ඡිකාවල ඇති කේශනාලිකා සංඛ්‍යාවට වඩා අඩු ය.
(B) වෘක්කය තුළදී කිසිවිටකත් ජලය සක්‍රිය ලෙස නැවත අවශෝෂණය නොකෙරේ.
(C) වෘක්කය තුළදී ඇමයිනෝ අම්ල සක්‍රිය ලෙස නැවත අවශෝෂණය කෙරේ.
(D) Na^+ විදූර සංවලිත නාලිකාවේ දී ස්‍රාවය කෙරේ.
(E) උරස් කශේරුකා ද වෘක්කය හා සම මට්ටමේ පිහිටා ඇත. (2011)

(18) මිනිස් වෘක්කාණුව පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?

(A) ජලය ප්‍රතිශෝෂණය අවිදූර සංවලිත නාලිකාවේදී හෙන්ලේ පුඩුවේ ආරෝහණ බාහුවේදී සහ විදූර සංවලිත නාලිකාවේදී සිදුවිය හැකිය.
(B) අවිදූර සංවලිත නාලිකාවේදී යූරියා සක්‍රිය ලෙස අවශෝෂණය කෙරේ.
(C) ජක්ස්ටමජ්ජා වෘක්කාණුවලට දිග හෙන්ලේ පුඩු ඇත.
(D) Na^+ ප්‍රතිශෝෂණය සැමවිටම සක්‍රියව සිදුවේ.
(E) එය රුධිර පරිමාව පවත්වා ගැනීමට උපකාරී වේ. (2014)

- 19 වැනි ප්‍රශ්නය පහත දී ඇති අයන මත පදනම් වේ.

(a) Na^+ (b) Cl^- (c) HCO_3^- (d) K^+ (e) H^+

(19) මිනිස් වෘක්කාණුවේ විදූර සංවලිත නාලිකාවේ දී නැවත අවශෝෂණය කෙරෙනුයේ ඉහත සඳහන් කුමන අයන ද?

1. (a) සහ (c) පමණි.
2. (a), (b) සහ (c) පමණි.
3. (b) සහ (c) පමණි.
4. (c), (d) සහ (e) පමණි.
5. (a), (b) සහ (e) පමණි. (2015)

(20) නිරෝගී පරිණත පුද්ගලයෙක් නිපදවන මූත්‍ර ප්‍රමාණය රඳා පවතිනුයේ පහත සඳහන් කුමක්/කුමන ඒවා මත ද?

(A) රුධිරයේ ADH මට්ටම. (B) හයිපොතැලමසේ ක්‍රියාකාරිත්වය
(C) වෘක්කාණුවල අවිදූර සංවලිත නාලිකාවල ක්‍රියාකාරිත්වය
(D) කායික ක්‍රියාකාරිත්වය (E) රුධිර පරිමාව (2016)

(21) නිරෝගී වැඩිහිටි සාමාන්‍ය පුද්ගලයෙකුගේ මූත්‍ර සාම්පලයක අඩංගු විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක් ද?/කුමන ඒවා ද?

(A) H^+ (B) K^+ (C) ඇමයිනෝ අම්ල (D) යූරියා (E) සුදු රුධිරාණු (2017)

(22) මිනිස් වෘක්කාණුවේ අවිදූර සංවලිත නාලිකාවේ දී සක්‍රියව ප්‍රතිශෝෂණය කරනු ලබන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?/කුමන ඒවා ද?

(A) Na^+ (B) K^+ (C) ඇමයිනෝ අම්ල (D) ග්ලූකෝස් (E) යූරියා

නිපුණතාව 5.6.0 : ජීවීන්ගේ ස්නායුක සමායෝජනය හා අදාල ව්‍යුහ හා කෘත්‍ය

නිපුණතාව 5.6.1 : සතුන්ගේ ස්නායු පද්ධතිවල සංවිධාන රටා

(02) ස්නායු පද්ධති පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.

1. ස්නායු පද්ධතියේ ව්‍යුහාත්මක ඒකකය නියුරෝනය යි.
2. පෘෂ්ඨවංශී ස්නායු පද්ධතියේ කෘත්‍යමය ඒකකය ප්‍රතීක චාපයයි.
3. එකයිනොඩර්මේටාවන්ගේ ස්නායු ජාලයක් ඇත.
4. උපාගමය යනු උද්දීපනය සෛල අතර පිහිටන ව්‍යුහමය සන්ධියකි.
5. ඇනලීඩාවන්ගේ ස්නායු රජ්ජුව උදරීය වේ. (2009)

නිපුණතාව 5.6.2 : මානව ස්නායු පද්ධතියේ දළ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) චාලක ස්නායුවක් සෑදී තිබෙන්නේ,

1. ගැංග්ලියම් වලිනි.
2. සෛල දේහ වලිනි.
3. අනුශාඛිකා වලිනි.
4. අක්සන වලිනි.
5. ශ්වොන් සෛල වලිනි. (1989 Z)

(02) පහත සඳහන් ඒවා අතුරෙන් පර්යන්ත ස්නායු පද්ධතියේම අක්සනයක පිටතම ආවරණය සාදන්නේ කුමන එක ද?

1. ඇක්සොලෙමාව
2. අන්තෝස්නසය
3. මයලීන් කොපුව
4. නියුරිලෙමාව
5. පරිස්නසය (1991 Z)

(03) මිනිසාගේ සුෂුම්නා ස්නායු යුගල් සංඛ්‍යාව වන්නේ,

1. 10 ය.
2. 12 ය.
3. 26 ය,
4. 31 ය.
5. 33 ය. (1991 Z)

(04) මිනිසාගේ අනුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම නිසා,

1. හෘද ස්පන්දන වේගය අඩු වේ.
2. ඇසේ කණීනිකාව සංකෝචනය වේ.
3. මුත්‍රාශයේ වක්‍රපිධාන පේශිය සංකෝචනය වීම නිශේධනය වේ.
4. ආන්ත්‍රික යුෂ ස්‍රාවය වීම නිශේධනය වේ.
5. සමේ ධමනිකා විස්තාරණය වේ. (2000)

(05) මිනිසාගේ ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම

(A) ආහාර මාර්ගයේ චලන වැඩි කරයි. (B) මුත්‍රාශ වක්‍රපිධානය ඉහිල් කරයි.
(C) දහදිය දැමීම වැඩි කරයි. (D) කණීනිකා සංකුචනය කරයි.
(E) ශ්වාසනාලිකා විස්තාරණය කරයි. (2002)

(06) මිනිසාගේ අනුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම

(A) හෘත් ස්පන්දන වේගය වැඩි කරයි.
(B) පීඩාකාරී තත්ත්වවලදී සිදු වේ.
(C) කණීනිකාව සංකුචනය කරයි.
(D) ක්‍රමාකුංචන වේගය අඩු කරයි.
(E) කඳුළු නිපදවීම උත්තේජනය කරයි. (2004)

(07) ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතියේ උත්තේජනයක් නිසා ඇතිවන ක්‍රියාවක් නොවන්නේ පහත දැක්වෙන ඒවායින් කුමක් ද?
1. කණිනිකාව සංකුචනය වීම. 2. අනුශ්වාසනාලිකා සංකුචනය වීම.
3. ඛේටය ස්‍රාවය වීම උත්තේජනය වීම. 4. දහදිය දැමීම උත්තේජනය වීම.
5. ආහාර මාර්ගයේ ක්‍රමාකුංචනය වැඩිවීම. (2008)

(08) මිනිසාගේ ස්වයංසාධක ස්නායු පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. එය සමස්ථිතියේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
2. හදිසි සහ පීඩාකාරී අවස්ථාවන්හි දී එහි අනුවේගී ක්‍රියාකාරිත්වය වඩාත් ප්‍රබල වේ.
3. ප්‍රත්‍යානුවේගී පද්ධතියේ ස්නායු නිකුත් වන්නේ සුෂුම්නාවෙන් පමණි.
4. අනුවේගී උත්තේජනය ශ්වාසනාලිකා විස්තාරණය කරයි.
5. ප්‍රත්‍යානුවේගී උත්තේජනය ක්ෂුද්‍රාන්තයේ ක්‍රමාකුංචනය සහ ස්‍රාවයන් වැඩි කරයි. (2012)

(09) ස්නායු පද්ධති පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. සියලුම බහුසෛලීය සතුන් ස්නායු පද්ධතියක් දරයි.
2. මිනිසාගේ ස්නායු පද්ධතියේ කෘත්‍යමය ඒකකය නියුරෝනයයි.
3. ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය පුද්ගලයෙකු හදිසි අවස්ථාවන් සඳහා සූදානම් කරයි.
4. මිනිසාගේ චාලක නියුරෝනයක අක්‍රිය විභවය - 60 mV පමණ වේ.
5. අක්සනයක විෂ්කම්භය වැඩිවන විට ආවේග සන්නයන වේගය වැඩිවේ. (2013)

(10) ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම නිසා සිදුවනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. පිටවන මූත්‍ර ප්‍රමාණය වැඩි වීම. 2. දහදිය දැමීම අඩු වීම.
3. රෝම උද්ගාමක පේශි ඉහිල් වීම. 4. හමේ ධමනිකා විස්තාරණය වීම.
5. ගුද වක්‍රපිධානය සංකෝචනය වීම. (2015)

(11) මිනිසාගේ ප්‍රත්‍යානුවේගී උත්තේජන
1. ඇසේ කණිනිකාව විස්තාරණය කරයි. 2. හෘත් ස්පන්දන ශීඝ්‍රතාව අඩු කරයි.
3. දහදිය ස්‍රාවය වීම වැඩි කරයි. 4. ශ්වාසනාලිකා විස්තාරණය කරයි.
5. අක්මාවේ දී ග්ලයිකොජන් ග්ලූකෝස් බවට පරිවර්තනය කිරීම වැඩි කරයි. (2018)

මිනිස් මොළයේ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) මිනිස් මොළයේ බුද්ධිය හා සම්බන්ධ ප්‍රදේශය වනුයේ,
1. ලලාට බණ්ඩිකාව 2. දකුණු ශංඛක බණ්ඩිකාව
3. වම් ශංඛක බණ්ඩිකාව 4. පාර්ශ්වික බණ්ඩිකාව
5. අපර කපාල බණ්ඩිකාව (1989 Z)

(02) මිනිසාගේ මස්තිෂ්ක සුෂුම්නා තරලය ස්‍රාවය කරනු ලබන්නේ,
1. මස්තිෂ්ක කෝෂිකා මඟින් ය. 2. වරාශිකාව මඟින් ය.
3. චීනාංශුකාව මඟින් ය. 4. රුධිරග්‍රාහී ප්‍රතානය මඟින් ය.
5. හයිපොතැලමස මඟින් ය. (1991 Z)

(03) මිනිසාගේ මස්තිෂ්කය පිළිබඳ පහත වගන්ති අතරින් සත්‍ය නොවන්නේ කුමක් ද?
1. එය මොළයෙහි විශාලම කොටස වේ.
2. එය මතකය තැන්පත් කර ඇති ස්ථානයයි.
3. ධූසර හා ශ්වේත ද්‍රව්‍ය වලින් සමන්විතයි.
4. එය ඉච්ඡානුග සංකෝචනය පාලනය කිරීම හා සම්බන්ධ ය.
5. එය අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියා කරයි. (1994 Z)

(04) පහත සඳහන් ඒවා අතරෙන් මිනිස් මොළයේ හැඟීම් හා සම්බන්ධ කොටස වනුයේ,
1. අනුමස්තිෂ්කය 2. හයිපොතැලමස 3. තැලමස ය.
4. වැරෝලි සේතුව ය. 5. කැලෝස දේහය ය. (1997 Z)

(05) පහත සඳහන් වගන්ති අතුරෙන් මිනිසාගේ මස්තිෂ්කය පිළිබඳව අසත්‍ය වනුයේ කුමක්ද?
1. එය මොළයේ විශාලම කොටසයි.
2. එය ඉච්ඡානුග පේශි සංකෝචනය පාලනය කරයි.
3. එය පූර්ව මොළයේ කොටසකි. 4. එය බණ්ඩිකා තුනකට විභේදනය වී ඇත.
5. එහි චාලක ප්‍රදේශයෙන් සැලකිය යුතු කොටසක් අත සඳහා කැප වී ඇත. (1998 Z)

(06) මිනිසාගේ මස්තිෂ්කයෙහි සංවේදක කථන ප්‍රදේශය පිහිටා ඇත්තේ,
1. පාර්ශ්වික සහ ශංඛක බණ්ඩිකාවල ය.
2. ශංඛක සහ අපරකපාල බණ්ඩිකාවල යි
3. පාර්ශ්වික සහ අපරකපාල බණ්ඩිකාවල යි
4. ලලාට සහ ශංඛක බණ්ඩිකාවල ය.
5. ලලාට සහ පාර්ශ්වික බණ්ඩිකාවල ය. (1999 Z)

- 07 වැනි ප්‍රශ්නය පහත දී ඇති වගුව මත පදනම් වී ඇත. එම වගුවේ පළමුවැනි තීරුවේ මිනිස් මොළයේ කොටස් තුනක් දී ඇත. එම කොටස්වල ප්‍රධාන කෘත්‍යයන් දෙවැනි තීරුවේත් ඒවායේ සම්භවය තුන්වැනි තීරුවේත් දක්වා ඇත.

1 වැනි තීරුව	මොළයේ කොටස
A	- හයිපොතැලමස
B	- අනුමස්තිෂ්කය
C	- මධ්‍ය මොළය
2 වැනි තීරුව	මොළයේ කොටස
L	- දෘෂ්ටි ප්‍රතීක සමායෝජනය
M	- ඉච්ඡානුග පේශිවල ක්‍රියාකාරිත්වය සමායෝජනය කිරීම
N	- සමස්ථිතිය
3 වැනි තීරුව	සම්භවය
P	- අපර මස්තිෂ්කය
Q	- මධ්‍ය මස්තිෂ්කය
R	- පූර්ව මස්තිෂ්කය

(07) A, B හා C කොටස්වල ප්‍රධාන කෘත්‍යයන් අනුපිළිවෙළින් නිවැරදි ව දක්වෙන්නේ,
1. M, L, N ය. 2. N, L, M ය. 3. N, M, L ය.
4. L, N, M ය. 5. M, N, L ය. (2001)

(08) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිසාගේ හයිපොතැලමස පිළිබඳ වැරදි වන්නේ කුමක්ද?
1. එය විකසනය වනුයේ කළල මධ්‍ය මොළයෙනි.
2. තාපයාමනය සඳහා එය අත්‍යවශ්‍යය.
3. එමඟින් ස්‍රාවය කරනු ලබන සියලු හෝර්මෝන පිටියුටරිය මත ක්‍රියා කරයි.
4. එය ඔක්සිටොසින් සංස්ලේෂණය කරයි.
5. එය හෘත් ස්පන්දනය වේගය යාමනය කිරීම සඳහා දායක වේ. (2004)

(09) කිසියම් පුද්ගලයෙකුගේ වැරෝලි සේතුව හා හයිපොතැලමස අතර අර්බුදයක් ඇතිවීම නිසා මොළයේ එම ප්‍රදේශයෙන් කරනු ලබන ක්‍රියාවලට බලපෑමක් ඇති විය. මෙම අර්බුද නිසා වඩාත්ම බලපෑමක් ඇති විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමකට ද?
1. ඇස්වල චලනය 2. තුල්‍යතාව පවත්වා ගැනීම 3. මතකය
4. ශ්වසනය පාලනය කිරීම. 5. කථනය (2011)

(10) මිනිසාගේ හයිපොතැලමස පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. එය කලල පෙර මොළයෙන් විකාසනය වී ඇත.
2. එය පෝෂී හෝර්මෝන නිදහස් කරයී
3. තාපයාමන මධ්‍යස්ථානය එහි පිහිටයි.
4. එය කුසගින්න හා පිපාසය යාමනය කරයි.
5. එය මොළයේ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. (2012)

(11) මානව මොළය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. තැලමස ව්‍යුත්පන්න වනුයේ කලල පෙර මොළයෙනි.
2. අනුමස්තිෂ්කයේ පෘෂ්ඨය තැනෙනුයේ ශ්වේත ද්‍රව්‍යයෙනි.
3. එහි විශාල කුහර හතරක් ඇත.
4. පිටියුටරියේ අන්තරාසර්ග කෘත්‍ය හයිපොතැලමස මගින් යාමනය වේ.
5. මස්තිෂ්ක අර්ධ ගෝල එකිනෙක සම්බන්ධ කරන කැලෝස දේහය ශ්වේත ද්‍රව්‍යයකි. (2014)

(12) මිනිස් මොළයේ වැරෝලි සේතුව
1. පූර්ව මස්තිෂ්කය සහ අපර මස්තිෂ්කය අතර සේතුවක් තනයි.
2. මධ්‍ය මස්තිෂ්කයේ පිහිටා ඇත. 3. හිසේ ප්‍රතීක චලන පාලනය කරයි.
4. රුධිර පීඩනය පාලනය කරයි. 5. පෙනහැලිවල වාතාශ්‍රය යාමනය කරයි. (2015)

(13) මිනිස් මොළය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. කථනය හා සම්බන්ධ ක්‍රියාකාරී ප්‍රදේශය පිහිටන්නේ ලලාට ඛණ්ඩිකාවේ ය.
2. කැලෝස දේහය මගින් මස්තිෂ්කයේ අර්ධගෝල දෙක සමබන්ධ වේ.
3. සංතුලනය සහ සමතුලිතතාව පවත්වා ගැනීමේ ලා අනුමස්තිෂ්කය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

4. සංවේදන තොරතුරු සමෝධානය කිරීමේ දී තැලමස දායක වේ.
5. කැස්ස සඳහා ප්‍රතීක මධ්‍යස්ථානය පිහිටන්නේ වැරෝලි සේතුවේ ය. (2016)

(14) මිනිස් මොළය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. කේතු දේහය නිර්මාණය වී ඇත්තේ පූර්ව මොළයෙනි.
2. වැරෝලි සේතුව, හුස්ම ගැනීමේ ශීඝ්‍රතාව යාමනය කරයි.
3. පූර්ව මස්තිෂ්කය, අක්ෂි පේශිවල ප්‍රතීක චලන පාලනය කරයි.
4. අනුමස්තිෂ්කය, වේදනා සංවේදක සංජානනය සඳහා සහභාගී වේ.
5. මස්තිෂ්කය, වේදනා සංවේදක සංජානනය සඳහා සහභාගී වේ. (2017)

(15) මිනිසාගේ පේශිවල ඉච්ඡානුග චලන සමායෝජනය කරනු ලබන්නේ,
1. තැලමස මගිනි 2. වැරෝලි සේතුව මගිනි
3. සුෂුම්නා ශීර්ෂකය මගිනි 4.
5. අනුමස්තිෂ්කය මගිනි (2019)

නිපුණතාව 5.6.3 : ස්නායු ආවේග ජනනය හා සම්ප්‍රේෂණය

(01) මයලීන් කොපුවක් වාලක නියුරෝනයක හමුවන්නේ,
1. සෛල දේහය 2. අක්සනය 3. උපාගම
4. අනුශාඛිකා 5. ගැංග්ලියා (1987 Z)

(02) පහත සඳහන් වගන්ති අතුරෙන් මයලීන් කොපුව පිළිබඳ ව අසත්‍ය වනුයේ කුමක් ද?
1. එය ස්නායු ආවේගයක් සන්නයනය වන වේගය වැඩි කරයි.
2. එය ප්‍රධාන වශයෙන් සෑදී ඇත්තේ මේද ද්‍රව්‍යයකිනි.
3. එය සියලුම අක්සනවල ඇත.
4. එය අනුශාඛිකාවල ඇත.
5. මිනිසාගේ පර්යන්ත ස්නායු පද්ධතියේ දී එය ශ්වාන් සෛලවල කොටසකි. (1997 Z)

(03) මිනිසාගේ ප්‍රතීක චාපය,
1. සාමාන්‍යයෙන් නියුරෝන දෙකකින් සමන්විත යි
2. සැමවිට ම සමෙන් ආරම්භ වේ
3. සැමවිට ම මධ්‍ය ස්නායු පද්ධතිය හරහා ගමන් කරයි.
4. එහි සියලු ම නියුරෝනවල සෛල දේහ ධූසර ද්‍රව්‍යය තුළ දරයි.
5. සැමවිට ම කංකාල පේශියකින් අවසන් වේ. (1998 Z)

(04) නියුරෝනයක ක්‍රියා විභවය ඇතිවීම සඳහා අත්‍යවශ්‍ය නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. නියුරිලෙමාව 2. දේහලීය උත්තේජය 3. බහිස්සෛලීය තරලය
4. මයලීන් කොපුව 5. Na^+ හා K^+ (2003)

(05) පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් ක්‍රියා විභවය පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද?
1. ඒ සඳහා ATP අවශ්‍ය නොවේ.
2. එය පවතින කාලසීමාව ඉතා කෙටිය.

3. එය ඇති වීමේ දී අක්සන පටලයේ ධ්‍රැවීයතාව ප්‍රතිවර්තනය වේ.
4. එයට අක්සනයක් ඔස්සේ පැතිරීමට පුළුවන.
5. එය ඇතිවීම සඳහා Na^+ හා Ca^{++} අත්‍යවශ්‍යය. (2004)

(06) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් නියුරෝන පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද?
1. ආවේගයක් සන්නයනය නොකරන අවස්ථාවේ දී අක්සන පටලය විධ්‍රැවණය වී පවතී.
2. අක්‍රිය විභවය පවත්වාගැනීම සඳහා ශක්තිය වැය කිරීම අවශ්‍ය වේ.
3. අක්‍රිය අවස්ථාවල දී අක්සන පටලය පොටෑසියම් අයනවලට වඩා සෝඩියම් අයනවලට පාරගම්‍ය වේ.
4. ස්නායු ආවේගයක් සන්නයනය කිරීම සඳහා මයලින් අත්‍යවශ්‍ය ය.
5. විධ්‍රැවණය වීමේ දී පොටෑසියම් අයන අධික ලෙස අක්සන පටලය හරහා නියුරෝනය තුළට ගමන් කරයි. (2006)

(07) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ස්නායු ආවේගයක් පිළිබඳ වැරදි වන්නේ කුමක් ද?
1. එය ක්‍රියා විභව ශ්‍රේණියකි.
2. එහි වේගය වැඩි කිරීමට මයලින් කොපුව උපකාරී වේ.
3. එය පතනය කිරීම සඳහා Na^+ හා K^+ අත්‍යවශ්‍ය වේ.
4. එය නියුරෝනයේ ප්ලාස්ම පටලයේ ඇති වේ.
5. සියලු ජීවීන්ගේ අඩංගු මයලිනීභූත අක්සන මගින් වේගය වැඩි කරයි (2007)

(08) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිසාගේ චාලක නියුරෝනයක අක්‍රිය පටල විභවය පිළිබඳ ව වැරදි වන්නේ කුමක් ද?
1. එය නියුරෝනයේ ප්ලාස්ම පටලයේ ඇති වේ.
2. නියුරෝනයේ ප්ලාස්ම පටලය දෙපස අසමාන ලෙස අයන ව්‍යාප්ති වීම නිසා එය ඇති වේ.
3. එය -70mV පමණ වේ.
4. එය පවත්වාගැනීම සඳහා ATP අවශ්‍යය.
5. එයට අක්සනය ඔස්සේ ගමන් කිරීමට හැකි ය. (2008)

(09) මිනිසාගේ නියුරෝනයක අක්‍රිය විභවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) එය -70mV පමණ වේ
(B) එය පවත්වා ගැනීමට වාහක ප්‍රෝටීන් දායක වේ.
(C) Na^+, K^+ අනුක්‍රමණයක් මෙහිදී ඇතිවේ.
(D) එම අවස්ථාවේ දී නියුරෝනයේ ප්ලාස්ම පටලයේ K^+ වලට වඩා Na^+ වලට පාරගම්‍ය වේ.
(E) එම අවස්ථාවේ දී නියුරෝනය තුළ Na^+ සාන්ද්‍රණය නියුරෝනයේ පිටත Na^+ සාන්ද්‍රණයට වඩා වැඩි ය. (2010)

(10) ආවේගයක් සන්නයනය නොකරන අවස්ථාවේ ඇති මිනිසාගේ චාලක නියුරෝනයක් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. ඇතුළට පැමිණෙන ඇනායන සංඛ්‍යාව පිටතට යන ඇනායන සංඛ්‍යාවට වඩා වැඩි හෙයින් ප්ලාස්ම පටලයේ අභ්‍යන්තර පෘෂ්ඨය බාහිරයට සාපේක්ෂව සෘණ ලෙස ආරෝපණය වී ඇත.
2. නියුරෝනය තුළ ඇති ප්‍රධාන ඇනායනය Cl^- ය.
3. නියුරෝනය තුළ Na^+ හා කාබනික ඇනායනවල සාන්ද්‍රණය බාහිරයට වඩා වැඩි ය.
4. වාහක ප්‍රෝටීනවල සහභාගීත්වයෙන් සිදු කෙරෙන සක්‍රිය පරිවහනය Na^+, K^+ පොම්පය පවත්වා ගැනේ.
5. ප්ලාස්ම පටලයේ Na^+ සඳහා ඇති පාරගම්‍යතාව K^+ සඳහා ඇති පාරගම්‍යතාවට වඩා වැඩි ය. (2011)

(11) මිනිසාගේ ප්‍රතීක චාප පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?/කුමන ඒවා ද?
(A) අනිච්ඡානුග ක්‍රියා රැසක් පාලනය කිරීමට ඒවා උපකාරී වේ.
(B) ඒවායේ සහභාගිත්වය නිසා ඇති වන ප්‍රතිචාර ස්වයංක්‍රීය වේ.
(C) ඒවා සාමාන්‍යයෙන් නියුරෝන දෙකකින් සමන්විත වේ.
(D) ඒවා ස්වයංසාධක ස්නායු පද්ධතිය හරහා ප්‍රතිග්‍රාහක හා කාරක අවයව සම්බන්ධ කරයි.
(E) ඒවා ස්නායු පද්ධතියේ කෘත්‍යමය ඒකකයි. (2011)

(12) ක්‍රියා විභවයක පහත සඳහන් කුමන ගුණාංගය ස්නායු ආවේගයක් පසුපසට සන්නයනය වීම වලක්වයි ද?

1. උපරිධ්‍රැවණ කලාව	2. ප්‍රතිධ්‍රැවණ කලාව	3. අනස්සව කාලය
4. විධ්‍රැවණ කලාව	5. කාල සීමාව	(2014)

(13) නියුරෝනයක සෝඩියම් - පොටෑසියම් පොම්පය පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.
(A) Na^+ සහ K^+ පොම්ප කිරීම එකිනෙක මත රඳා පවතී.
(B) එය නියුරිලෙමාවේ පිහිටයි.
(C) ATP ඌනතාව එහි ක්‍රියාකාරිත්වයට බාධා කළ හැකි ය.
(D) අක්‍රිය පටල විභවය පවත්වා ගැනීමට එය අත්‍යවශ්‍ය ය.
(E) එය බහිස්සෛලීය තරලයේ සිට නියුරෝනය තුළට Na^+ පොම්ප කරයි. (2015)

(14) නියුරෝනවල කායික විද්‍යාව පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. අක්‍රිය පටල විභවය පවත්වා ගැනීම සඳහා සෝඩියම් පොටෑසියම් පොම්පය අත්‍යවශ්‍ය ය.
2. අක්‍රිය පටල විභවය -70mV පමණ වේ.
3. ක්‍රියා විභවයක් පවතින කාලය 2ms පමණ වේ.
4. මයලිනීභූත අක්සනයක ක්‍රියා විභවය ඇති වන්නේ රැන්ග්වියර් ගැටවල පමණි.
5. ක්‍රියා විභවයේ ප්‍රතිධ්‍රැවණ කලාවේ දී K^+ ඇතුළට ගැලීම සිදු වේ. (2016)

(15) මිනිස් නියුරෝනයක ක්‍රියා විභවය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. ක්‍රියා විභවයේ ප්‍රතිධ්‍රැවණ කලාවේ දී K^+ නියුරෝනය තුළට ගමන් කරයි.
2. ක්‍රියා විභවයක් පවත්නා කාලය මිලිතත්පර 5 ක් පමණ වේ.
3. ක්‍රියා විභවයේ විධ්‍රැවණ කලාවේ දී Na^+ නියුරෝනයෙන් පිටතට ගමන් කරයි.
4. එය ස්නායු සෛල පටලයේ ධ්‍රැවීයතාවේ අනිත්‍ය ප්‍රතිවර්තනයකි.
5. එක් ක්‍රියා විභවයකට පසුව වහාම තවත් ක්‍රියා විභවයක් ඇති විය හැකිය. (2018)

(16) නියුරෝනයක අක්‍රිය විභවය පවත්වා ගැනීම සඳහා දායක වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද? / කුමන ඒවාද?
(A) නියුරෝනයක් තුල හා පිටත Na^+, K^+, Cl^- සහ විශාල ඇනායන අසමාන ලෙස ව්‍යාප්ත වී තිබීම.
(B) 3 : 2 අනුපාතයට Na^+ නියුරෝනයෙන් පිටතටත් K^+ නියුරෝනය තුළටත් සක්‍රිය ව පරිවහනය වීම
(C) නියුරෝන පටලයේ Na^+ මාර්ග වලට වඩා වැඩි K^+ ප්‍රමාණයක් මාර්ග විවෘත වීම.
(D) නියුරෝනයක අන්තස්සෛලීය තරලය තුලට K^+ ප්‍රමාණයට වඩා වැඩි Na^+ ප්‍රමාණයක් පරිවහනය වීම
(E) බහිස්සෛලීය තරලයට නියුරෝනයේ සිට Cl^- පරිවහනය වීම (2019)

නිපුණතාව 5.6.5 : විවිධ සංවේදී අවයවවල කෘත්‍යයන්

(01) මිනිස් සමෙහි පීඩනයන්ට සංවේදී ප්‍රතිග්‍රාහකය වනුයේ,
1. රෆිනි දේහානු ය. 2. ක්‍රවුස් අන්තබල්බ ය. 3. මයිස්නර් දේහානු ය.
4. පැසිනි දේහානු ය. 5. මර්කල් මඬල ය. (1994 Z)

(02) මිනිස් දේහය තුළ, වැඩිම ප්‍රතිග්‍රාහක සංඛ්‍යාවක් ඇත්තේ,
1. සමෙහි ය. 2. නාසයෙහි ය. 3. ඇසෙහි ය.
4. කනෙහි ය. 5. දිවෙහි ය. (1995 Z)

(03) මිනිසාගේ ඇස් හිස දෙපස පිහිටියේ නම් පහත සඳහන් ක්‍රියාවන් අතරෙන් කුමක් කිරීම වඩාත්ම අපහසු වේ ද?
1. දිවීම 2. අඩු දීප්තියෙන් යුත් තරුවක් නිරීක්ෂණය කිරීම.
3. වර්ණ වෙන්කර හඳුනා ගැනීම
4. ක්‍රිකට් ක්‍රීඩා කිරීම 5. පෑනකින් ලිවීම (1996 Z)

(04) පෘෂ්ඨවංශීන්ගේ ඇස්වලට බොහෝ දුරට සමාන ඇස් ඇත්තේ පහත දක්වෙන කුමන සත්ත්ව කාණ්ඩයේ ද?
1. ඇනලිඩාවන් 2. ආත්‍රොපෝඩාවන් 3. මොලුස්කාවන්
4. ප්ලැටිහෙල්මින්තයන් 5. එකයිනොඩර්මේටාවන් (2001)

(05) පරිණාමයේ දී ප්‍රකාශ ප්‍රතිග්‍රාහක විකසනය වූ ප්‍රථම සත්ත්ව කාණ්ඩය වන්නේ,
1. සීලන්ටරේටාවන් ය. 2. පැතලි පණුවන් ය. 3. ඇනලීඩාවන් ය.
4. ආත්‍රොපෝඩාවන් ය. 5. මොලුස්කාවන් ය. (2003)

(06) පහත සඳහන් ඒවා අතරෙන් අඩු උෂ්ණත්වවල දී සංවේදී වනුයේ කුමන එක/ ඒවාද ?
(A) පැසීනියන් දේහානු (B) රෆිනි අවයව (C) ක්‍රවුස්ගේ බල්බ
(D) නිදහස් ස්නායු අන්ත (E) මයිස්නර් දේහාණු (2005)

(07) පහත දක්වෙන රස අතුරෙන් මිනිස් දිව මගින් දැනගත නොහැක්කේ කුමන රසය ද?
1. තිත්ත රස 2. පැණි රස 3. ඇඹුල් රස
4. මුඩු රස 5. උමාමි රස (2007)

(08) ප්‍රතිග්‍රාහක පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. ඒවා සම්ප්‍රේෂණ පරිවර්තක ලෙස ක්‍රියා කරයි.
2. සමහර ප්‍රතිග්‍රාහක සන්තතික ව උත්තේජනය වූ විට ප්‍රතිචාරය අඩු වේ.
3. ඒවා සැමවිට ම ස්නායු පද්ධතියට සම්බන්ධ ය.
4. මිනිසාගේ සමේ නිදහස් ස්නායු අග්‍ර විශිෂ්ට තාප ප්‍රතිග්‍රාහක ලෙස ක්‍රියා කරයි.
5. මර්කල් මඬල යාන්ත්‍ර ප්‍රතිග්‍රාහක වේ. (2012)

(09) මානව ප්‍රතිග්‍රාහක පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. ඒවා එක් ශක්ති ආකාරයක් ස්නායු ආවේග බවට පරිණාමනය කරයි.
2. සන්තතික ලෙස උත්තේජනය වීම නිසා සමහර ප්‍රතිග්‍රාහකවල ක්‍රියාකාරිත්වය අඩු වේ.
3. පැසිනි දේහාණු යාන්ත්‍ර ප්‍රතිග්‍රාහක වේ.
4. කොටි අවයවය කම්පන ප්‍රතිග්‍රාහක දරයි.
5. ක්‍රවුස් බල්බ ඉහළ උෂ්ණත්වවලට සංවේදී වේ. (2014)

නිපුණතාව 5.6.6 : මිනිස් ඇසේ හා කනේ ව්‍යුහයන් කෘත්‍යයට අදාළව

(01) කෙනෙකුට එක් ඇසකින් පමණක් පෙනේ නම් පහත සඳහන් ඒවා අතුරින් ඔහුට වැඩියෙන්ම අපහසුම වන්නේ,
1. මිනුම් පටියකින් ගෙවත්තක් මැනීම ය.
2. ඉදිරියෙන් ඔහු දෙසට පැමිණෙන මෝටර් රියක වේගය නිර්ණය කිරීම යි.
3. ඉඳිකටුවකට නූල් පොටක් දැමීම ය.
4. ශ්‍රී ලංකාවේ සිතියමක් ඇඳීම යි
5. කාමරයක බිත්තිවල සායම් ගෑම ය. (1988 Z)

(02) මිනිසාගේ මධ්‍ය කන පිරී ඇත්තේ,
1. පරිවසාවලින් ය. 2. අන්තෝවසාවලින් ය. 3. සම්බන්ධක පටකවලින් ය.
4. ස්නේහස්‍රාවී ස්‍රාවයන්ගෙන් ය. 5. වාතයෙන් ය. (1991 Z)

(03) මිනිස් ඇසෙහි කේතු,
1. ඇත්තේ එක් වර්ගයක් පමණි.
2. දෘෂ්ටිවිතානයේ ඒකාකාරී ලෙස ව්‍යාප්ත වී ඇත.
3. වර්ණ දෘෂ්ටිය සඳහා වැදගත් වේ.
4. දෘෂ්ටි වර්ණකය ලෙස රොඩොප්සීන් දරයි.
5. අඩු ආලෝකය මගින් උත්තේජනය වේ. (1994 Z)

(04) මිනිස් ඇසෙහි යෂ්ටි,
1. මධ්‍ය කූපයෙහි පිහිටා ඇත. 2. ආලෝකයට අධික ලෙස සංවේදී ය
3. අධික දෘෂ්ටි තීක්ෂණතාවයකින් යුක්තය 4. වර්ණ දෘෂ්ටිය හා සම්බන්ධය
5. කේතුවලට වඩා සංඛ්‍යාවෙන් අඩුය (1999 Z)

(05) මිනිස් කනෙහි ඇසීම හා සම්බන්ධ සංවේදක සෛල ඇත්තේ,
1. කර්ණපටහ පටලය මත ය 2. ටෙක්ටම් පටලය මත ය
3. පාදාශ්‍ර පටලය මත ය 4. තුම්බිකාව මත ය
5. කුම්බිකාව මත ය (1999 Z)

(06) මිනිසාගේ කනේ,
1. ධරණකය, ගෝලාකාර ගවාක්ෂය සමඟ ස්පර්ශ වෙමින් පවතී
2. අර්ධ චක්‍රාකාර නාල දේහ ඉරියව්ව පවත්වා ගැනීමට ආධාර වේ.
3. ශබ්ද තරංග සඳහා සංවේදී සෛල පිහිටනුයේ ආලින්දයේ ය
4. මැද කන පරිවසා තරලයෙන් පිරී පවතී.
5. කෝර්ටි අවයවය හිසේ චලන දැන ගැනීම සඳහා වැදගත් වේ. (2000)

- 7 වැනි 8 වැනි ප්‍රශ්න පහත දී ඇති වගුව මත පදනම් වී ඇත. එම වගුවේ පළමුවැනි තීරුවේ මිනිසාගේ ඇතුලු කනේ කොටස් තුනක් දී ඇත. එම කොටස් වල ප්‍රධාන කෘත්‍යයන් දෙවැනි තීරුවෙත් එම කොටස් ඇතුලු කනේ පිහිටන ස්ථාන තුන්වන තීරුවේත් දී ඇත.

	ප්‍රධාන කෘත්‍යයන්	ඇතුළු කනේ පිහිටන ස්ථාන
A - තුම්බිකාව	P - ශ්‍රවණය සඳහා ඉහවල් වේ	X - අර්ධ චක්‍රාකාර නාල
B - කුම්භිකා	Q - හිසේ චලනය දැනගැනීම සඳහා ඉවහල් වේ	Y - ආලින්දය
C - කෝර්ටි අවයවය	C - ගුරුත්වයට සාපේක්ෂව හිසේ පිහිටීම පවත්වාගැනීම සඳහා ඉවහල් වේ	Z - කර්ණ ශංඛය

(07) A, B සහ C යන කොටස් වල ප්‍රධාන කෘත්‍යයන් අනුපිළිවෙලින් නිවැරදි ව දැක්වෙන්නේ,
1. P, Q, R ය 2. Q, R, P ය 3. R, P, Q ය
4. R, Q, P ය 5. P, R, Q ය (2003)

(08) A, B සහ C යන කොටස් ඇතුළු කනේ පිහිටන ස්ථාන අනුපිළිවෙලින් නිවැරදි ව දැක්වෙන්නේ,
1. X, Y, Z ය 2. X, Z, Y ය 3. Y, Z, X ය
4. Z, X, Y ය 5. Y, X Z ය (2003).

(09) පහත සඳහන් ප්‍රකාශ අතරින් මිනිසාගේ ඇස පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක්ද?
1. අක්ෂි ගෝලයේ බිත්තිය පටක ස්තර දෙකකින් සමන්විත වේ.
2. කූපය හා දෘෂ්ටිවිතානයේ කේතු රහිත ප්‍රදේශයයි.
3. සජීවී ආලෝකයට අතිශයින් සංවේදී වේ.
4. විටමින් A රාත්‍රී අන්ධතාවය සමඟ සම්බන්ධතාවයක් දක්වයි.
5. අක්ෂි ගෝලය දික්වීම නිසා දුරදෘෂ්ටිකත්වය ඇතිවිය හැක. (2008)

(10) කෝර්ටි අවයව පිහිටන ස්ථානය වඩාත් ම හොඳින් දක්වනුයේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. තුම්බිකාව 2. කර්ණශංඛ නාලය 3. ඇතුළු කන
4. පටලමය ගහනය 5. මඩිච්චිය (2011)

(11) මිනිස් ඇසේ,
1. ප්‍රතීක චලන පාලනය කෙරෙනුයේ මධ්‍ය මස්තිෂ්කය මගිනි.
2. ශ්වේතසන ස්තරයේ ඇතුළත පෘෂ්ඨයේ 3/4 ක් පමණ ආස්තරණ වනුයේ රුධිර ග්‍රාහියෙකි.
3. ප්‍රතියෝජක දේහය යනු දෘෂ්ටිවිතානයේ පූර්ව දික්වීමකි.
4. කාචය සහ ස්වච්ඡය අතර කාච රසය පිහිටයි.
5. යෂ්ටි සංඛ්‍යාව, කේතු සංඛ්‍යාව මෙන් දස ගුණයක් පමණ වේ. (2015)

(12) මිනිස් කන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. එහි සාමාන්‍ය ශ්‍රවන පරාසය 40 - 20000 Hz වේ.
2. තිසාතිය, අණ්ඩාකාර ගවාක්ෂයට සම්බන්ධ වේ.
3. කන් පෙත්ත පාරදෘශ්‍ය කාටිලේජවලින් තැනී ඇත.
4. පටලමය ගහණය පරිවසා වලින් පිරී ඇත.
5. කෝර්ටි අවයවය ශ්‍රවණ කෘත්‍යය හා සම්බන්ධය. (2018)

(13) මිනිසාගේ දෘෂ්ටිය සඳහා ආලෝකය සහ ස්නායු ආවේග ගමන් කරන නිවැරදි මාර්ගය වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. ස්වච්ඡය → අම්මය රසය → කාචය → කාච රසය → ප්‍රකාශ ප්‍රතිග්‍රාහක → ගැංග්ලියා සෛල → ද්විධ්‍රැව සෛල → දෘෂ්ටික ස්නායුව → මස්තිෂ්කයේ අපරකපාල ඛණ්ඩිකාව
2. ස්වච්ඡය → අම්මය රසය → කාචය → කාච රසය → ප්‍රකාශ ප්‍රතිග්‍රාහක → ගැංග්ලියා සෛල → ද්විධ්‍රැව සෛල → දෘෂ්ටික ස්නායුව → මස්තිෂ්කයේ ශංඛක ඛණ්ඩිකාව
3. ස්වච්ඡය → අම්මය රසය → කාචය → කාච රසය → ප්‍රකාශ ප්‍රතිග්‍රාහක → ද්විධ්‍රැව සෛල → ගැංග්ලියා සෛල → දෘෂ්ටික ස්නායුව → මස්තිෂ්කයේ අපරකපාල ඛණ්ඩිකාව
4. ස්වච්ඡය → කාච රසය → කාචය → අම්මය රසය → ප්‍රකාශ ප්‍රතිග්‍රාහක → ද්විධ්‍රැව සෛල → ගැංග්ලියා සෛල → දෘෂ්ටික ස්නායුව → මස්තිෂ්කයේ අපරකපාල ඛණ්ඩිකාව

5. ස්වච්ඡය → කාච රසය → කාචය → අම්මය රසය → ප්‍රකාශ ප්‍රතිග්‍රාහක → ද්විධ්‍රැව සෛල → ගැංග්ලියා සෛල → දෘෂ්ටික ස්නායුව → මස්තිෂ්කයේ ශංඛක ඛණ්ඩිකාව. (2019)

නිපුණතාව 5.6.7 : මිනිස් සමේ මූලික ව්‍යුහය හා කෘත්‍යයන්

(01) පහත සඳහන් ඒවා අතරින් මිනිස් සමෙහි කෘත්‍යයක් නොවන්නේ කුමක්ද?
1. ආරක්ෂාව 2. දේහ උෂ්ණත්වය යාමනය
3. උත්තේජනය ලබා ගැනීම 4. විටමින සංස්ලේෂණය
5. මේද ගබඩා කිරීම (1992 Z)

(02) මිනිසාගේ ස්නේහස්‍රාවී ග්‍රන්ථිය,
1. දගර ගැසී ඇත 2. උෂ්ණත්වයාමනයෙහි ලා දායක වේ.
3. සම වියළීයාම වළක්වයි 4. නයිට්‍රජනීය බහිස්‍රාවය හා සම්බන්ධය
4. රෝමෝද්ගමනය පේශියට සම්බන්ධ වී ඇත. (1999 Z)

(03) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිස් සම පිළිබඳව වැරදි වන්නේ කුමක් ද?
1. මූලික පටක වර්ග හතර ම එහි ඇත. 2. එය විටමින් A සංස්ලේෂණය කරයි.
3. එය බහිස්‍රාවී අවයවයක් ලෙස ක්‍රියා කරයි.
4. එය දේහය තුළට ක්ෂුද්‍ර ජීවීන් ඇතුළු වීම වළකයි.
5. එය තාපයාමනය සඳහා උපකාරී වේ. (2002)

(04) මිනිසාගේ සමේ ඇති පහත සඳහන් ව්‍යුහ ඇසුරෙන් ස්පර්ශකය සහ පීඩනයට සංවේදී වනුයේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) මයිස්නර් දේහාණු (B) රෆිනි දේහාණු (C) නිදහස් ස්නායු අග්‍ර
(D) පැසිනියන් දේහාණු (E) ක්‍රවුස් අන්ත බල්බ (2010)

(05) මිනිසාගේ සම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) මූලික පටක වර්ග හතර ම චර්මයේ දකිමට පුළුවන.
(B) එය ලවණ සහ යූරියා බහිස්‍රාවය කරයි.
(C) අන්තරාල තරලය පෝෂණයට දායක වේ.
(D) අපිචර්මය ග්‍රන්ථි සහිත ස්ථරීභූත ශල්කමය අපිච්ඡදයකි.
(E) එය විටමින් D සංස්ලේෂණය කරයි.

නිපුණතාව 5.7.0 : සමස්ථිතිය හා අන්තරාසර්ග යාමනය

නිපුණතාව 5.7.1 : මානව අන්තරාසර්ග පද්ධතියේ කාර්යයන්

(01) ස්‍යුනික උත්තේජක හෝමෝනය නිපදවනු ලබන්නේ,
1. තයිරොයිඩයෙහි ය. 2. අග්න්‍යාශයෙහි ය. 3. අධිවෘක්ක බාහිකයේ ය.
4. ඩිම්බ කෝෂයෙහි ය. 5. පිටියුටරියෙහි ය. (1987 Z)

(02) ඇඩ්‍රිනලින් "සටන් කිරීමේ" හෝ "පලායෑමේ" ප්‍රතිචාරයක් ඇති කරන බව දන්නා කරුණකි. පහත සඳහන් ඒවායින් ඇඩ්‍රිනලින් මගින් ඇති කරන ලද ආචරණයක් නොවන්නේ කුමක් ද?
1. හෘද ස්පන්දන වේගයේ ත්වරණය
2. බඩවැල වෙත රුධිරය ගලා යෑම, අඩු වීම
3. කංකාල පේශිවලට රුධිරය සැපයුම අඩු වීම
4. ඉහළගිය රුධිර ග්ලූකෝස් මට්ටම
5. ආශ්වාස ප්‍රශ්වාසයේ ගැඹුර ඉහළ යාම (1987 Z)

(03) අයඩීන් එක්රැස් වන ඉන්ද්‍රිය වනුයේ,
1. අධිවෘක්කය ය. 2. අක්මාව ය. 3. ප්ලීහාව යි.
4. තයිමස ය. 5. තයිරොයිඩය ය. (1990 Z)

(04) ස්ත්‍රීන්ගේ ඩිම්බ මෝචනය වන අවස්ථාවෙහි දී වැඩියෙන්ම ඇත්තේ පහත සඳහන් හෝමෝන අතුරින් කුමක් ද?
1. ඊස්ට්‍රජන් 2. FSH 3. LH
4. ප්‍රොජෙස්ටරෝන් 5. ප්‍රොලැක්ටීන් (1990 Z)

(05) පුද්ගලයෙකු හදිසියේ බය වූ විට, රුධිරයෙහි වූ හෝමෝන සාන්ද්‍රණයෙහි කැපී පෙනෙන වැඩි වීමක් පෙන්නුම් කරන හෝමෝනය වන්නේ,
1. ඇඩ්‍රිනලීන් ය. 2. තයිරොක්සීන් ය. 3. ඇල්ඩොස්ටෙරොන් ය.
4. රිලැක්සීන් ය. 5. ඔක්සිටෝසින් ය. (1992 Z)

(06) පහත සඳහන් අන්තරාසර්ග ග්‍රන්ථි අතුරෙන් කැල්සියම් පරිවෘත්තීය යාමනය කරනු ලබන්නේ කුමක් මඟින් ද?
1. පැරාතයිරොයිඩය 2. හයිපොතැලමස 3. තයිමසය
4. අධිවෘක්ක මජ්ජාව 5. අපර පිටියුටරිය (1993 Z)

(07) ඔක්සිටෝසින්,
1. පූර්ව පිටියුටරිය මගින් ස්‍රාවය වේ. 2. ස්ටෙරොයිඩ හෝර්මෝනයකි.
3. කිරි සංස්ලේෂණය උත්තේජනය කරයි.
4. ද්විතියික ලිංගික ලක්ෂණවල විකසනය සඳහා වැදගත් වේ.
5. ප්‍රසූතියේදී, ගර්භාෂයේ සංකෝචනය උත්තේජනය කරයි. (1994 Z)

(08) පෝෂී හෝර්මෝනයක් වන්නේ පහත ඒවා අතුරෙන් කුමක් ද?
1. LH 2. ප්‍රොලැක්ටින් 3. කැල්සිටෝසීන්
4. ඊස්ට්‍රජන් 5. ADH (1994 Z)

(09) පීඩාවට පත් ව සිටින පුද්ගලයෙකුගේ රුධිරයෙහි වඩාත් ම වැඩිවිය හැක්කේ පහත සඳහන් කුමන හෝර්මෝනයෙහි සාන්ද්‍රණය ද?

1. ඔක්සිටෝසීන් 2. කෝර්ටිසෝල් 3. GnRH
4. ADH 5. ඇල්ඩොස්ටෙරෝන් (1995 Z)

(10) තයිරොයිඩ ග්‍රන්ථියෙන් තයිරොක්සීන් නිපදවීම සඳහා අවශ්‍ය මූලද්‍රව්‍ය වනුයේ,

1. යකඩ ය. 2. සෝඩියම් ය. 3. මැග්නීසියම් ය.
4. අයඩීන් ය. 5. ක්ලෝරීන් ය. (1996 Z)

(11) නූතන ගර්භණී පරීක්ෂාව සඳහා පදනම් වනුයේ ස්ත්‍රීන්ගේ මූත්‍රවල පහත සඳහන් කුමන හෝර්මෝනය තිබීම ද?

1. LH 2. ප්‍රොලැක්ටින් 3. FSH
4. ප්‍රොජෙස්ටරෝන් 5. hCG (1996 Z)

(12) පහත සඳහනි හෝර්මෝන අතරෙන් මිනිසාගේ රුධිර පීඩනය යාමනය සඳහා ඉවහල් නොවන්නේ කුමක් ද?

1. රෙනින් 2. ADH 3. ඇල්ඩෙස්ටෙරෝන්
4. ඇඩ්‍රිනලීන් 5. ඔක්සිටෝසින් (1997 Z)

(13) මිනිසාගේ දේහයේ ඇති පහත සඳහන් අවයව අතරෙන් ස්ටෙරොයිඩ හෝර්මෝනය ස්‍රාවය කරන්නේ කුමක් ද?

1. පිටියුටරිය 2. හයිපොතැලමස 3. අධිවෘක්කය
4. තයිරොයිඩය 5. ක්ෂුද්‍රාන්ත්‍රය (1997 Z)

(14) මිනිසාගේ රුධිර කැල්සියම් මට්ටම වැඩි කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ඉවහල්වන හෝර්මෝනය

1. කැල්සිටෝසීන් ය. 2. ගැස්ට්‍රින් ය. 3. ඔක්සිටෝසීන් ය.
4. පැරතෝර්මෝන් ය. 5. ග්ලූකගන් ය. (1998 Z)

(15) පහත දක්වෙන හෝර්මෝන අතුරෙන් මිනිසාගේ පූර්ව පිටියුටරිය මඟින් ස්‍රාවය කරනු ලබන්නේ කුමන හෝර්මෝනය/හෝර්මෝන ද?

1. FSH 2. වර්ධක හෝමෝන 3. ADH
4. ප්‍රොලැක්ටින් 5. ඔක්සිටොසින් (2000)

(16) විලෝපියෙකු දකින විට ක්ෂීරපායි ගොදුරු ජීවියෙකු තුළ නිදහස් වනුයේ පහත සඳහන් කුමන හෝර්මෝනය/හෝර්මෝන ද?

(A) කෝටිසෝල්
(B) ඇඩ්රිනලීන්
(C) තයිරොක්සීන්
(D) අධිවෘක්ක බාහික පෝෂී හෝමෝනය (ACTH)
(E) ඉන්සියුලින් (2001)

(17) මිනිසාගේ පහත සඳහන් හෝර්මෝන අතරෙන් පිටියුටරි ග්‍රන්ථිය තුළ සංස්ලේෂණය නොවන්නේ කුමන හෝර්මෝනය ද?

1. ප්‍රොලැක්ටින් 2. වර්ධක හෝමෝනය
3. තයිරොයිඩ උත්තේජක හෝර්මෝනය 4. ඔක්සිටෝසින්
5. ලූටෙයිනීකරණ හෝර්මෝනය (2002)

(18) මිනිස් හෝර්මෝන පිළිබඳ පහත සඳහන් වගන්ති අතරින් නිවැරදි වනුයේ කුමන එක/ඒවා ද?

(A) FSH ඩිම්බ ස්‍යුනිකා වර්ධනය උත්තේජනය කරයි.
(B) කොලිසිස්ටොකයිනීන් ස්‍රාවය වන්නේ ග්‍රහණියෙන් ය.
(C) පැරතමෝන් හෝර්මෝනය රුධිර කැල්සියම් මට්ටම අඩු කරයි.
(D) ග්ලූකගන් අක්මාව මත ක්‍රියා කරයි.
(E) තයිමොසින් T - වසා සෛල විකසනය සඳහා උපකාරී වේ. (2005)

(19) පහත සඳහන් හෝර්මෝන අතුරෙන් හයිපොතැලමස මඟින් නිපදවනු නොලබන්නේ කවරක් ද?

1. ඔක්සිටොසීන් 2. ප්‍රොලැක්ටින් නිශේධන හෝර්මෝනය 3. GnRH
3. ADH 5. වර්ධක හෝර්මෝනය (2006)

(20) පහත සඳහන් ප්‍රකාශ අතරින් මිනිසාගේ හෝර්මෝන පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද?/ කුමන ඒවා ද?

(A) GnRH යනු පෝෂී හෝර්මෝනයකි.
(B) ප්‍රොලැක්ටින් ස්‍රාවය වීම උත්තේජනය කිරීමත් නිශේධනය කිරීමත් හයිපොතැලමස මඟින් සිදුවේ
(C) කැල්සිටොනින් රුධිරයේ කැල්සියම් මට්ටම වැඩි කරයි.
(D) ඇල්ඩොස්ටරෝන් වෘක්කාණු මත ක්‍රියා කරයි.
(E) FSH ටෙස්ටොස්ටෙරොන් නිපදවීම උත්තේජනය කරයි. (2006)

(21) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිසාගේ කෝටිසෝල් හෝර්මෝන පිළිබඳ ව වැරදි වන්නේ කුමක් ද?

1. එය අධිවෘක්ක බාහිකයෙන් ස්‍රාවය කරනු ලබයි.
2. එය රුධිර ග්ලූකෝස් මට්ටම අඩු කරයි
3. එය ප්‍රෝටීන බිඳ හෙලීම උත්තේජනය කරයි.
4. එය ආතතිය දරා ගැනීමට උපකාරී වේ.
5. එය ස්‍රාවය කිරීම CRH හා ACTH යන දෙක මඟින් යාමනය කළ හැකි ය. (2008)

(22) මිනිසාගේ ADH පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. එය සංස්ලේෂණය වන්නේ අපර පිටියුටරියේ ය.
2. එය පෝෂී හෝර්මෝනයකි
3. එය වෘක්කයේ අවිදූර සංවලිත නාලිකාවල දී හා සංග්‍රාහක ප්‍රණාලවල දී ජල ප්‍රතිපෝෂණය පහසු කරයි.
4. එයට රුධිර පීඩනය වැඩි කළ හැකි යි
5. ජලයට ඇති පාරගම්‍යතාව වැඩි කරජල ප්‍රතිශෝෂණය නිශේධනය කරයි. (2009)

(23) මිනිසාගේ පහත සඳහන් හෝර්මෝන අතුරෙන් වෘක්කය මත ක්‍රියා කරනුයේ කුමක්ද?/කුමන ඒවා ද?
(A) ADH (B) ඇල්ඩොස්ටෙරෝන් (C) ඇඩ්රිනලීන්
(D) වර්ධක හෝමෝනය (E) එරිත්‍රොපොයිටීස් (2010)

(24) වෘක්කයේ ක්‍රියාකාරිත්වය යාමනය කිරීම සඳහා දායක වන හෝර්මෝන ස්‍රාවය කරනුයේ මිනිසාගේ පහත දැක්වෙන කුමන අන්තරාසර්ග ග්‍රන්ථි ද?
(A) හයිපොතැලමස, අධිවෘක්ක මජ්ජාව, අපර පිටියුටරිය
(B) අපර පිටියුටරිය, අධිවෘක්ක බාහිකය, තයිමස
(C) පූර්ව පිටියුටරිය, හයිපොතැලමස, අපර පිටියුටරිය
(D) හයිපොතැලමස, පැරාතයිරොයිඩ, අධිවෘක්ක බාහිකය
(E) හයිපොතැලමස, තයිරොයිඩය, අග්න්‍යාශය (2011)

(25) පහත සඳහන් හෝර්මෝන අතුරෙන් ආතති තත්ත්වයක් සමඟ අවම සම්බන්ධතාවක් දැක්වීමට ඉඩ ඇත්තේ කුමන හෝර්මෝනය ද?
1. ACTH 2. කෝටිසෝල් 3. තයිරොක්සීන්
4. ඇල්ඩොස්ටෙරෝන් 5. නොර්ඇඩ්‍රිනලීන් (2012

(26) අස්ථි මත ක්‍රියා කරනුයේ මිනිසාගේ පහත සඳහන් කුමන හෝර්මෝනය ද?/හෝර්මෝන ද?
(A) වර්ධක හෝමෝනය (B) එරිත්‍රොපොයිටින් (C) පැරාතෝමෝන්
(D) තයිරොක්සින් (E) ඇඩ්රිනලින් (2012)

(27) මිනිසාගේ ප්‍රජනනය හා සම්බන්ධ හෝර්මෝන කිහිපයක් ඒවා ස්‍රාවය වන ස්ථාන හා ඒවායේ කෘත්‍යයන් පහත දී ඇත.

හෝර්මෝනය	ස්‍රාවය වන ස්ථානය	කෘත්‍යය
I - ප්‍රොජෙස්ටරෝන්	I - ඩිම්බ කෝෂය	a - ටෙස්ටොස්ටෙරොන් ස්‍රාවය වීම උත්තේජනය කිරීම
II - LH	ii - හයිපොතැලමස	b - පියයුරු විශාල වීම
III - GnRH	iii - පීත දේහය	c - ඔසප් වීම උත්තේජනය කිරීම
IV - ඊස්ට්‍රජන්	iv - පූර්ව පිටියුටරිය	d - ඉන්හිබින් ස්‍රාවය වීම උත්තේජනය කිරීම

හෝර්මෝනය, එය නිපදවන ස්ථානය හා එහි කෘත්‍යය නිවැරදිව දැක්වෙනුයේ පහත සඳහන් ඒවායින් කුමක් මඟින් ද?
1. III, ii, d 2. II, ii, d 3. I, iii, b 4. IV, iv, a 5. II, iv, a (2012)

(28) මානව හෝර්මෝන පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) එරිත්‍රොපොයිටින් ක්‍රියා කරනුයේ අස්ථි තුළ පමණි.
(B) කිරි නිකුත් කිරීමේදී ප්‍රොලැක්ටින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
(C) ග්ලූකගන් සහ කෝටිසෝල් යන දෙවර්ගයම රුධිර ග්ලූකෝස් මට්ටම වැඩි කරයි.
(D) ADH සහ ඇල්ඩොස්ටෙරෝන් යන දෙවර්ගයටම වෘක්කානු තුළදී ජලය ප්‍රතිශෝෂණය වෙනස් කිරීමට පුළුවන.
(E) පැරාතයිරොයිඩ් හෝර්මෝනය රුධිර කැල්සියම් මට්ටම අඩු කරයි. (2014)

(29) මිනිසාගේ අන්තරාසර්ග ග්‍රන්ථි කීපයක් සහ දේහය තුළ ඒවා පිහිටන ස්ථාන පහත දැක්වේ. එම සංකලන අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. හයිපොතැලමස - මධ්‍ය මස්තිෂ්කයේ පූර්ව ප්‍රදේශයේ
2. පිටියුටරිය - කැලෝස දේහයට වහාම පහළින්
3. තයිරොයිඩය - ශ්වාසනාලයේ මධ්‍ය ප්‍රදේශයේ
4. තයිමස - හෘදයට වහාම ඉහළින්
5. පැරාතයිරොයිඩය - තයිරොයිඩයේ පූර්ව පෘෂ්ඨයේ (2015)

(30) මානව වර්ධක හෝර්මෝනය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. එය සංශ්ලේෂණය කර නිදහස් කරනු ලබන්නේ පූර්ව පිටියුටරිය මඟිනි.
2. හයිපොතැලමස මගින් එය නිදහස් කිරීම වැඩි කිරීමට හෝ අඩු කිරීමට පුළුවන.
3. එය රුධිර ග්ලූකෝස් මට්ටම වැඩි කරයි
4. එය මේද සංශ්ලේෂණය වැඩි කරයි.
5. එය අක්මාවේ පරිවෘත්තීය යාමනය කරයි. (2016)

(31) මිනිස් කැල්සිටෝනින් හෝර්මෝනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. කැල්සියම් බහිස්‍රාවය අඩු කරයි
2. එය රුධිර කැල්සියම් මට්ටම අඩු කරයි.
3. එය අස්ථි තුළ කැල්සියම් ගබඩා කිරීම වැඩි කරයි.
4. එය වෘක්කාණුව තුළ දී කැල්සියම් ප්‍රතිශෝෂණය කිරීම නිෂේධනය කරයි.
5. එහි බලපෑම් පැරාතයිරොයිඩ හෝර්මෝනයේ බලපෑම්වලට ප්‍රතිවිරුද්ධය. (2017)

(32) මිනිස් හෝර්මෝන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. කොලිසිස්ටොකයිනින්, අග්න්‍යාශය සහ අක්මාව යන දෙකම මත ක්‍රියා කරයි.
2. B වසා සෛලවල විකසනය කෙරෙහි තයිමස බලපායි.
3. ග්ලූකගන් ස්‍රාවය කරනු ලබන්නේ ලැන්ගර්හැන් දිපිකාවල β සෛල මගිනි.
4. වෘක්කාණුවේ දී Na^+ සහ K^+ ප්‍රතිශෝෂණය වීම ඇල්ඩොස්ටෙරොන් මගින් උත්තේජනය වේ.
5. වෘක්ක නාලිකාවල විදුර සංවලිත නාලිකාව සහ සංග්‍රාහක ප්‍රණාලය මත ADH ක්‍රියා කරයි. (2017)

(33) මානව හෝර්මෝන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. ඉන්සියුලින් ස්‍රාවය වන්නේ ලැන්ගර්හැන් දීපිකාවල α සෛල මගිනි.
2. අධිවෘක්ක බාහිකයෙන් ස්‍රාවය කරනු ලබන ප්‍රධාන ග්ලූකොකෝර්ටිකොයිඩය ඇල්ඩොස්ටෙරොන් ය.
3. පැරාතයිරොයිඩ හෝර්මෝනය රුධිර කැල්සියම් මට්ටම අඩු කරයි.
4. තයිරොක්සින් දේහයේ තාප නිෂ්පාදනය වැඩි කරයි
5. ඉන්හිබින්, FSH ස්‍රාවය වීම උත්තේජනය කරයි. (2018)

(34) හෝර්මෝනය සහ එහි ප්‍රධාන කෘත්‍යය නිවැරදි ලෙස ගළපා ඇත්තේ පහත සඳහන් කුමන ප්‍රතිචාරයේ ද?
1. මෙලටොනින් - ජෛවීය රිද්ම යාමනය කිරීම
2. තයිමොසින් - සහජ ප්‍රතිශක්තිය යාමනය කිරීම
3. ඇඩ්රිනලින් - පරිවෘත්තීය වේගය අඩු කිරීම
4. ඔක්සිටොසින් - කිරි නිපදවීම උත්තේජනය කිරීම
5. පැරාතයිරොයිඩ හෝර්මෝනය - රුධිරයේ කැල්සියම් මට්ටම අඩු කිරීම (2019)

නිපුණතාව 5.7.2 : දේහ අභ්‍යන්තර පරිසරය නියතව පවත්වා ගැනීම

(01) අක්මාවේ පහත සඳහන් කෘත්‍යයන් අතුරින් සමස්ථිතික කෘත්‍යයක් නොවන්නේ කුමක්ද?
1. ග්ලයිකොජන් ගබඩා කිරීම.
2. ග්ලයිකොජන් ග්ලූකෝස් බවට පරිවර්තනය කිරීම.
3. කාබෝහයිඩ්‍රේට් මේද බවට පරිවර්තනය කිරීම.
4. යූරියා නිෂ්පාදනය 5. විටමින් K නිෂ්පාදනය (1987 Z)

(02) කෙනෙකු උණුසුම් පරිසරයක සිට ශීත පරිසරයකට ගිය විට,
1. මූත්‍ර පිට කිරීම අඩු වේ.
2. චර්මයෙහි රුධිර වාහිනී සංකුචනය වේ.
3. ස්නායු ආවේග සන්නයනය කිරීමේ වේගය අඩු වේ.
4. අක්‍රියතා පරිවෘත්තීය වේගය අඩු වේ.
5. චර්මයෙහි රෝම පහත් කෙරේ. (1988 Z)

(03) පහත සඳහන් වගන්ති අතුරින් මිනිස් අක්මාව පිළිබඳව අසත්‍ය වගන්තිය වන්නේ කුමන වගන්තිය ද?
1. එය දේහයෙහි දෙවනුවට විශාලම ඉන්ද්‍රියයි.
2. යූරියා නිපදවන්නේ ප්‍රධාන වශයෙන් අක්මාව තුළ ය.
3. කුෆර් සෛල, හානි වූ රතු රුධිරාණු රුධිරයෙන් ඉවත් කරයි.
4. අක්මාවෙන් ජීරණ කෘත්‍යයක් ඉටු නොකරයි.
5. සමහර විටමින් වර්ග අක්මාවෙහි ගබඩා කරනු ලැබේ. (1991 Z)

(04) මිනිස් දේහය තුළ විෂ සහිත ඖෂධවල විෂහරණය කරනුයේ ප්‍රධාන වශයෙන්,
1. ප්ලීහාව තුළ ය. 2. තයිරොයිඩය තුළ ය. 3. අක්මාව තුළ ය.
4. ආමාශය තුළ ය. 5. අග්න්‍යාශය තුළ ය. (1993 Z)

(05) මිනිස් අක්මාව
1. දේහයේ විශාලම අවයවය වේ. 2. ඛණ්ඩිකා පහකින් සමන්විත වේ.
3. යූරියා සංස්ලේෂණය කරයි. 4. අන්තරාසර්ග ග්‍රන්ථියක් ලෙස ක්‍රියා කරයි.
5. ලයිපේස් ස්‍රාවය කරයි. (1994 Z)

(06) වැඩිහිටි මිනිසෙකුගේ අක්මාවෙහි සිදු නොවන්නේ,
1. විටමින් A සංස්ලේෂණය 2. ඇමයිනෝ අම්ල ඇමයින්හරණය ය.
3. ග්ලයිකෝජන් සංචිත කිරිම ය. 4. රක්තාණු නිපදවීම ය.
5. හානිකර ද්‍රව්‍ය විෂහරණය ය. (1997 Z)

(07) මිනිසාගේ දේහ උෂ්ණත්වය යාමනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ කුමක් ද?
1. පරිසර උෂ්ණත්වය අඩුවීම නිසා අනුමස්තිෂ්කයේ පිහිටා ඇති තාප යාමන මධ්‍යස්ථානය උත්තේජනය වේ.
2. දේහ උෂ්ණත්වය වැඩිවීම නිසා පරිවෘත්තීය වේගය වැඩි කරන හෝර්මෝන ස්‍රාවය වීම නිශේධනය වේ.
3. පරිසර උෂ්ණත්වය වැඩිවීම නිසා සමේ රෝග උද්ගාමක පේශී සංකෝචනය වේ.
4. දේහ උෂ්ණත්වය අඩුවීම නිසා අධික ලෙස දහදිය නිපද වේ.
5. පරිසර උෂ්ණත්වය අඩුවීම නිසා සමේ මතුපිටට ආසන්න රුධිර වාහිනී විස්තාරණය වේ. (2000)

(08) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් මිනිසාගේ අක්මාව පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද?
1. එය දේහයේ ඇති විශාල ම අවයවයයි.
2. එය ප්‍රධාන වශයෙන් ම උදර කුහරයේ ඉහළ වම් කෙළවරේ පිහිටයි.
3. එය හිමොග්ලොබින් සංස්ලේෂණය කරයි.
4. එය ආහාර ජීර්ණයේ දී යම් කාර්යභාරයක් ඉටු කරයි
5. එය උෂ්ණත්වය යාමනය සඳහා සහභාගී නොවේ. (2001)

(09) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් වැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
1. රුධිර ග්ලූකෝස් මට්ටම 70 - 110mg/100ml වේ.
2. අවිදූර සංවලිත නාලිකාවේ දී අනිවාර්ය ජල ප්‍රතිශෝෂණය සිදු වේ.
3. හෙන්ලේ පුඩුවේ අවරෝහණ බාහුවේ දී Na^+ වල සක්‍රිය ප්‍රතිශෝෂණය සිදු වේ.
4. අවිදූර සංවලිත නාලිකාවේ දී Cl^- ප්‍රතිශෝෂණය වේ.
5. හයිපොතැලමසේ ආස්‍රැති ප්‍රතිග්‍රාහක ඇත. (2003)

(10) පහත සඳහන් ඒවා අතුරෙන් මිනිසාගේ රුධිර ග්ලූකෝස් මට්ටම යාමනය කිරීම සඳහා දායක නොවන්නේ කුමක් ද?
1. ආන්ත්‍රික අංගුලිකා 2. කංකාල පේශි 3. ලැන්ගර්හැන් දීපිකා
4. පිටියුටරිය 5. වෘක්කාණු (2004)

(11) මිනිසාගේ අභ්‍යන්තර පරිසරයෙහි සමස්ථිතිකව යාමනය නොවන්නේ පහත සඳහන් කුමක් ද?
1. ග්ලූකෝස් 2. උෂ්ණත්වය 3. යූරියා
4. කාබන්ඩයොක්සයිඩ් 5. ජලය (2005)

(12) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් අක්මාව පිළිබඳ ව වැරදි වන්නේ කුමක් ද?
1. මහා භක්ෂාණු සහිතයි.
2. එය දේහයේ ප්‍රධාන ම සංචායක මධ්‍යස්ථානය යි.
3. ට්‍රාන්ස් ඇමයිනීකරණය සිදු කරයි.
4. එය උෂ්ණත්ව යාමනය සඳහා දායක වේ.
5. මේද ද්‍රාවී විටමින පමණක් සංචිත කරයි. (2006)

(13) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිසාගේ අවලතාපිතාව පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
1. එය සෘණ ප්‍රතිපෝෂී යාන්ත්‍රණ මගින් යාමනය කරයි.
2. අවලතාපිතාව සඳහා හයිපොතැලමස අත්‍යවශ්‍ය ය.
3. උෂ්ණත්වය වැඩි වීම ක්‍රවුස් බල්බ මගින් සංවේදනය කෙරෙයි.
4. තාප හානිය අඩු කිරීම සඳහා රෝම උද්ගමනය ප්‍රධාන කාර්යයක් ඉටු කරයි.
5. අවලතාපතාව ඇති කරගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ම අනිච්ඡානුග යාන්ත්‍රණ මගිනි. (2008)

(14) මිනිසාගේ රුධිර ග්ලූකෝස් මට්ටම යාමනය පිළිබඳ නිවැරදි වන්නේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක් ද?/කවර ඒවා ද?
1. නිරාහාර රුධිර ග්ලූකෝස් මට්ටම 70 - 110 mg/100ml වේ.
2. රුධිර ග්ලූකෝස් මට්ටම සෘණ ප්‍රතිපෝෂී යන්ත්‍රණ මගින් යාමනය වේ.
3. රුධිර ග්ලූකෝස් මට්ටම ඉහළ යාම මගින් ඉන්සියුලින් ස්‍රාවය වීම නිශේධනය කෙරේ.
4. ග්ලූකගන් මගින් ග්ලයිකෝජන්, ග්ලූකෝස් බවට පත් වීම උත්තේජනය කෙරේ.
5. වෘක්කයේ විදූර සංවලිත නාලිකාව ග්ලූකෝස් සමස්ථිතිය කෙරෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. (2009)

(15) මිනිසාගේ සමස්ථිතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. සමස්ථිතිය යනු නියත අභ්‍යන්තර පරිසරයක් පවත්වා ගැනීමයි.
2. එය සෘණ ප්‍රතිපෝෂී යන්ත්‍රණ හරහා සිදු වේ.
3. රුධිර යූරියා මට්ටම සමස්ථිතික ලෙස යාමනය වේ.
4. සමස්ථිතියේදී අක්මාව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
5. සමස්ථිතික යන්ත්‍රණ ප්‍රධාන වශයෙන් අනිච්ඡානුග ය. (2013)

(16) නිරෝගී වැඩිහිටි සාමාන්‍ය පුද්ගලයකුගේ රුධිර ග්ලූකෝස් මට්ටම කෙරෙහි බලපාන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?/කුමන ඒවා ද?
(A) තයිරොයිඩ ග්‍රන්ථිය (B) හයිපොතැලමස (C) පැරාතයිරොයිඩ ග්‍රන්ථිය
(D) ග්ලූකගන් (E) ඇල්ඩොස්ටෙරෝන් (2017)

නිපුණතාව 5.8.0 : ජීවීන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය
නිපුණතාව 5.8.1 : විවිධ ප්‍රජනක රටා

- අලිංගික ප්‍රජනන ක්‍රම කීපයක් පහත දී ඇත.
  1. ඛණ්ඩනය 2. අංකුරනය 3. කඩ කඩ වීම
  4. බීජාණු නිපදවීම 5. බල්බිල සෑදීම

(01) බොහෝ බැක්ටීරියාවල සාමාන්‍යයෙන් දක්නට ලැබිය හැක්කේ කවර ක්‍රමය ද? (1987 B)

(02) සයනොබැක්ටීරියා වල දකිය හැක්කේ මෙයින් කවර ක්‍රමය ද? (1987 B)

(03) සතුන්ට ලිංගික ප්‍රජනනයෙහි ඇති ප්‍රධාන වාසිය නම්,
1. විශේෂයක ප්‍රභේදනය වැඩි වීම ය.
2. විශේෂයක සාමාජිකයන් එකිනෙකා අතර ආකර්ශණය ඇති කිරීම ය.
3. මව්පිය රැකවරණය ඇතිවීමට අවස්ථා සැලසීම ය.
4. විශේෂයෙහි ප්‍රවර්තනය එය මගින් තහවුරු කිරීම ය.
5. එය අලිංගික ප්‍රජනනයට වඩා ඵලදායී වීම ය. (1987 Z)

(04) ශාකවල හා සතුන්ගේ ලිංගික ප්‍රජනනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වනුයේ,
1. එමගින් දෙමව්පියන්ට සර්වසම ජනිතයන් ඇතිවිය හැකි ය.
2. ඌනන විභාජනය එහි අත්‍යවශ්‍ය ලක්ෂණයකි.
3. එය ජනිතයන් අතර ප්‍රභේදන ඇති කිරීමට දායක වේ.
4. එමගින් අනුවර්තන සඳහා වැඩි අවස්ථාවක් සැලසේ.
5. එහිදී ප්‍රජනන ඒකකවල සංයෝජනයක් සිදු වේ. (2000)

(05) ස්වභාවයේ දී පාතෙනොභවනය සිදු වනුයේ,
1. පක්ෂීන් ඇතිවීමේ දී 2. දොඩම් වල ය.
3. ද්විගුණ ඩිම්බයක් ඇති කිරීමේ දී
4. අසම්පූර්ණ ජීවීන් ඇති කිරීමේ දී
5. මී මැසි ගහණයක ගැහැණු මැස්සන් ඇති කිරීමේ දී (2002)

(06) පහත දක්වෙන ඒවා අතරින් කවරක් ප්‍රජනන ක්‍රමයක් සේ සැලකිය නොහැකි ද?
1. බැක්ටීරියාවල ද්විඛණ්ඩනය 2. යීස්ට්වල අංකුරණය
3. Spirogyra වල කඩ කඩ වීම 4. බැක්ටීරියාවල අන්තස්පෝර සෑදීම
5. Nephrolepis වල බීජාණු සෑදීම (2005)

(07) පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. නිඩාරියා පුනර්ජනනය පෙන්වයි. 2. Hydra අංකුරණය පෙන්වයි.
3. මත්සයන් පාතෙනොභවනය පෙන්වයි. 4. ඇනලිඩා අංකුරණය පෙන්වයි.
5. අලිංගික ප්‍රජනනය අනූනනය මත රඳයි. (2006)

(08) වැරදි ප්‍රකාශය තෝරන්න.
අලිංගික ප්‍රජනන ක්‍රම සමග සන්සන්දනය කරන විට ලිංගික ප්‍රජනනයේ වාසියක් වන්නේ,
1. එය අලිංගික ප්‍රජනනයට වඩා සීඝ්‍ර ව සිදුවීමයි.
2. එය ගහන තුළ ප්‍රවේණික විවිධත්වය වැඩි කිරීමයි.
3. එමගින් ගහනවලින් හානිකර විකෘති ඉවත් කිරීමට මගක් සෑදීමයි.
4. එය ජීවී විශේෂ නව පරිසර නිකේතනවලට ව්‍යාප්ත වීමට උදවු කිරීමයි.
5. එමගින් පරිණාමය ඉක්මන් ක්‍රියාවලියක් කිරීමයි. (2008)

(09) ද්විලිංගිකතාව, ඒකලිංගිකතාව සහ පාතෙනොභවයට පිළිවෙලින් නිදසුන් වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
1. මදුරුවා, ඉස්සා සහ Cycas
2. ගැඩවිලා, බළලා සහ මීමැස්සා
3. Hibiscus, බල්ලා සහ Cycas
4. මුහුදු ඉකිරියා, වවුලා සහ මීමැස්සා
5. පත්තෑයා, Cycas සහ තල්මසා (2011)

(11) කෞමාරෝද්භවය,
(A) සංසේචනය නොවූ ඩිම්බයකින් සම්පූර්ණ ජීවියෙකු නිපදවයි.
(B) ගැහැණු මීමැස්සන් නිපදවයි.
(C) සමහර කටුස්සන්ගේ දැකිය හැක.
(D) ද්විගුණ ජනිතයන් පමණක් නිපදවයි.
(E) සියලුම අපෘෂ්ඨවංශීන්ගේ දැකිය හැක. (2019)

නිපුණතාව 5.8.2 : පුරුෂ ප්‍රජනක පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) මිනිස් ශුක්‍රාණු පිළිබඳ පහත දැක්වෙන කුමන ප්‍රකාශය සත්‍ය ද?
1. ශුක්‍රාණුවක වර්ණදේහ යුගල් විසිතුනක් අඩංගු වේ.
2. ඒයා ශුක්‍ර ආශයිකා තුළ ගබඩා කෙරේ.
3. ඒවා ශරීරයේ ඇති එකම චාලක සෛල වේ.
4. ලේඩිග් සෛල ආශ්‍රයෙන් විකසනය වේ.
5. එවායේ මයිටකොන්ඩ්‍රියා රාශියක් අඩංගු වේ. (1986 Z)

(02) මිනිස් ශුක්‍රාණු දෛහික සෛලවලින් වෙනස් වන්නේ,
1. චලනය විය හැකි බැවිනි.
2. ඒකගුණ බැවිනි.
3. මයිටකොන්ඩ්‍රියා රාශියක් දරන බැවිනි.
4. විභාජනය වීමට නොහැකි බැවිනී
5. කෙළින්ම රුධිරයෙන් පොෂණය නොවන බැවිනි. (1994 Z)

(03) පහත සඳහන් වගන්ති අතුරෙන් මිනිස් ශුක්‍රාණුව පිළිබඳව අසත්‍ය වනුයේ කුමක් ද?
1. එය තනි ලයිසසෝමයක් දරයි
2. එහි මයිටකොන්ඩ්‍රියා කීපයක් ඇත.
3. එහි න්‍යෂ්ටියෙහි අලිංග වර්ණදේහ 23 ක් ඇත.
4. ස්ත්‍රියකගේ ප්‍රජනක පද්ධතිය තුළ එහි සරු කාලය දින තුනක් පමණ වේ.
5. ටෙස්ටොස්ටෙරොන් මගින් එහි සෑදීම යාමනය කරයි. (1999 Z)

(04) මිනිසාගේ,
(A) ශුක්‍රාණු ජනනය ආරම්භ වන්නේ භ්‍රෑණ අවස්ථාවේ දී ය.
(B) ශුක්‍ර ආශයිකා තුළ ශුක්‍රාණු තැන්පත් කරනු ලැබේ.
(C) ශුක්‍රාණු පරිණත වනුයේ අපිවෘෂණයෙහි ය.
(D) ස'ටොලි සෛල පිහිටනුයේ ශුක්‍රධර නාලිකා බිත්තියේ ය.
(E) ශුක්‍ර නාල ශුක්‍ර තරලය ස්‍රාවය කරයි. (2001)

(05) මිනිසාගේ ශුක්‍රාණු පරිණත වනුයේ,
1. ශුක්‍රධර නාලිකා තුළ දීය.
2. අපිවෘෂණ තුළ දීය.
3. ශුක්‍රනාල තුළ දීය.
4. විසර්ජන ප්‍රණාලය තුළ දීය.
5. ශුක්‍ර ආශයිකා තුළ දීය. (2008)

(06) මිනිසාගේ වෘෂණයේ හරස්කඩක් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. එහි ශුක්‍රධර නාලිකා කීපයක් දැකිය හැකි ය.
2. ශුක්‍රාණු මාතෘ සෛල දක්නට ලැබෙනුයේ ශුක්‍රධර නාලිකාවක පර්යන්තයේ ය.
3. සර්ටොලි සෛලවලට සම්බන්ධවූ ප්‍රාක්ශුක්‍ර දැකිය හැකි ය.
4. ජනක අපිච්ඡද තුළ විසිරුණු ලේඩිග් සෛල දැකිය හැකි ය.
5. ශුක්‍රාණු දැකිය හැක්කේ ශුක්‍රධර නාලිකාවල මධ්‍යයේ ය. (2009)

(07) ලේඩිග් සෛල,
1. ශුක්‍රධර නාලිකාවල ජනක අපිච්ඡදයේ පිහිටයි.
2. ශුක්‍රාණු ජනනයේ දී ප්‍රාක් ශුක්‍රාණුවල වැඩිපුර සෛල ප්ලාස්මය ඉවත් කිරීමට උපකාරී වේ.
3. විකසනය වන ශුක්‍රාණුවලට පෝෂණය සපයයි.
4. ඉන්හිබින් ස්‍රාවය කරයි.
5. ටෙස්ටොස්ටෙරොන් ස්‍රාවය කරයි. (2010)

(08) මිනිසාගේ ශුක්‍ර තරලය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
1. ස්ථානීය යාමක දරයි.
2. එහි ඇස්කෝබික් අම්ලය ඇත.
3. එහි 60% ක් පමණ ස්‍රාවය වනුයේ ශුක්‍ර ආශයිකාවලිනි.
4. ශුක්‍රාණුවල චලනය සඳහා අවශ්‍ය සංඝටක දරයි.
5. පුරස්ථ ග්‍රන්ථි යුගල ප්‍රතිකැටිකාරක එන්සයිම නිපදවයි. (2011)

(09) පුරුෂ ප්‍රජනක පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?
1. ඉන්හිබින් LH ස්‍රාවය වීම නිශේධනය කරයි.
2. ශුක්‍රාණු ගබඩා කරනු ලබන ප්‍රධාන ස්ථානය ශුක්‍ර නාලයයි.
3. ශුක්‍රාණු අධිසක්‍රියකරණය වනුයේ අපිවෘෂණයේදී ය.
4. ශුක්‍ර තරලයේ වැඩි ප්‍රමාණයක් නිපදවනුයේ පුරස්ථ ග්‍රන්ථිය මගිනි.
5. ශුක්‍ර ආශයිකා ස්‍රාවය ප්‍රොස්ටග්ලැන්ඩින්වල පොහොසත් ප්‍රභවයකි. (2013)

(10) මිනිසාගේ ශුක්‍රාණුජනනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?

(A) එය ආරම්භ වූ පසු සන්තතිකව සිදුවන ක්‍රියාවලියකි.
(B) ශුක්‍රාණුවක ජීවිත කාලය පැය 72 කි.
(C) එය ප්‍රශස්ත ලෙස සිදුවනුයේ දේහ උෂ්ණත්වයේ දීය.
(D) ශුක්‍රාණුමාතෘ සෛල ප්‍රාථමික ශුක්‍රාණු සෛල බවට පත්වන විට ඌනනය සිදු වේ.
(E) ශුක්‍රාණුවල පෝෂණය උත්තේජනය කරයි. (2014)

(11) මිනිසාගේ ශුක්‍රාණු ඩිම්බයක් සංසේචනය කිරීමේ හැකියාව ලබා ගනුයේ පහත සඳහන් කුමන ව්‍යුහය තුළදී ද?

1. ශුක්‍ර ආශයිකාව 2. යෝනි මාර්ගය 3. මුත්‍ර මාර්ගය
4. ශුක්‍ර නාලය 5. අපිවෘෂණය (2015)

(12) විසර්ජනයෙන් පසු මිනිස් ශුක්‍රාණුවක උපරිම ආයු කාලය

1. පැය 12 කි. 2. පැය 24 කි. 3. පැය 48 කී
4. පැය 72 කි. 5. පැය 96 (2015)

(13) පුරුෂයන්ගේ ප්‍රජනනය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.

1. ටෙස්ටොස්ටෙරොන් ප්‍රජනක පද්ධතියේ සියලු කොටස් මත ක්‍රියා කරයි.
2. ශුක්‍ර ආශයිකා ස්‍රාවයෙහි ග්ලූකෝස් සහ විටමින් C ඇත.
3. ශුක්‍රාණු අධිසක්‍රිය වීම ස්ත්‍රී ප්‍රජනක මාර්ගය තුළ දී සිදු වේ.
4. ශුක්‍රාණු ජනනය සඳහා දින 72 ක් පමණ ගත වේ.
5. ස'ටොලි සෛලය අන්තරාසර්ග ව්‍යුහයක් ලෙස ක්‍රියා කරයි. (2016)

(14) පහත දැක්වෙන ප්‍රජනක ව්‍යුහ අතුරෙන් යුගලමය නොවන්නේ කුමක් ද?

1. ශුක්‍ර ආශයිකාව 2. කූපර් ග්‍රන්ථිය 3. විසර්ජක ප්‍රණාලය
4. පුරඃස්ථ ග්‍රන්ථිය 5. ශුක්‍ර නාලය (2016)

(15) මිනිස් අපිවෘෂණය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.

1. එය අතිශයින් දඟර ගැසුණු නලයකි.
2. එය වෘෂණයට පෙර ශුක්‍රාණු ගබඩා කරයි.
3. එය විසර්ජනයට පෙර ශුක්‍රාණු ගබඩා කරයි.
4. එය තුළ දී ශුක්‍රාණු සංසේචන හැකියාව ලබා ගනී.
5. ශුක්‍රාණුවල අධිසක්‍රියකරණය සිදු වන්නේ එය තුළ දීය. (2017)

(16) මිනිසුන්ගේ ඉන්හිබින් ස්‍රාවය කරනු ලබන්නේ,

1. පුරස්ථ ග්‍රන්ථි මගිනි. 2. අපිවෘෂණය මගිනි.
3. ශුක්‍ර ආශයිකා මගිනි. 4. වෘෂණ මගිනි.
5. කූපර් ග්‍රන්ථ මගිනි. (2018)

(17) මිනිසාගේ ශුක්‍රාණුජනනයේ දී ද්විගුණ සිට ඒකගුණ දක්වා වර්ණදේහ සංඛ්‍යාව අඩු වන්නේ,

1. ප්‍රාක්ශුක්‍ර වලින් ශුක්‍රාණු නිපදවීමේ දී ය.
2. ද්විතීයික ශුක්‍රාණු සෛල වලින් ප්‍රාක්ශුක්‍ර සෛල නිපදවීමේ දී ය.
3. ප්‍රාථමික ශුක්‍රාණු සෛල වලින් ද්විතීයික ශුක්‍රාණු සෛල නිපදවීමේ දී ය.
4. මූලික ජන්මාණු සෛල වලින් ශුක්‍රාණුමාතෘ සෛල නිපදවීමේ දී ය.
5. ශුක්‍රාණුමාතෘ සෛල වලින් ප්‍රාථමික ශුක්‍රාණු සෛල නිපදවීමේ දී ය. (2019)

නිපුණතාව 5.8.3 : ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) මිනිසාගේ පීත දේහය,

1. හොඳ රුධිර සැපයුමකින් යුක්ත නොවේ.
2. පිටියුටරියේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑමක් නොදක්වයි.
3. කිරි සංස්ලේෂණයේ කාර්යයක් ඉටු කරයි.
4. සංසේචනය සිදු නොවූ විට වැඩි කාලයක් නොපවතී.
5. ජනක අපිච්ඡදයෙන් විකසනය වේ. (1988 Z)

(02) මිනිස් කලල බන්ධනය පිළිබඳ පහත සඳහන් වගන්ති අතරින් වැරදි වනුයේ කුමක් ද?

1. එය භ්‍රෑණයේ රුධිරය හා මවගේ රුධිරය මිශ්‍ර වීමට ඉඩ සලසයි.
2. එය හෝර්මෝන ස්‍රාවය කරයි.
3. එය භ්‍රෑණයට ශ්වසන අවයවයක් ලෙස ක්‍රියා කරයි.
4. එය භ්‍රෑණයට පෝෂණය සපයයි.
5. එය භ්‍රෑණයේ බහිස්‍රාවී ද්‍රව්‍ය ඉවත් කිරීමට උපකාරී වේ. (1994 Z)

(03) පහත සඳහන් ඒවා අතරෙන් සාමාන්‍ය මිනිස් කලල බන්ධයක් හරහා පරිවහනය කළ නොහැක්කේ කුමක් ද?

1. AIDS වලට හේතුකාරක වෛරසය 2. මධ්‍යසාරය 3. රක්තාණු
4. ප්‍රතිදේහ 5. යූරියා (1995 Z)

(04) ඩිම්බ මෝචනයේ දී මිනිස් ඩිම්බය,

1. ප්‍රාථමික අණ්ඩ සෛල අවස්ථාවේ ඇති
2. පැහැදිලි න්‍යෂ්ටි පටලයක් දරයි.
3. ආධාරක සෛල විශාල ප්‍රමාණයකින් වටවේ.
4. සෛලීය පෑදි කලාපයක් දරයි. 5. සෛල ප්ලාස්මයක් දරයි (1997 Z)

(05) ස්ත්‍රියකගේ,

1. අණ්ඩ ජනනය ආර්තවභාවය දක්වාම සිදු වේ.
2. ග්‍රාෆිය ස්‍යූනිකාව තුළ, සෛල ස්ථර කිහිපයකින් වට වූ ප්‍රාථමික අණ්ඩ සෛලයක් ඇත.
3. ඩිම්බ කෝෂයේ බාහිරම ස්ථරය පංජරයයි.
4. ඩිම්බය නිපදවනුයේ සංසේචනයේදී ය.
5. ග්‍රාෆිය ස්‍යූනිකාව වර්ධනය වීම ප්‍රොජෙස්ටරෝන් මගින් උත්තේජනය වේ. (2000)

(06) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ස්ත්‍රීන්ගේ ඩිම්බ මෝචනය පිළිබඳ වැරදි වන්නේ කුමක්ද?

1. දින 28 ක ඔසප් චක්‍රයේ 14 වැනි දිනයේදී පමණ සාමාන්‍යයෙන් එය සිදු වේ.
2. එය ප්‍රාථමික අණ්ඩ සෛල ග්‍රාපීය සෘුනිකාවෙන් නිකුත් කිරීමයි.
3. ප්‍රොජෙස්ටරෝන් එය නිශේධනය කරයි.
4. LH එය උත්තේජනය කරයි.
5. ගර්භනී කාලයේදී එය නවතී. (2008)

(07) මිනිසාගේ ක්ෂීරණය හා කිරි පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. කිරි නිපදවීම ඔක්සිටෝසින් මගින් උත්තේජනය වේ.
2. ප්‍රොලැක්ටින් කිරි නිකුත් කිරීම පාලනය කරයි.
3. උපත සිදු වූ විගස කිරි නිකුත් කිරීම ආරම්භ වේ.
4. කිරිවල ඉමියුනොග්ලොබියුලීන් ඇත.
5. කිරිවල ග්ලූකෝස් අධිකය. (2009)

(08) මෙම ප්‍රශ්නය ඩිම්බය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ මත පදනම් වේ.

(A) ඩිම්බ මෝචනය අවස්ථාවේ දී එය ප්‍රථම ඌනන විභාජනයේ අන්තඃකලාවේ පිහිටයි.
(B) ඩිම්බ මෝචනය සිදු වූ විගසම එය ප්‍රථම ධ්‍රැවීය දේහය නිදහස් කරයි.
(C) ඝන සෛල ප්ලාස්මයක් දැකිය හැක.
(D) එය සාමාන්‍යයෙන් සංසේචන වනුයේ පැලෝපීය නාලයේ දී ය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?

1. A හා B පමණි. 2. A, B පමණි. 3. B, D සහ E පමණි.
4. D සහ C පමණි. 5. D පමණි.

.(09) මානව ඩිම්බය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

1. හරස්කඩක එය අණ්ඩාකාර හැඩයක් ගනියි
2. සංචිත ආහාර ඉතා ම සුළු ප්‍රමාණයක් එහි අඩංගු ය.
3. එය ලයිසෝමයක් දරයි
4. එහි ආයු කාලය පැය 12 - 18 ක් පමණ වේ.
5. ශුක්‍රාණුවක් නිවේධනය වූ විගස ම එය ඒකගුණ වේ. (2015)

(10) මානව ගර්භාෂය පිළිබඳ වැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.

(A) එය කුහරමය, පේශිමය, පෙයාර් හැඩැති අවයවයකි.
(B) එහි සංකෝචන හැකියාව ප්‍රොස්ටග්ලැන්ඩීන් මගින් නිශේධනය වේ.
(C) සංසේචනය සාමාන්‍යයේ සිදු වන්නේ එය තුළදී ය.
(D) එහි ඇතුළු ස්තරය හොඳින් වාහිනීමත් වී ඇත.
(E) ගර්භාෂයේ අවිදූර කෙළවර පටු වී ඇත. (2016)

(11) ඔසප් චක්‍රය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. චක්‍රයේ දී ප්‍රොජෙස්ටරෝන් මට්ටම උච්ච වනුයේ ඔසප් වීමට දින 2-3 කට පෙරය.
2. එය ආරම්භ කෙරෙනුයේ පිටියුටරි හෝර්මෝන මගිනි.
3. චක්‍රයේ දී උච්ච FSH මට්ටම, උච්ච LH මට්ටමට වඩා වැඩි වේ.
4. ප්‍රගුණන අවධිය සහ ස්‍රාවී අවධිය එකම දිගින් යුක්තය.
5. ඊස්ට්‍රඩියෝල් සහ ප්‍රොජෙස්ටරෝන් මට්ටම්වල අනවරත අඩුවීම නිසා ඔසප් වීම සිදුවේ. (2017)

(12) මානව පැලෝපීය නාලය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි වන්නේ කුමක්ද?

1. එය විදූර කෙළවරේ පුනීලයක් වැනි විවරයක් සහිත ප්‍රණාලයකි
2. එහි කුහරය පක්ෂ්මධර අපිච්ඡදයකින් ආස්තරණය වේ.
3. එය ඩිම්බය ඩිම්බකෝෂයේ සිට ගර්භාෂය දක්වා ප්‍රචාලනය කරයි.
4. එහි ස්‍රාවයන් ඩිම්බය සහ ශුක්‍රාණු යන දෙකම පෝෂණය කරයි
5. සංසේචනය සාමාන්‍යයෙන් සිදු වන්නේ එහි පහළ 1/3 ප්‍රදේශයේ දී ය (2017)

(13) මානව ගර්භාෂය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?

(A) මයොමෙට්‍රියම් සංකෝචන ඊස්ට්‍රඩියෝල් සහ ප්‍රොජෙස්ටරෝන් යන දෙක ම මගින් උත්තේජනය වේ.
(B) ගර්භාෂයේ ස්‍රාව, භ්‍රෑණය පෝෂණය කරයි.
(C) මයොමෙට්‍රියමේ සංකෝචන ඇති වීම ඊස්ට්‍රඩියෝල් මගින් උත්තේජනය වේ.
(D) ගර්භාෂය තුළ කලලය අධිරෝපණය වීම සංසේචනයෙන් පසු හත්වැනි දිනයේ දී පමණ ආරම්භ වේ.
(E) එන්ඩොමෙට්‍රියම ස්තරීභූත ශල්කමය අපිච්ඡද සෛලවලින් තැනී ඇත. (2018)

(14) මෙම ප්‍රශ්නය පදනම් වී ඇත්තේ පරිණත කාන්තාවන්ගේ සාමාන්‍ය ප්‍රජනක චක්‍රයේ දී පූර්ව පිටියුටරියෙන් සහ ඩිම්බකෝෂයෙන් ස්‍රාවය වන හෝර්මෝන වල රුධිරගත මට්ටම දැක්වෙන පහත දී ඇති රූප සටහන මතය.



A, B, C සහ D වලින් දැක්වෙන හෝර්මෝන පිළිවෙලින්,

1. FSH, LH, ඊස්ට්‍රඩියොල් සහ ප්‍රොජෙස්ටරොන් වේ.
2. LH, ප්‍රොජෙස්ටරොන්, ඊස්ට්‍රඩියොල් සහ FSH වේ.
3. ඊස්ට්‍රඩියොල්, LH, FSH සහ ප්‍රොජෙස්ටරොන් වේ.
4. LH, ඊස්ට්‍රඩියොල්, ප්‍රොජෙස්ටරොන් සහ වේ.
5. FSH, LH, ප්‍රොජෙස්ටරොන් සහ ඊස්ට්‍රඩියොල් වේ. (2019)

නිපුණතාව 5.8.4 : සංසේචනයේ සිට උපත තෙක් ක්‍රියාවලි

(01) මිනිස් ඩිම්බය පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න.
1. එහි බීජාන්න අඩංගු වේ.
2. එහි වර්ණදේහ යුගල් 23 ක් ඇත.
3. ඩිම්බ මෝචනයේ දී එය ද්විතියික අණ්ඩ සෛල අවස්ථාවෙහි ඇත.
4. එහි නිපදවීම ආරම්භ වනුයේ යෞවුනුදාවේදී යි
5. එහි පරිබීජාන්න අවකාශයක් නොමැත. (2005)

(02) සය මසක් වයසැති මිනිස් පිරිමි භ්‍රෑණයක දැකිය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
(A) හෘද ස්පන්නය
(B) මානව ලක්ෂණ
(C) 30cm පමණ වීම
(D) භ්‍රෑණ චලන අඩුවීම
(E) 4kg වීම (2011)

(03) සංසේචනය හා මානව යුක්තානුව ඇතිවීම සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,
(A) සංසේචනයේ දී ප්‍රාක් න්‍යෂ්ටි හා වී ද්විගුණ යුක්තානු සාදයි.
(B) සංසේචනයට ලක්වන්නේ ඌනනය යෝග කලාව II හි පවතින ඩිම්බයකි.
(C) සංසේචනයෙන් දින 4කට පසු මොරුලාවා ද දින 5කට පසුව බ්ලාස්ටකෝෂ්ඨය ඇත.
(D) hCG මගින් පෝෂබ්ලාස්ටය බිඳ වැටීම වලක්වයි.
(E) පෝෂ බ්ලාස්ට කලල බන්ධය සෑදීමට දායක වේ (2012)

(04) දරු ප්‍රසූතිය පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. එය සාමාන්‍යයෙන් සංසේචනයෙන් සති 38 කට පසු සිදු වේ.
2. එය මයෝමෙට්‍රියමේ සිනිඳු පේශිවල ප්‍රබල රිද්මාකාර සංකෝචන සංශ්‍රේණියක් නිසා සිදු වේ.
3. ස්ථානීය යාමක ගර්භාෂය සංකෝචනය උත්තේජනය කරයි.
4. ප්‍රසූතියේ අවසාන අවධිය ළදරුවා බිහිවීමයි.
5. දරු ප්‍රසූතියේ දී ඔක්සිටෝසින් මුදා හැරීම සඳහා වැදගත් කාර්යභාරයක් ගර්භාෂයේ සංකෝචනය මගින් සිදුවේ. (2012)

(05) මානව ගර්භනීභාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. සාමාන්‍යයෙන් එහි කාලසීමාව සංසේචනයෙන් පසු සති 38 ක් පමණ වේ.
2. ගර්භණී කාලයේ දී මයෝමෙට්‍රියමේ සංකෝචන මැඩ පවත්වයි.
3. ගර්භණී කාලයේ ප්‍රථම ත්‍රෛමාසිකය අවසානයේදී භ්‍රෑණය 3 - 4 kg පමණ බර වේ.
4. මූත්‍රවල hCG තිබීම ගර්භණීභවය තහවුරු කරයි.
5. ගර්භණී කාලයේ අවසාන කාලයේදී ඊස්ට්‍රඩියෝල් මගින් ගර්භාෂයේ සංකෝචන උත්තේජනය කරයි. (2014)

(06) මානව සංසේචනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?
1. එය සාමාන්‍යයෙන් සිදුවන්නේ ෆැලෝපීය නාලයේ පහළ කොටසේ ය.
2. එය ඩිම්බ මෝචනයෙන් පැය 24 ක් තුළ සිදුවිය යුතුය.
3. මෙම ක්‍රියාවලියේදී ඩිම්බ පටලය මගින් ශුක්‍රාණුවම ඇතුල් වේ.
4. සංසේචනයේ දී ඩිම්බය තුළට මුළු ශුක්‍රාණු බහුප්‍රවේශනය වැළැක්වේ.
5. කිසිම විටෙක එය ස්ත්‍රී ප්‍රජනක පද්ධතියෙන් පිටත සිදු නොවේ. (2014)

(07) ගර්භනීභාවයේ දක්නට ලැබෙන ලක්ෂණයක් නොවනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

1. මලබද්ධය	2. මූත්‍ර පහකිරීමේ වාර ගණන අඩු වීම.
3. ගර්භාෂය විශාල වීම	4. ගැබ්ගෙලෙහි ශ්ලේෂ්මල පිණ්ඩ දුරීම
5. උදෑසන ඔක්කාරය	

(2015)

(08) මානව කලලබන්ධය පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.
(A) මඬලාකාර අවයවයක් වන අතර කොටස් 2 කින් යුක්තය.
(B) ගර්භණීභාවයේ මුල් අවධියේ දී hCG සහ ප්‍රොජෙස්ටරොන් නිපදවයි.
(C) භ්‍රෑණ සහ මාතෘ රුධිරය මිශ්‍ර වීම එය වළක්වයි.
(D) එයට ප්‍රොස්ටග්ලැන්ඩින් නිපදවීමට පුළුවන.
(E) එය මවගේ සිට භ්‍රෑණයටත් භ්‍රෑණයේ සිට මවටත් O_2 ගමන් කිරීමට ඉඩ සලසයි. (2016)

ළමා කාලයේ පෝෂණය හා විකසනය

(01) මානව කිරි පිළිබඳ පහත සඳහන් ප්‍රකශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. එහි සංස්ලේෂණය හා ස්‍රාවයවීම් ප්‍රොලැක්ටින් මගින් යාමනය වේ.
2. සුක්‍රෝස් නිසා එය පැණි රස ය.
3. එහි ලැක්ටලිබියුමින් නැත
4. එය Na^{+} හා Ca^{+2} අයන වලින් පොහොසත් ය.
5. අලුත උපන් ළදරුවෙකුට මාස 12 ක් පමණ වයස වන තෙක් එකම ආහාර ප්‍රභවය ලෙසට එයට ක්‍රියා කළ හැක. (2012)

(02) මානව ක්ෂීරණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් වැරදි වනුයේ කුමක් ද?
1. ක්ෂීරණය යනු ක්ෂීර ග්‍රන්ථිවලින් කිරි නිපදවා නිදහස් කිරීමයි.
2. කිරි පිටකිරීමේ ප්‍රතීකය සඳහා ඔක්සිටෝසින් දායක වේ.
3. කිරි නිපදවීම ප්‍රොජෙස්ටරෝන් මගින් මැඩ පැවැත්වේ
4. කිරි නිපදවීම පවත්වා ගැනීම සඳහා ළදරුවා කිරි උරාබීම අත්‍යවශ්‍ය වේ.
4. මානව කලලබන්ධ ලැක්ටෝජන් මගින් කිරි නිපදවීම වැඩි කෙරේ. (2013)

(03) මානව ක්ෂීරයේ නොතිබීමට ඉඩ ඇත්තේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

1. කැල්සියම්	2. කේසීන්	3. මේදය
4. මේද අම්ල	5. ග්ලැක්ටෝස්	

(2018)

නිපුණතාව 5.8.5 : ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව දැනුවත් වීම

(01) ඒඩ්ස් රෝගය,
1. ශ්‍රී ලංකාවේ දැන් හඳුනාගෙන ඇත.
2. මවගෙන් ජනිතයාට සම්ප්‍රේෂණය විය නොහැක.
3. නව බැක්ටීරියා විශේෂයක් මගින් ඇති කරනු ලැබේ.
4. රතු රුධිරාණු වලට බලපායි.
5. ආසාදනයෙන් පසු කෙටි කාලයකදී මතු වේ. (1987 Z)

(02) AIDS වයිරසය,
1. වකුගඩුවෙහි සෛල ආසාදනය කරයි.
2. T - වසා සෛල මත බලපායි.
3. රුධිරාණු විනාශ කරයි.
4. අක්මා පටක තුවාල කරයි.
5. ප්‍රජනක පද්ධතියේ සෛල තුළ එක්රැස් වේ. (1989 Z)

(03) AIDS සම්ප්‍රේෂණය විය හැක්කේ,
1. දූෂණය වූ ආහාර මගිනි. 2. වැසිකිළි මගිනි.
3. රුධිර ප්‍රවේශන මගිනි. 4. ඇඳුම් මගිනි.
5. වාතය මගිනි. (1991 Z)

(04) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. IUD පිරිමින් සඳහා බලපායි.
2. ගබ්සාව නීති විරෝධී උපත් පාලන ක්‍රමයකි.
3. ගබ්සාව සිදු කරන ඖෂධ ප්‍රොජෙස්ටරෝන් ප්‍රතිග්‍රාහක අවහිර කරයි.
4. LRT පිරිමින් සඳහා වූ උපත් පාලනයකි.
5. Depo-provera කෘතිම ඊස්ට්‍රජන් සහිතයි. (2010)

(05) උපත් පාලනය පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. ක්ෂීරණයට උපත් පාලන බලපෑමක් ඇති කිරීමට පුළුවන.
2. ගිලින උපත් පාලන පෙති පිටියුටරියේ FSH හා LH නිදහස් කිරීමට බාධා ඇති කරයි.
3. ඩොපො-ප්‍රොවෙරා ගර්භාෂයික අධිරෝපණය වළකයි.
4. IUD ඩිම්බමෝචනය වළකයි.
5. වාසෙක්තමී යනු පුරුෂයන් සඳහා ඇති ස්ථිර උපත් පාලන ක්‍රමයකි. (2014)

නිපුණතාව 5.9.0 : සතුන්ගේ සන්ධාරණය සඳහා සැකසී ඇති පද්ධති හා චලන ක්‍රම
නිපුණතාව 5.9.1 : සතුන්ගේ කංකාල පද්ධතිවල ව්‍යුහය හා කෘත්‍යයන්

(01) පහත සඳහන් වංශ අතරෙන් පිටසැකිල්ලක් සහිත සාමාජිකයන් අන්තර්ගත නොවන්නේ කුමකට ද?
1. *Coelentarata* 2. *Arthropoda* 3. *Mollusca*
4. *Echinodermata* 5. *Chordata* (1995 Z)

(02) පහත සඳහන් ප්‍රකාශ අතරෙන් සත්ත්ව සැකිලි පිළිබඳ වැරදි වන්නේ කුමක් ද?
1. සැකිලි සංරචණය සඳහා ආධාර වේ.
2. ඇනලීඩාවන්ට ද්‍රවස්ථිති සැකිල්ලක් ඇත.
3. පිටසැකිලි සතුන්ගේ වර්ධනය සීමා කරයි.
4. අන්තඃසැකිලි අපෘෂ්ඨවංශීන්ට පමණක් සීමා වේ.
5. ක්ෂීරපායීන්ගේ සැකිල්ල කැල්සියම් සමස්ථිතිය සඳහා සහභාගී වේ. (2001)

(03) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සතුන්ගේ කංකාල පද්ධති පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක් ද?
1. ආත්‍රොපෝඩාවන්ගේ සැකිල්ල ප්‍රධාන වශයෙන් කෙරටීන්වලින් තැනී ඇත.
2. ඇතුළු සැකිල්ලක් දක්නට ලැබෙනුයේ පෘෂ්ඨවංශීන්ගේ පමණි.
3. මිනිසාගේ අපරකපාල සන්ධාන අග්‍ර අක්ෂ කශේරුකාව සමඟ සන්ධානය වේ.
4. මිනිස් දේහයේ ඇති දිගු ම අස්ථිය ඌර්වස්ථිය යි.
5. මිනිසාගේ අන්තර් කශේරුකා මඬල ප්‍රධාන වශයෙන් ප්‍රත්‍යස්ථ කාටිලේජවලින් තැනී ඇත. (2007)

(04) මිනිසාගේ කංකාල පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(A) කපාලයේ පාර්ශ්වකපාල සහ ලලාට අස්ථි යන දෙක ම යුගලමය වේ.
(B) කශේරුවේ ග්‍රෛව චක්‍රය උපතින් මාස 7 - 8 පමණ කාලයේදී ඇති වේ.
(C) එය සමස්ථිතියේදී කාර්යභාරයක් ඉටු කරයි.
(D) එය රතු රුධිරාණු සහ සුදු රුධිරාණු යන දෙවර්ගය ම නිපදවයි.
(E) පාදයේ අන්වායාම වක්‍ර දෙකක් ඇත. (2013)

(05) සත්ත්වයින්ගේ පිටසැකිල්ල පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. පිටසැකිල්ලක් දරන ප්‍රධාන සත්ත්ව කාණ්ඩය මොලස්කාවන් ය.
2. මුහුදු ඉකිරි පිටසැකිල්ලක් දරන බැවින් අනෙක් එකයිනොඩර්මේටාවන්ගෙන් වෙනස් වේ.
3. සමහර උරගයන්ගේ දේහය සන්ධාරණය වනුයේ පිටසැකිල්ලෙන් පමණි.
4. ආත්‍රොපෝඩාවන්ගේ පිටසැකිල්ල කාබෝහයිඩ්‍රේට, ප්‍රෝටීන සහ කැල්සියම් කාබනේට් දරයි.
5. සමහර නිදැලිවාසී නෙමටෝඩාවන්ගේ දේහය පිටසැකිල්ලකින් ආවරණය වේ (2015)

(06) අස්ථිමය සැකිල්ලක් නොමැති සත්ත්වයින් අන්තර්ගත වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේද?/කාණ්ඩවල ද?
(A) කෝඩේටා (B) ආවේස් (C) නෙමටෝඩා
(D) ආත්‍රොපෝඩා (E) මැමේලියා (2017)

(07) සත්ත්ව සැකිලි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක්ද? / කුමන ඒවා ද?
(A) ඇතුළු සැකිල්ල සහ පිට සැකිල්ල යන දෙක ම ආරක්ෂාව සපයයි.

(B) මොලුස්කාවන් ඇතුළු සැකිලි දරයි
(C) සියලු සැකිලි කැල්සියම් සංචිත කරයි
(D) ද්‍රවස්ථිති සැකිල්ල ඇනලීඩාවන්ගේ සහ නෙමටෝඩාවන්ගේ දැකිය හැකිය
(E) මොලස්කාවන්ට ඇත්තේ පිටසැකිලි පමණි (2017)

(08) සත්ත්වයින්ගේ සැකිලි පිළිබඳ ව නිවැරදි වන්නේ පහත සඳහන් කුමන සංකලනයද?/සංකලන ද?

සැකිල්ල	නිදසුන
(A) සීලෝමය	ඇනලීඩාවන්
(B) ව්‍යාජ සීලෝමය	නිඩේරියාවන්
(C) කැල්සියම් කාබනේට් ඵලක	එකයිනොඩර්මේටාවන්
(D) අස්ථි ඵලක	උරගයින්
(E) ආමාශ වාහිනී කුහරය	නෙමටෝඩාවන්

(2019)

නිපුණතාව 5.9.2 : මිනිස් අක්ෂීය සැකිල්ලේ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) මිනිසාගේ පර්ශු කූඩුව තුළ අඩංගු ඉන්ද්‍රියයක් වන්නේ,
1. හෘදය හා පෙනහැලි ය.
2. හෘදය, පෙනහැලි හා අන්නස්‍රෝතය ය.
3. හෘදය, පෙනහැලි හා ග්‍රසනිකාව ය.
4. හෘදය, පෙනහැලි, අන්නස්‍රෝතය හා ආමාශය ය.
5. හෘදය, පෙනහැලි, අන්නස්‍රෝතය, ආමාශය හා අක්මාව ය. (1986 Z)

(02) මිනිස් කශේරුවෙහි අන්තර් කශේරුක මඬල,
1. ඝනකමින් වැඩි ම වන්නේ උරස් කශේරුකා අතරදීය.
2. කශේරුවට දෘඪතාවය සපයත්.
3 කශේරුකා දේහවල ගෙවීයාම වළකයි.
4. තිගැසුම් අවශෝෂක ලෙස ක්‍රියා කරයි.
5. කශේරුකා අතර සන්ධානය සපයත්. (1986 Z)

(03) යම් පුද්ගලයෙකු වැටී ඔහුගේ හිසෙහි පිටුපස බිම වැදුණහොත් පහත සඳහන් අස්ථි අතරෙන් වැඩියෙන් ම අනතුරට භාජනය විය හැකි අස්ථිය කුමක් ද?
1. පාර්ශ්වකපාල අස්ථිය 2. ශංඛක අස්ථිය 3. ලලාටස්ථිය
4. අපරකපාල අස්ථිය 5. චූචූකාකාර අස්ථිය (1993 Z)

(04) මිනිස් කපාලයේ අස්ථියක් නොවන්නේ පහත සඳහන් ඒවා අතරින් කුමක් ද?
1. ලලාට අස්ථිය 2. පාර්ශ්වකපාල අස්ථිය 3. කීලාස්ථිය
4. නාසාස්ථිය 5. ශංඛක අස්ථිය (1994 Z)

(05) මිනිසාගේ පර්ශු දරන කශේරුකා සංඛ්‍යාව වනුයේ,
1. 4 ය. 2. 5 ය. 3. 7 ය. 4. 10 ය. 5. 12 ය. (1994 Z)

(06) මිනිසාගේ කපාලය සෑදීම සඳහා සහභාගී නොවන අස්ථියක් වනුයේ,
1. ලලාටාස්ථිය ය. 2. ශංඛක අස්ථිය ය. 3. පීද්‍රාස්ථිය ය.
4. කීලාස්ථිය ය. 5. යුග අස්ථිය ය. (1998 Z)

(07) පහත සඳහන් ඒවා අතුරෙන් නීරෝගී වැඩිහිටි මිනිසෙකුගේ උරස් කශේරුකා පිළිබඳ ව අසත්‍ය වනුයේ කුමක් ද?
1. ඒවා සියල්ලම ප්‍රමාණයෙන් සමාන වේ.
2. කශේරුවෙහි උරස් කශේරුකා 12 ක් ඇත.
3. ඒවායෙහි තීර්යක් ප්‍රසරවල පීද්‍ර නොමැත.
4. කශේරුවෙහි ප්‍රාථමික වක්‍රය සෑදීම සඳහා ඉවහල් වේ.
5. ඒවායේ තීර්යක් ප්‍රසරවල සහ කශේරුකා දේහවල සන්ධාන මුහුණත් ඇත.
(1999 Z)

(08) මානව සැකිල්ලේ පහත සඳහන් ලක්ෂණ අතුරෙන් ඍජු ඉරියව්ව සඳහා වැදගත් වනුයේ කුමන ලක්ෂණය/ලක්ෂණ ද?
(A) කශේරුවේ වක්‍ර හතරක් තිබීම. (B) අන්තර්කශේරුකා මඬල තිබීම.
(C) පළල් පාදයක් තිබීම. (D) බේසමක හැඩයක් සේ ශ්‍රෝණියක් තිබීම.
(E) විශාල කපාලයක් තිබීම. (2000)

(09) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පරිණත මානව හිස්කබල පිළිබඳ ව වැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?
1. එය අස්ථි 22 කින් සෑදී ඇත. 2. එහි ධාරිතාව ලීටර 2 ක් පමණ වේ.
3. එය මැද කන ආරක්ෂා කරයි. 4. මහා පීද්‍රය එහි පාදස්ථයේ පිහිටයි.
5. අධෝ හනුව කපාලය සමඟ සන්ධානය වේ. (2003)

(10) මිනිසාගේ උරස් කශේරුකාවක් අනිත් කශේරුකාවලින් වෙන් කර හඳුනාගත හැක්කේ,
1. එහි තරම විශාල වීම නිසා ය.
2. කශේරු ධමනි නාල පිහිටීම නිසා ය.
3. ද්විභින්න ස්නායු මාර්ග කණ්ටකයක් තිබීම නිසා ය.
4. බණ්ඨක ප්‍රසරයක් නොතිබීම නිසා ය.
5. කශේරුකා දේහය මත සන්ධාන මුහුණත් තිබීම නිසා ය. (2003)

(11) මිනිසාගේ කශේරුව,
1. අක්ෂකාස්ථි හා පර්ශු සන්ධානය වීම සඳහා සහ පේශි සවි වීම සඳහා පෘෂ්ඨ සපයයි.
2. කශේරුකා 33 කින් සමන්විත වන අතර ඉන් 26 ක් චලනය කළ හැකි ය.
3. එය තුළ පිහිටන රතු ඇටමිදුළු තුල ජීවිත කාලය මුළුල්ලේ ම රතු රුධිරාණු නිපදවයි.
4. වක්‍ර හතරකින් සමන්විත වන අතර ඉන් තුනක් ප්‍රාථමික වක්‍ර ය.
5. කම්පන අවශෝෂණය සඳහා කාටිලේජ හා ජෙලටිනීමය ද්‍රව්‍ය වලින් සෑදුනු අන්තර් කශේරුකා මඬල දරයි. (2004)

(12) පහත සඳහන් වගන්ති අතුරෙන් වැඩිහිටි මිනිසෙකුගේ හිස්කබල පිළිබඳ වැරදි වනුයේ කුමක් ද?
1. එය සෑදී ඇත්තේ අස්ථි 22 කින් ය.
2. එහි ධාරිතාව මිලිමීටර 1550 ක් පමණ වේ.
3. එය මැදි කන ආරක්ෂා කරයි.
4. එය අක්ෂ කශේරුකාව සමඟ සන්ධානය වේ.
5. එහි අස්ථි සීවනී මගින් එකිනෙක හා සම්බන්ධ වේ. (2005)

(13) තීර්යක් ප්‍රසරවල පිහිටි පිද්‍ර යුගලයක් දක්නට ලැබෙනුයේ මිනිසාගේ,
1. ග්‍රෛවී කශේරුකාවල ය. 2. උරස් කශේරුකාවල ය.
3. කටී කශේරුකාවල ය. 4. ත්‍රිකාස්ථික කශේරුකාවල ය.
5. අනුත්‍රිකාස්ථියේ කශේරුකාවල ය. (2006)

(14) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මිනිසාගේ කශේරුව පිළිබඳ ව නිවැරදි වන්නේ කුමක්ද?
1. එය රේඛීය ව පිහිටි කශේරුකාවකින් සමන්විත ය.
2. ත්‍රිකාස්ථික වක්‍රය උපතින් පසු ව ඇති වේ.
3. පළමුවැනි ග්‍රෛවී කශේරුකාව අක්ෂ කශේරුකා යි.
4. විශාලම සහ ශක්තිමත් ම කශේරුකා කටී කශේරුකා යි.
5. ත්‍රිකාස්ථිය සෑදී ඇත්තේ කශේරුකා හතරක් හා අන්තර් කශේරුකා මඬල තුනක් හාවීමෙනි. (2008)

(15) මිනිසාගේ කටී කශේරුකා පිළිබඳ නිවැරදි වන්නේ කුමක් ද?
1. කටී කශේරුකා හතක් ඇත.
2. ඒවායේ කශේරු ධමනි නාල දෙකක් ඇත.
3. ඒවායේ විශාල ම සහ ශක්තිමත් ම කශේරුකා වේ.
4. එක් එක් කශේරුකාව දේහය ඉදිරියට සහ පසුපසට ගැනීම අවම කරයි.
5. ඒවා ඉතා දිග ස්නායු මාර්ග කණ්ඨක දරයි. (2009)

(16) මිනිසාගේ හොඳින් වැඩුණු කශේරුකා දේහයක් දිගු ස්නායු මාර්ග කණ්ඨකයක් සහ දිගු තීර්යක් ප්‍රසාර දක්නට ලැබෙනුයේ,
1. කටී කශේරුකාවල පමණි. 2. උරස් කශේරුකාවල පමණි.
3. කටී සහ උරස් කශේරුකාවල පමණි.
4. 6 වැනි ග්‍රෛවී කටී සහ උරස් කශේරුකාවල පමණි.
5. උරස්, කටී සහ ත්‍රිකාස්ථික කශේරුකාවල පමණි. (2011)

(17) වැඩිහිටි සාමාන්‍ය පුරුෂයෙකුගේ හිස්කබල පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) එහි කපාල ධාරිතාව ලීටර් දෙකක් පමණ වේ.
(B) චුචූකාකාර ප්‍රසරය ඇත්තේ යටි හනුවේ ය.
(C) ඌර්ධවහනු අස්ථියේ වාත කෝටරක ඇත.
(D) මුහුණ ප්‍රදේශය අස්ථි 12 කින් තැනී ඇත.
(E) ශංඛක අෂ්ථියට සම්බන්ධව ප්‍රසර වර්ග තුනක් ඇත. (2014)

(18) මිනිසාගේ දර්ශීය කශේරුකාවක
1. කශේරුකා දේහයෙන් හටගන්නා ප්‍රසර දෙකක් පාර්ශ්වික ව විහිදී තීර්යක් ප්‍රසර තනයි.
2. එක් එක් තීර්යක් ප්‍රසරය සන්ධාන මුහුණත බැගින් දරයි.
3. ස්නායු මාර්ග වක්‍රයේ සන්ධාන ප්‍රසර යුගල දෙකක් පිහිටයි.
4. එක් එක් තීර්යක් ප්‍රසරයේ කශේරු ධමනිය සඳහා පිද්‍රයක් බැගින් ඇත.
5. ස්නායු මාර්ග කණ්ටකය ද්විභින්න ය. (2015)

(19) මානව පර්ශු පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. ඒවා කෙටි වක් වූ අස්ථිය.
2. පර්ශුවල උත්තර පෘෂ්ටයේ ගැඹුරු ඇලියක් ඇත.
3. පර්ශු යුගල් 14 ක් ඇත.
4. ප්‍රථම පර්ශු යුගල් අට උරතලය සමඟ කෙලින් ම සන්ධානය වේ.
5. සියලුම පර්ශු අපර දෙසින් කශේරුව සමඟ සන්ධානය වේ. (2018)

නිපුණතාව 5.9.3 : මිනිස් ගාත්‍රා සැකිල්ලේ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) මිනිසාගේ උඩු ගාත්‍රය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. උත්කුබ්ජනයේ දී අරාස්ථියේ විදූර කෙළවර අන්වරාස්ථිය මත පිහිටයි.
2. හස්තකූර්චාස්ථි අතර අචල සන්ධි පිහිටයි.
3. මාපටඟිල්ලේ පිළිමල්තාවයට හේතු වන්නේ එහි ප්‍රථම ඇඟිලි පුරුකේ අධික චලතාවය යි.
4. අන්වරාස්ථිය අරාස්ථියට වඩා දිගු ය.
5. වැළමිටි සන්ධිය සැකසෙනුයේ අන්තරාස්ථිය සමඟ සන්ධානය වීමෙනි. (2010)

(02) මානව ඉහළ ගාත්‍රය මගින් බරක් එසවීමේදී පහත සඳහන් ඒවායින් කවරක් අඩුම වශයෙන් දායක වේ ද?
1. දිගු සහ ශක්තිමත් ප්‍රගන්ඩාස්ථිය 2. නිකුබ්ජනය 3. උත්කුබ්ජනය
4. යථාතථ්‍ය ග්‍රහණය 5. පළල් අත්ල (2014)

(03) මානව ඉහළ ගාත්‍රය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. දේහයේ ඇති දිග ම සහ බර ම අස්ථිය ප්‍රගන්ඩාස්ථියයි.
2. අරාස්ථිය, අන්වරාස්ථියට වඩා දිගු ය.
3. අරාස්ථියේ හිස අන්වරාස්තිය සමඟ සන්ධානය වේ.
4. මැණික් කටුව තැනී ඇත්තේ හස්තකූර්ච හතකිනි.
5. ප්‍රගන්ඩාස්ථියේ විදූර කෙළවර සන්ධානය වන්නේ අන්වරාස්ථිය සමඟ පමණි. (2018)

නිපුණතාව 5.9.4 : විවිධ පේශි පටක ආකාරවල මූලික ව්‍යුහය හා කායික ක්‍රියා

(01) අස්ථි පිළිබඳව පහත දක්වා ඇති වගන්ති අතුරින් නිවැරදි කවරක් ද?
1. පූරකය තුළ තන්තු කිසිවක් අන්තර්ගත වී නැත.
2. පූරකය තුළ කැල්සියම් සල්ෆේට් විශාල ප්‍රමාණයක අඩංගු වේ.
3. ඒවා ඇත්තේ පෘෂ්ඨවංශීන්ටය
4. කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය පූරකයේ ඉහළය.
5. හැවසීය නාල තුළ ඇටමිදුලු ඇත. (1987 Z)

(02) කංකාල පේශි තන්තුවක සාකොමියටරය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. එය පේශි සංකෝචනයේ දී ක්‍රියාකාරී ඒකකයයි.
2. එය යාබද Z - රේඛා දෙකක් අතර ප්‍රදේශයයි.
3. M - රේඛාවේ ඇත්තේ මයෝසින් සූත්‍රිකා පමණි.
4. පේශි සංකෝචනයේ දී ඇක්ටින් සූත්‍රිකා දිගින් අඩුවේ.
5. පේශි සංකෝචනයේ දී Z රේඛා එකිනෙකට ලං වේ. (2012)

(03) මිනිසාගේ කංකාල පේශි සංකෝචනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වනුයේ,
1. එය ආරම්භ වීම සඳහා චාලක ස්නායු උත්තේජනයක් අත්‍යවශ්‍ය ය.
2. මයොසින් හිස් සහ ඇක්ටින් බන්ධන ස්ථාන අතර හරස් සේතු සෑදේ.
3. ඇක්ටින් සූත්‍රිකා Z - රේඛාවට සම්බන්ධ වී ඇත.
4. Z - රේඛා සිහින් රේඛා ලෙස දිස්වේ.
5. හරස් සේතු සෑදීම සඳහා කැල්සියම් අයන අත්‍යවශ්‍ය වේ. (2013)

(04) මානව සිනිඳු පේශි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. ඒවා සියල්ල රිද්මාකාර සංකෝචන දක්වයි.
2. ඒවායේ සංකෝචන ඒකකය සාකොමියරය නොවේ
3. ඒවා ඉක්මනින් විඩාවට පත්වේ.
4. ඒවා දෛහික ස්නායු පද්ධතියෙන් ස්නායුතනය වේ.
5. ඒවා ප්‍රත්‍යස්ථ නොවේ. (2014)

(05) සිනිඳු පේශි පිළිබඳ වැරදි වනුයේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කුමක් ද?
1. ඇදීමෙන් පසු මුල් දිගට පැමිණීමේ හැකියාවක් ඒවා පෙන්නුම් කරයි.
2. ඇඩ්රිනලින් සමහර සිනිඳු පේශි සංකෝචනය කරන අතර අනිත් ඒවා ඉහිල් කරයි.
3. සමහර ඒවා රිද්මාකාර සංකෝචන දක්වයි
4. ඒවා ඉක්මනින් විඩාවට පත් වේ.
5. ඒවා ස්වයංසාධක ස්නායු පද්ධතිය මගින් ස්නායු සැපයේ. (2016)

(06) කංකාල පේශිය පිළිබඳ වැරදි වනුයේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කුමක් ද?
1. එහි සංකෝචනය ආරම්භ කිරීම සඳහා සාමාන්‍යයෙන් ඇසිටයිල්කෝලීන් අවශ්‍යය.
2. එය සංකෝචනය වීමේ දී සාකොමියර මධ්‍ය දෙසට ඝන සූත්‍රිකා ඇදී යයි.
3. එය සංකෝචනය වීමේ දී බල පහර ශ්‍රේණියක් ඇති වේ.
4. ATP සහ Ca^{2+} රහිතව එයට සංකෝචනය වීමට නොහැකි ය.
5. එය සංකෝචනය වීමේ දී Z රේඛා දෙකක් අතර දුර කෙටි වේ. (2016)

(07) හෘත් පේශි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) ඒවා අන්තරස්ථාපිත මඬල දරයි.
(B) ඒවා දිග සිලින්ඩරාකාර ශාඛනය වූ සෛල දරයි.
(C) ඒවායේ හිදැස් සන්ධි ඇත. (D) ඒවා විලේඛ දරයි
(E) එක් එක් පේශි සෛලය තනි සාකොමියරයකින් සමන්විත ය. (2017)

(08) කංකාල පේශි පිළිබඳව පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) ඒවායේ හිදැස් සන්ධි ඇත. (B) ඒවා පහසුවෙන් විඩාවට පත් වේ.
(C) ඒවායේ එක් එක් තන්තුවේ සාකොමියර කීපයක් බැගින් ඇත.
(D) ඒවා විතන්‍ය ය.
(E) ඒවායේ තන්තු කෙටි, සිලින්ඩරාකාර, ශාඛනය නොවූ ඒවා වේ. (2018)

(09) මානව සැකිලි පද්ධතිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. අරාස්ථිය, අන්වරාස්ථිය සහ ප්‍රගන්ඩාස්ථිය මගින් තැනී ඇති වැලමිට සන්ධිය නිසා පූර්ව බාහුවේ සම්මිංජනය සහ නිකුබ්ජනය පමණක් සිදුකළ හැකිය.
2. ඌර්වස්ථිය, ජංඝාස්ථිය සහ දණිස් කටුව මගින් තැනෙන සන්ධිය නිසා වැඩි වේලාවක් ඍජු ව සිටගෙන සිටීමට පුළුවන.
3. පාදයේ චක්‍ර, සිටගෙන සිටීමේදී පමණක් දේහ බර ව්‍යාප්ත කිරීම සඳහා වැදගත් වේ.
4. කශේරුවේ උරස් සහ ත්‍රිකාස්ථික ප්‍රදේශ වල ඇති ද්විතීයික චක්‍ර, ඍජු ඉරියව්ව පවත්වා ගැනීම සඳහා උපකාරී වේ.
5. ඔස්ටියොපොරෝසිස් ලෙස හඳුන්වනු ලබන ප්‍රදාහක නොවන පරිහානි රෝගය නිසා ආසාදිත සන්ධිවල වේදනාව ඇති වන අතර ඒවායේ චලනය ද සීමාකාරී වේ. (2019)

(10) සත්ත්වයින්ගේ සැකිලි පිළිබඳ ව නිවැරදි වන්නේ පහත සඳහන් කුමන සංකලනය ද?/ සංකලන ද?

	සැකිල්ල	නිදසුන
(A)	සීලෝමය	ඇනලීඩාවන්
(B)	ව්‍යාජ කාබනේට් ඵලක	නිඩේරියාවන්
(C)	කැල්සියම් කාබනේට් ඵලක	එකයිනොඩර්මේටාවන්
(D)	අස්ථි ඵලක	උරගයින්
(E)	ආමාශ වාහිනී කුහරය	නෙමටෝඩාවන් (2019)

නව නිර්දේශයට විශේෂිතම අතිරේක ප්‍රශ්න

5.1.1 සත්ත්ව පටක

(01) අපිච්ඡද පටකය පිළිබඳව නිවැරදි ප්‍රකාශ වන්නේ,

(A) අපිච්ඡද පටකවල අග්‍රස්ථ පෘෂ්ඨය සෑම විටම දේහයෙන් පිටත බාහිර පරිසරය සමඟ ගැටෙමින් පවතී.
(B) සමහර අපිච්ඡද පටක වලට රුධිර සැපයුමක් දක්නට ලැබේ.
(C) පෝෂක හා ඔක්සිජන් පහළින් ඇති සම්බන්ධක පටකයෙන් ලබාගනී.
(D) සමහර අපිච්ඡද පටක යාන්ත්‍රික හානිවලට ප්‍රතිරෝධී වේ.
(E) අපිච්ඡද පටක වලට ශ්වසන වායු අවශෝෂණය කළ නොහැකිය.

(02) සරල අපිච්ඡද පටක පිළිබඳව වැරදි ප්‍රකාශය වන්නේ,

1. සරල ශල්කමය අපිච්ඡද සෛල අතරින් ද්‍රව්‍ය කාන්දු වේ.
2. ව්‍යාජ ස්ථරීභූත ස්ථම්භික අපිච්ඡදයේ සෛල ස්ථර කිහිපයකට පිහිටයි.
3. සමහර ව්‍යාජ ස්ථරීභූත අපිච්ඡද වලින් ශ්ලේෂ්මල ස්‍රාවය කරයි.
4. වෘක්ක නාලිකා වල සරල ඝනාකාර අපිච්ඡදය දැකිය හැකිය.
5. ශ්වාසනාලයේ සරල ස්ථම්භික අපිච්ඡදය දැකිය නොහැකිය.

(03) ස්ථරීභූත ශල්කමය අපිච්ඡදය පිළිබඳව වැරදි ප්‍රකාශ තෝරන්න.

(A) මෙම පටකයේ සෛල ස්ථර ගණනාවක් ඇති ලෙස පෙනුනද සත්‍ය ලෙසම ඇත්තේ තනි සෛල ස්ථරයකි.
(B) මෙම අපිච්ඡදය ඉතා ඉක්මනින් පුනර්ජනනය වේ.
(C) දරණු පටලයට ආසන්නයේම ඇති සෛල ගැලවී යයි.
(D) විසරණය මගින් ද්‍රව්‍ය හුවමාරු වන ස්ථාන වල ප්‍රධාන වශයෙන් දැකීමට හැකිය.
(E) මුඛ හා ගුද ආස්තරණ වල දැකීමට පුළුවන.

(04) සම්බන්ධක පටක සම්බන්ධයෙන් වැරදි යැයි සැලකිය නොහැක්කේ,

(a) සම්බන්ධක පටක අවයව හා පටක ව්‍යුහමය ලෙස පමණක් එකිනෙක සම්බන්ධ කරයි.
(b) ප්‍රතිශක්තිය සඳහා සම්බන්ධක පටක වල දායකත්වයක් නොමැත.
(c) සම්බන්ධක පටක වල හමුවන ජාලාකාර තන්තු ශක්තිය හා සුනම්‍යතාව සපයයි.
(d) ද්‍රව්‍ය පරිවහනය සඳහා සම්බන්ධක පටක දායක වේ.
(e) අස්ථි හා කාටිලේජ සම්බන්ධක පටක යටතට නොගැනේ.

1. a, b, c පමණි
2. d, e පමණි
3. b, d පමණි
4. d පමණි
5. වෙනත් පිළිතුරක් නිවැරදිය.

(05) ඝන සම්බන්ධක පටක පිළිබඳව වැරදි ප්‍රකාශ වන්නේ,

(A) කාටිලේජ පූරකය කොන්ඩ්‍රොයිටින් කාබනේට් වලින් සමන්විතය.
(B) කාටිලේජ යනු ප්‍රත්‍යස්ථ ලිපිඩ - කාබෝහයිඩ්‍රේට සංකීර්ණයකි.
(C) කාටිලේජ පූරකයේ කොන්ඩ්‍රොසයිට හා කොලැජන් තන්තු ගිලී පවතී.
(D) ඔස්ටියෝසයිට නම් පුනරාවර්තන ඒකක වලින් ක්ෂීරපායී අස්ථි සමන්විතය.
(E) අස්ථි පූරකය කොලැජන් තන්තු හා අකාබනික අයන වලින් සමන්විතය.

(06) අරියල පටකය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.

1. පෘෂ්ඨවංශීන්ගේ දේහ තුළ වඩාත් පුළුල්ව ව්‍යාප්තව පවතී.
2. මෙම පටකය සමාන්යිත සම්බන්ධක පටකය ලෙස සැලකීමට පුළුවන.
3. මෙහි කුඹ සෛල වලට ව්‍යුහයෙන් හා කෘත්‍යයෙන් සමාන මහා භක්ෂාණු සෛල හමුවේ.
4. මෙම පටකයේ තන්තු වර්ග තුනම හමු නොවේ.
5. මෙම පටකය නිසා අවයව නියමිත ස්ථාන වල රඳවා ගැනීමේ හැකියාව ලැබී ඇත.

(07) තන්තුමය සම්බන්ධක පටකය පිළිබඳව නිවැරදි වන්නේ,

1. මෙම පටකය තුල සාපේක්ෂව විශාල පූරකයක් දක්නට ලැබේ.
2. තන්තු අතර ඉතා ආසන්නව ඇසුරුණු සෛල විශාල සංඛ්‍යාවක් ද දක්නට ලැබේ.
3. අස්ථි හා සන්ධි බඳවා තබන බණ්ඩරා වල දක්නට ලැබේ.
4. බණ්ඩරා හා බන්ධනී වල ආතන්‍ය ශක්තිය අවශ්‍ය ස්ථාන වල පවතී.
5. මේද පටකය ද තන්තුමය සම්බන්ධක පටක වර්ගයකි.

(08) රුධිර පටකය පිළිබඳව සත්‍ය ප්‍රකාශ වන්නේ,

(A) මෙය සම්බන්ධ පටක විශේෂයක් ලෙස සැලකිය නොහැකිය.
(B) සමහර රුධිරාණු වර්ග පමණක් පූරකය ස්‍රාවය කරයි.
(C) කිසිම අවස්ථාවක රුධිර පටකයේ තන්තු දැකිය නොහැකිය.
(D) රුධිරයේ ප්‍රධාන කෘත්‍යයක් ලෙස ආස්‍රැති විධානය සැලකේ.
(E) රුධිරයේ බහිස්සෛලීය පූරකය පටක තරලය ලෙසට හඳුන්වයි.

(09) අස්ථි පටකය පිළිබඳව සත්‍ය නොවන ප්‍රකාශය වන්නේ,

(A) එය ඛනිජභවනය වූ සම්බන්ධක පටකයකි.
(B) අස්ථි පටකය නඩත්තු කිරීම පරිණත ඔස්ටියෝසයිට මගින් සිදු කරයි.
(C) ගර්තිකා තුළ ඔස්ටියෝන නම් සෛල විශේෂයක් අන්තර්ගතය.
(D) ඔස්ටියෝනයක මධ්‍යයේ රුධිරවාහිනී හා ස්නායු අන්තර්ගත මධ්‍ය නාලයක් සහිතයි.
(E) බොහෝ අපෘෂ්ඨවංශීන්ගේ අන්තඃසැකිල්ල අස්ථිමය නොවේ.

(10) පේශි පටකය පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.

(a) පේශි පටකය චලනය සඳහා දායක වේ.
(b) පේශි සෛල වල ඇක්ටින් හා මයොසින් ලිපිඩ අන්තර්ගත වේ.
(c) පේශි පටකයට රුධිර සැපයුමක් නොමැති අතර විසරණයෙන් පෝෂක හුවමාරු කරගනී.
(d) සියළුම පේශි සෛල වලට අනිච්ඡානුග පාලනයක් සහිතය.
(e) දේහයේ අභ්‍යන්තර අවයව වලට කංකාල පේශි දායකත්වය සාපේක්ෂව අඩුය.

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

1. a හා b ය
2. a පමණි
3. a හා e ය
4. a, b හා e ය
5. වෙනත් සංයෝජනයක් නිවැරදිය.

(11) මේද පටකය පිළිබඳ සත්‍ය ප්‍රකාශයක් වන්නේ,
1. මෙය මේද සෛල වලින් ඇසිරී ඇති නිසා ඝන සම්බන්ධක පටකයකි.
2. සෑම මේද සෛලයක්ම විශාල මේද ගෝලිකාවකින් යුක්ත නොවේ.
3. එය දේහ පරිවරණය හා පිරවුමක් ලෙස ක්‍රියා කරයි.
4. මේද පටකය දැකිය හැක්කේ සමට යටින් පමණි.
5. දේහයේ සමස්ථිතිය පවත්වා ගැනීමට මේද පටකයේ දායකත්වයක් නොමැත.

(12) පේශි පටක වර්ග පිළිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ,
1. ආමාශයේ මත් ගෑමට කලාතුරකින් කංකාල පේශි දායක වේ.
2. ධමනි බිත්ති වල හෘත් පේශි ඉතා සුළුවෙන් දැකිය හැකිය.
3. ආකාර තුනේම පේශි සෛල වල සංකෝචන ඒකක සාකොමියරය ලෙස හඳුන්වයි.
4. සමහර පේශි විලිඛිත වීමට සාකොමියරයේ සංවිධානය බල නොපායි.
5. සෛලයෙන් සෛලයට සංඥා හුවමාරුවට මෙන්ම හෘදයේ සමකාලීකෘත සංකෝචනයට අන්තරස්ථාපිතමඬල උදව් වේ.

(13) ස්නායු පටකය පිළිබඳව නිවැරදි ප්‍රකාශ වන්නේ,
1. ස්නායු පටකයේ නියුරොග්ලියා මගින් සමහර ස්නායු ආවේග සම්ප්‍රේෂණය සිදුකරයි.
2. ස්නායු පද්ධතියේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය නියුරෝනයකි.
3. නියුරෝන වල සෛල දේහය ආවේග සම්ප්‍රේෂණයට දායක නොවේ.
4. සමහර අවස්ථාවල ස්නායු සෛල වල කෘත්‍ය නිසිලෙස හැසිරවීමට ග්ලියා සෛල දායක වේ.
5. අනුශාඛිකා මගින් පමණක් වෙනත් නියුරෝන වලින් පැමිණෙන ආවේග ලබාගනී.

(14) රක්තාණු පිළිබඳව වැරදි ප්‍රකාශය වන්නේ,
1. මේවා කුඩා, ද්වි අවතල, මඩලාකාර සෛල වේ.
2. රක්තාණු වල ප්‍රධාන කෘත්‍ය O_2 හා CO_2 පරිවහනයයි
3. රුධිරය මයික්‍රෝ ලීටරයක රක්තාණු මිලියන 4 - 6 පමණ ඇත.
4. ස්ත්‍රී, පුරුෂභාවය අනුව රුධිරයේ රක්තාණු ප්‍රමාණ වෙනස් වේ.
5. රක්තාණු මගින් නිර්වායු ශ්වසනයෙන් ATP නිපදවයි.

(15) නියුරොග්ලියා වල කෘත්‍යයන් වන්නේ,
(A) ස්නායු ආවේග ලබාගැනීම (B) ස්නායු ආවේග සම්ප්‍රේෂණය
(C) ස්නායු සෛල වල අඩුව පිරවීම (D) ස්නායු සෛල පරිවරණය කිරීමට
(E) නව නියුරෝන සෛල නිපදවීම

(16) මානව රුධිරයේ ශ්වසන වායු පරිවහනය පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.
(A) එක් රක්තාණුවක් මගින් වරකට O_2 අණු 4ක් පරිවහනය කරයි.
(B) හිමොග්ලොබින් O_2 අණු වලට සමග අප්‍රතිවර්ත්‍යව බැඳීමේ හැකියාවක් පවතී.
(C) කාබොක්සි හිමොග්ලොබින් පටක සෛල ආසන්නයේදී O_2 හා හිමොග්ලොබින් බවට බිඳ වැටේ.
(D) හිමොග්ලොබින් තැනී ඇත්තේ උප ඒකක 4කිනි.
(E) රුධිරයේ ආවේණික රතු පැහැය ග්ලොබින් ප්‍රෝටීන මගින් ලබාදෙයි.

(17) රුධිරය ඔස්සේ සිදුවන CO_2 පරිවහනය පිළිබඳව සත්‍ය වන්නේ,
1. රුධිරය ඔස්සේ CO_2 පරිවහනය වන ප්‍රධානතම ක්‍රමය කාබ්ඇමයිනෝ හිමොග්ලොබින් ලෙසය.
2. රතු රුධිරාණු තුළ පරිවහනය වන ප්‍රධාන වායු වර්ගය CO_2 ය.
3. CO_2 බහුතරය රුධිර ප්ලාස්මාවේ දියවූ නිදහස් වායු ලෙස පරිවහනය වේ.
4. $CO_2 \rightleftharpoons HCO_3^- + H^+$ බවට පත් කිරීම කාබොනික් ඇන්හයිඩ්‍රේස් එන්සයිමය මගින් උත්ප්‍රේරණය කරයි.
5. කාබ්ඇමයිනෝහිමොග්ලොබින් සංකීර්ණය පටක සෛල අසලදී හිමොග්ලොබින් හා CO_2බවට බිඳ වැටේ.

(18) රුධිර ප්ලාස්මාව පිළිබඳව සත්‍ය වන්නේ,
(A) රුධිර ප්ලාස්මාවේ pH අගය 8ට වඩා ස්වල්ප වශයෙන් වැඩිය.
(B) රුධිර ප්ලාස්මාව ප්‍රතිදේහ දරයි.
(C) රුධිර ප්ලාස්මාවේ අයන ස්වාරක්ෂණය සිදුකරන ෆයිබ්‍රිනෝජන් රුධිර කැටිකාරක වේ.
(D) ප්ලාස්මාවෙන් කැටිකාරක ද්‍රව්‍ය ඉවත කළවිට එය මස්තු නම් වේ.
(E) රුධිර ප්ලාස්මාව මගින් දේහයේ ආස්‍රැති විධානයට බලපෑම් ඇති නොකරයි.

(19) රුධිරය කැටිගැසීම පිළිබඳව නිවැරදි වරණය තෝරන්න.
1. හානියට පත් නොවූ රුධිර වාහිනී තුළ රුධිරය කැටිගැසීමක් සිදුවිය හැකිය.
2. රුධිර වාහිනියක් හානි වූ විගස රුධිර වහනය පාලනයට පට්ටිකා එකිනෙක ඇලී සාදන පිණ්ඩය දායක වේ.
3. හිස්ටැමින් වැනි සමහර ද්‍රව්‍ය රුධිර කැටි ගැසීම වළක්වාලයි.
4. රුධිරය කැටි ගැසීමට ත්‍රොම්බින් ප්‍රෝතොම්බින් බවට පත්විය යුතුය.
5. Mg^{2+} හා Na^+ රුධිරය කැටි ගැසීමට දායක වන ප්‍රධානතම අකාබනික අයන වේ.

නිපුණතාව 5.2.2 : මිනිස් ආහාර මාර්ග පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍යය

(01) මුඛ කුහරය හෝ බේටය පිළිබඳව අසත්‍ය පිළිතුර වන්නේ,
1. මුඛ කුහරය තුළ සිදුවන්නේ ආහාර වල යාන්ත්‍රික ජීර්ණය පමණක් නොවේ.
2. දත් මගින් ආහාර ජීර්ණය සඳහා පෘෂ්ඨීක ක්ෂේත්‍රඵලය වැඩි කිරීමක් සිදුකරයි.
3. අනුවේගී ස්නායු ආවේග මගින් මුඛ කුහරයට බේට ස්‍රාවය නිශේධනය කරයි.
4. බේට ඇමයිලේස් මගින් සියලුම පිෂ්ඨය ඩයිසැකරයිඩ බවට පත් කරයි.
5. බේටය මගින් දත් දිරායාම පාලනය කිරීමක් සිදුකරයි.

(02) මානව දිවෙහි ව්‍යුහය හා රස සංවේදනය පිළිබඳව පහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ,
1. දිවෙහි පේශි සෛල විලිඛිත, බහුන්‍යෂ්ටික හා අනිච්ඡානුග වේ
2. දිව අපිච්ඡද පටකයන් මගින් ආස්තරණය වී පවතී.
3. රසාංකුර තුළ පිටිකා නම් වූ කුඩා ප්‍රසර්ජනයන් දක්නට ලැබේ.
4. මූලික රස වර්ග 6ක් දිව මගින් හඳුනාගත හැකිය.
5. රස සංවේදනය සඳහා අක්‍රිය පරිවහන ක්‍රම වල දායකත්වයක් නොමැත.

(03) අන්නස්‍රෝතය හා ආමාශය පිළිබඳව පහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ,
1. අන්නස්‍රෝතය හා ආමාශය මිනිස් උරස් කුහරය තුළ පිහිටයි.
2. අන්නස්‍රෝතයේ හා ආමාශයේ කංකාල පේශි දක්නට ලැබේ.
3. අන්නස්‍රෝතීය ක්‍රමාකුංචන චලන ඉච්ඡානුග වේ.
4. ආමාශයික ග්‍රන්ථි තුළ ශ්ලේෂ්මල සෛල, ප්‍රධාන සෛල හා පාර්ශ්වික සෛල දක්නට ලැබේ.
5. අන්නස්‍රෝතය හා ආමාශය අතර ආලාරවක්‍ර පිධාන ඇත.

(04) ආමාශයික ජීර්ණය පිළිබඳව නිවැරදි ප්‍රකාශ වන්නේ,
(A) ආමාශය තාවකාලිකව ආහාර ගබඩා කිරීමක් සිදුකරයි.
(B) මත්ගැම යනු රසායනික ජීර්ණ ක්‍රියාවලියකි.
(C) ආමාශය තුළදී ජලය, මධ්‍යසාර, සමහර ඖෂධ, ඇමයිනෝ අම්ල අවශෝෂණය වේ.
(D) ගැස්ට්‍රින් හෝර්මෝන ස්‍රාවය ආමාශ බිත්තිය මගින් සිදුකරයි.
(E) ගැස්ට්‍රින් හෝර්මෝනය ආමාශය මගින් නිපදවුවද ආමාශය මත ක්‍රියාත්මක නොවේ.

(05) ආමාශයික රසායනික ජීර්ණය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ආමාශයික යුෂය තුළ පෙප්සින් වල සක්‍රිය ආකාරය වන පෙප්සිනෝජන් දක්නට ලැබේ.
2. පාර්ශ්වික සෛල මගින් HCl සෘජුවම ආමාශයික යුෂයට ස්‍රාවය කරයි.
3. ආමාශයේ මත් ගැමේ ක්‍රියා රසායනික ජීර්ණය පහසු කරයි.
4. පෙප්සින් මගින් ප්‍රෝටීන ඇමයිනෝ අම්ල බවට ජලවිච්ඡේදනය කරයි.
5. ආමලසය යනු දියරමය, අර්ධව ජීර්ණය වූ, ආම්ලික ආහාර ස්කන්ධයකි.

(06) පහත ප්‍රකාශ අතරින් අසත්‍ය යැයි පිළිගත හැක්කේ,
(A) ශූන්‍යාන්ත්‍රය හා ශේෂාන්ත්‍රය තුළ ආහාර ජීර්ණයේ වැඩි කොටසක් සිදුව අවසන් වේ.
(B) කුඩා අන්ත්‍රයේ පෘෂ්ඨීක ක්ෂේත්‍රඵලය එහි අපර කොටසේදී ක්‍රමයෙන් වැඩිවේ.
(C) ග්‍රහනිය යනු අග්න්‍යාශයික හිස වටා ඇති C හැඩැති වක්‍රයකි.
(D) ක්‍රමාකුංචන චලන අන්නස්‍රෝතයට පමණක් සීමා වේ.
(E) ආමලසය තුළ අක්මාව මගින් නිපදවන ස්‍රාවයන් අන්තර්ගත වේ.

(07) ආන්ත්‍රික අපිච්ඡදය මගින් ස්‍රාවය කරන ප්‍රෝටියේස වන්නේ,
(A) ඩයිපෙප්ටිඩේස (B) කාබොක්සිපෙප්ටිඩේස © ට්‍රිප්සින්
(D) ඇමයිනෝපෙප්ටිඩේස (E) කයිමොට්‍රිප්සින්

(08) පහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ,
(A) කාබෝහයිඩ්‍රේට ජීර්ණය මුඛ කුහරයේ දීම ආරම්භ වේ.
(B) ඩයිසැකරයිඩේස එන්සයිම මගින් 1 - 6 ග්ලයිකොසිඩික බන්ධන ජලවිච්ඡේදනය කරයි.

(C) ප්‍රෝටීන ජීර්ණයේ අවසන් අදියර ප්‍රෝටියේස එන්සයිම මගින් සම්පූර්ණ කරයි.
(D) කාබොක්සිපෙප්ටිඩේස් මගින් කුඩා පොලිපෙප්ටයිඩ ඇමයිනෝ අම්ල බවට ජලවිච්ඡේදනය කරයි.
(E) මේද ජීර්ණය සඳහා අක්මාවේ ඇතැම් ස්‍රාව දායක වේ.

(09) පහත ප්‍රකාශ වලින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. DNA හා RNA ඒවායේ ඒකාවයවක බවට ජලවිච්ඡේදනයෙන් නියුක්ලික් අම්ල ජීර්ණය අවසන් වේ.
2. කොලෙසිස්ටොකයිනින් හා සික්‍රිටින් ස්‍රාවය වන ස්ථානයෙන් පිටතදී ක්‍රියාත්මක වේ.
3. සියලුම ආන්ත්‍රික එන්සයිම ග්‍රහනියේ කුහරයට ස්‍රාවය නොවේ.
4. අග්න්‍යාශික ලයිපේස් මගින් එස්ටර බන්ධන ජලවිච්ඡේදනය කරයි.
5. පොලිසැකරයිඩ ජීර්ණයෙන් පමණක් මොනොසැකරයිඩ නිපද නොවේ.

(10) ආහාර ජීර්ණ අන්තඵල අවශෝෂණය පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. සියලුම මොනොසැකරයිඩ අක්‍රියව ආන්ත්‍රික අපිච්ඡදය හරහා රුධිරයට අවශෝෂණය වේ.
2. සියලුම ආහාර ජීර්ණ අන්තඵල ආන්ත්‍රික අපිච්ඡදයෙන් අවශෝෂණය කෙරේ.
3. මේද ජීර්ණයේ අන්තඵල අවශෝෂණය කිරීමේදී ඒවා නැවත සංවෘත්තීය ප්‍රතික්‍රියා වලට ලක්කිරීමක් සිදුනොවේ.
4. ට්‍රයිග්ලිසරයිඩ පයෝලස නාලිකා තුළට සෘජුවම අවශෝෂණය කරයි.
5. පානය කරන ජලයට වඩා වැඩි ජල ප්‍රමාණයක් ආහාර මගින් දේහයට ලැබේ.

(11) අග්න්‍යාශය පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.
(A) අග්න්‍යාශය කහ පැහැති ග්‍රන්ථියක් වන අතර ග්‍රහනි වක්‍රයේ පිහිටයි.
(B) මෙය බාහිරාසර්ග මෙන්ම අන්තරාසර්ග ග්‍රන්ථියකි.
(C) අග්න්‍යාශයේ අන්තරාසර්ගී කොටස අනුඛණ්ඩිකා විශාල සංඛ්‍යාවකින් සමන්විතය.
(D)අග්න්‍යාශයික ප්‍රණාලය හා පිත්ත ප්‍රණාලය වෙන වෙනම ග්‍රහනියට විවර වේ.
(E) ග්ලූකෝස් සමස්ථියට දායක වන මෙහි අන්තරාසර්ගී කොටස නිර්නාල වේ.
නිවැරදි නොවන්නේ,
1. c, d පමණි. 2. a, c, d ය. 3. d පමණි.
4. b හා e ය. 5. a හා d ය.

(12) අක්මාව පිළිබඳව නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
1. අක්මාව මිනිස් සිරුරේ විශාලතම ග්‍රන්ථිය මෙන්ම දෙවන විශාලතම අවයවයයි.
2. අක්මාවේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය අක්මා අනුඛණ්ඩිකාවයි.
3. අක්මා සෛල ස්ථම්භ යුගල 2 ක් අතර කෝටරාභද අක්මා සෛල ස්ථම්භ 2 ක් අතර පිත්ත නාලිකාවක් ද පිහිටයි.
4. අක්මාව අන්තරාසර්ග ග්‍රන්ථියක් නොවුණද බාහිරාසර්ග ග්‍රන්ථියක් වේ.
5. අක්මාව කොබල්ඇමින් සංචිත කරයි.

(13) පහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ,
1. සමබල ආහාරයක සියලු පෝෂක සම අනුපාතවලින් පැවතිය යුතු ය.
2. දේහට අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල නිවැරදි අනුපාතවලින් ලබා ගැනීමට සත්ත්ව ප්‍රෝටීන භාවිතය ශාක ප්‍රෝටීන භාවිතයට වඩා පහසුය.
3. අත්‍යවශ්‍ය මේද අම්ල ශරීරයේ සංස්ලේෂණය කරගත හැකිවීම විශේෂත්වයකි.
4. විටමින් සියල්ලම ශරීරයේ නිපදවිය නොහැකිය.
5. දේහයේ ස්නායු ක්‍රියාකාරීත්වයට K, Na හා F අත්‍යවශ්‍ය ඛනිජ වේ.

(14) විටමින් හා ඛනිජ සම්බන්ධව පහත ප්‍රකාශ සලකන්න. මින් සත්‍ය වන්නේ,
(A) ප්‍රතිශක්තිය දුබල වීමට රෙටිනෝල් හා Fe ඌනතාවය බලපායි.
(B) නියසීන් ඌනතාවය පෙලග්‍රා රෝගයට මඟ පාදයි.
(C) රක්තහීනතාව හා උද්දීප්‍යතාව ෆෝලික් අම්ලය ඌනවීමෙන් ඇති වේ.
(D) දත් දිරායාමට P හා F ඌනතා දායක වේ.
(E) ස්නායු පද්ධතියේ පරිහානියට B9 ඌනතාවය බලපායි.

5.3.2 - මානව රුධිර සංසරණ පද්ධතියේ ව්‍යුහය

(01) මානව වසා පද්ධතිය පිළිබඳව සත්‍ය ප්‍රකාශ වන්නේ,
(A) වසා පද්ධතිය, ව්‍යුහිකව හා කෘත්‍යාත්මකව රුධිර වාහිනී පද්ධතිය සමඟ ඉතා කිට්ටු සම්බන්ධයක් දක්වයි.
(B) ප්ලීහාව හා තයිමස වසා අවයව වේ.
(C) වසා ගැටිති තැනී ඇත්තේ පේශී පටක හා සුදු රුධිරාණු වලිනි.
(D) වසාවල සංයුතිය, අන්තරාල තරලයේ සංයුතියට සමානය.
(E) වසා වාහිනී බිත්තිවල රිද්මයානුකූල සංකෝචන හා සිනිඳු පේශි සංකෝචන මඟින් වසා තරලය පරිවහනය වේ

5.33 - රුධිරයේ කාර්යයන්

(01) ශ්වසන වර්ණක පිළිබඳව අසත්‍ය වන්නේ,
1. රුධිරය ඇතුළු ජලීය මාධ්‍යවලදී, O_2 ද්‍රාව්‍යතාව අඩුවීම නිසා සංකීර්ණ සතුන්ගේ ශ්වසන වර්ණක නිර්මාණය විය.
2. ශ්වසන වර්ණක රුධිර සෛල තුළ සෑමවිටම නොපිහිටයි.
3. මේවා කාබනික සංයෝග වන අතර ඔක්සිජන් සමඟ අප්‍රත්‍යාවර්තව බැඳේ.
4. ආත්‍රෝපෝඩා රුධිර වසාවල හීමොසයනින් දැකිය හැකිය.
5. සමහර සාගර අපෘෂ්ඨවංශීන්ගේ හීමෝඑරිත්‍රින් දැකිය හැකිය.

(02) මානව හෘදයේ ව්‍යුහය පිළිබඳව අසත්‍ය යැයි සැලකිය නොහැක්කේ,
1. හෘද් බිත්තිය පෙරිකාඩියම මයෝකාඩියම හා එන්ඩොකාඩියම ලෙස සෛල ස්ථර 3 කින් සමන්විතය.
2. මඩි 2 කින් සමන්විත පෙරිකාඩියමේ බාහිරින්ම මස්තුමය පෙරිකාඩියම පිහිටයි.
3. මයෝකාඩියම හෘත් පමණක් ජාලයකින් සමන්විතය.

4. එන්ඩොකාඩියම අඩසඳ කපාට හා ද්විතුණ්ඩ, ත්‍රිතුණ්ඩ කපාට ආස්තරණය කරයි.
5. කෝෂිකා අභ්‍යන්තර බිත්තියේ පිට්කා පේශිවලට සම්බන්ධ හෘද රජ්ජු මගින් අඩසඳ කපාට හා කර්ණික කෝෂික කපාටවල ක්‍රියාකාරිත්වය පාලනය කරයි.

(03) හෘදයේ සන්නයන පද්ධතිය පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.
(A) SA හා AV ගැට යනු විශේෂණය වූ කුඩා සෛල ස්කන්ධ වේ.
(B) හෘදය ස්නායුක හෝ හෝමෝනමය පාලනයකින් ස්වායත්තව ස්පන්දනය වේ.
(C) හෘද ස්පන්දන වේගය යාමනයට අන්තරාසර්ග හා ස්නායු පද්ධතිවලට නොහැකිය.
(D) SA ගැටය උත්තර මහා ශිරාව විවෘත වන ස්ථානයට ආසන්නව දකුණු කර්ණිකාවේ එන්ඩොකාඩියමේ පිහිටයි.
(E) පර්කින්ජේ තන්තු මගින් මයෝකාඩියමේ ආරම්භය තෙක් ආවේග ගෙනයයි.
ඉහත ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ,
1. a, b හා c ය. 2. a හා c ය. 3. a හා b ය.
4. c, d හා e ය. 5. වෙනත් ප්‍රතිචාරයකි.

5.3.5 - මිනිසාගේ ශ්වසන පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍ය

(01) ශ්වසන ව්‍යුහ පිළිබඳව සැලකීමේදී වැරදි ප්‍රකාශය තෝරන්න.
1. සතුන්ගේ ශ්වසන වායු හුවමාරුව සිදුවන්නේ සරල විසරණයෙනි.
2. සතුන්ගේ දේහ තරම හා සංකීර්ණත්වය වැඩි වත්ම පෘෂ්ඨ/පරිමා අනුපාතය වැඩි වේ.
3. සමහර ජීවීන් එකිනෙකට වෙනස් ශ්වසන ව්‍යුහ කීපයක් එකවර දැරිය හැකිය.
4. ජලජ සතුන්ට ජලයෙන් O_2 ලබා ගැනීමට ජලක්ලෝම පරිණාමය වී ඇත.
5. ගෝනුස්සෝ, මකුළුවෝ පත් පෙනහැලි භාවිතයෙන් O_2 අවශ්‍යතාව ඉටුකරගනී.

(02) මානව පෙණහැලි පිළිබඳව පහත දක්වා ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
1. ශ්වාසනාලිකා, අනුශ්වාසනාලිකා හා ගර්ත පෙණහැලි තුළ පිහිටයි.
2. දකුණු පෙණහැල්ල වම් පෙණහැල්ලට වඩා මඳක් කුඩාය.
3. පෙණහැලි දෙකම තනි පටල පද්ධතියකින් වටවී ඇත.
4. පාර්ශ්වික ප්ලූරාව නැමැති ඇතුළු පටලය උරස් කුහරයේ බිත්තිවලට ඇලී ඇත.
5. වම් පෙණහැල්ල ඛණ්ඩිකා දෙකකින්ද දකුණු පෙණහැල්ල කණ්ඩිකා 3 කින් ද සමන්විතයි

(03) ශ්වසන පද්ධතියේ ව්‍යුහ පිළිබඳව සත්‍ය වන්නේ,
1. නාස් කුටීරය තුළදී ආශ්වාස වාතය තෙත් හා සිසිල් කිරීමකට ලක් වේ.
2. ආහාර ගිලින විට ස්වරාලය ඉහළට චලනය වී අපිජිහ්විකාවෙන් ශ්වාසනාල ද්වාරය වසයි.
3. සාමාන්‍ය අවස්ථාවලදී ශ්වාසනාල ද්වාරය වැසී පවතී.
4. ස්වරාලයේ හා ශ්වාසනාලයේ බිත්ති අභ්‍යන්තරවම කාටිලේජ ස්ථර ඇත.
5. ශ්වාසනාලිකා අග්‍රස්ථයේ පවතින ගර්ත පක්ෂ්ම රහිත, පැතලි, තනි අපිච්ඡද සෛල ස්ථරයකින් සෑදී ඇත.

(04) ගර්ත පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.

(A) පෙනහැලි 2 තුළ ගර්ත මිලියන සංඛ්‍යාවක් ඇත.

(B) සෑම ගර්තයක්ම රුධිර කේශනාලිකා ජාලයකින් ආස්තරණය වී ඇත.

(C) ගර්ත තනන අපිච්ඡද සෛල පක්ෂ්මධර වේ.

(D) සර්පැක්ටන්ට් මඟින් ගර්ත පටලයේ පෘෂ්ඨීය ආතතිය ඉහළ නංවයි.

1. a හා b නිවැරදිය. 2. c හා d නිවැරදිය. 3. b හා d නිවැරදිය.
4. a හා d නිවැරදිය. 5. b හා c නිවැරදිය.

(05) ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවලියේ සමස්ථිතික යාමනය පිළිබඳව නිවැරදි වන්නේ,

(A) දර්ශීයව ආශ්වාස-ප්‍රශ්වාස ක්‍රියාවලිය අනිච්ඡානුගව යාමනය වේ.

(B) ශ්වසන ක්‍රියාවලියේ රිද්මය පාලනය කරන පාලන ස්ථාන මස්තිෂ්ක වෘන්තයේ ඇත.

(C) පටක තරලයේ pH අගය රුධිර CO_2 සාන්ද්‍රණයේ දර්ශකයකි.

(D) රුධිරයේ CO_2 සාන්ද්‍රණය ඉහළ යාමේදී පටක තරලයේ pH අගය ද ඉහළ නගින අතර H^+ සාන්ද්‍රණය අඩුවේ.

(E) ශ්වසන පාලන මධ්‍යස්ථානය වෙත O_2 මට්ටම මගින් කිසිදු බලපෑමක් ඇති නොවේ.

5.5.3 - මානව මූත්‍ර පද්ධතියේ දළ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) මූත්‍ර සෑදීමේ ක්‍රියාවලියට අදාළව නිවැරදි නොවන්නේ,

(A) අවිදූර සංවලිත නාලිකාවේදී ධන අකාබනික අයන සියල්ලම සක්‍රියවද සෘණ අකාබනික අයන සියල්ලම අක්‍රියවද ප්‍රතිශෝෂණය වේ.

(B) Cl^- ප්‍රතිශෝෂණය හා Na^+ ප්‍රතිශෝෂණය එකිනෙකට සමගාමීව සිදු නොවේ.

(C) අවිදූර සංවලිත නාලිකාවට ද්‍රව්‍ය ස්‍රාවය සක්‍රීය හෝ අක්‍රීය වීමට පුළුවන.

(D) ADH හෝර්මෝනයේ බලපෑම නිසා ජලය සක්‍රියව විදූර සංවලිත නාලිකාවෙන් ප්‍රතිශෝෂණය වේ.

(E) මූත්‍ර සංග්‍රාහක ප්‍රණාලවල ගමන් කිරීමේදී යූරියා සුළු වශයෙන් අන්තරාල තරලයට මුදා හැරීම සිදුවේ.

5.6.1 - සතුන්ගේ ස්නායු පද්ධතිවල සංවිධාන රටා

(01) පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

1. උත්තේජ වලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් ඇතැම් සත්ත්වයින්ට නොමැත.
2. සත්ත්වයින්ට තම සමායෝජන හැකියාව, පැවැත්ම තහවුරු කර ගැනීමට අනිවාර්ය අංගයක් නොවේ.
3. බාහිර පරිසරයේ සැලකිය යුතු වෙනස්කම් ඇති වුවද දේහයේ අභ්‍යන්තර පරිසරය සාපේක්ෂව පටු කායික විද්‍යාත්මක සීමා තුළ පවත්වා ගැනීම සමස්ථිතිය නම් වේ.
4. සත්ත්වයින්ට මෙන්ම ශාක වලටද සමායෝජනය සඳහා වෙනස් පද්ධති පිහිටයි.
5. ජීවියෙකු ප්‍රතිචාර දක්වනුයේ බාහිර පරිසරයෙන් ලැබෙන උත්තේජ වලට පමණි.

මිනිස් මොළයේ ව්‍යුහය හා කෘත්‍යයන්

(01) මානව මොළය පිළිබඳව නිවැරදි වන්නේ,

1. පූර්ව මොළයෙන් මස්තිෂ්කය, තැලමස, හයිපොතැලමස පමණක් විකසනය වේ.
2. මධ්‍ය මොළයෙන් මස්තිෂ්ක වෘන්තයේ කොටසක් සෑදෙයි.
3. අනුමස්තිෂ්කය, වැරෝලි සේතුව, සුෂුම්නා ශීර්ෂකය හා පිට්යුටරිය අතර මොළයෙන් සෑදේ.
4. මස්තිෂ්ක වෘන්තයට මධ්‍ය මොළය ඇතුළත් නොවේ.
5. ධූසර ද්‍රව්‍ය ගොනුවක් වූ කැලෝස දේහයෙන් මස්තිෂ්ක අර්ධගෝල දෙක එකිනෙක සම්බන්ධ කරනු ලැබේ.

(02) මිනිස් මොළයේ තැලමස පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න. නිවැරදි ප්‍රකාශ වන්නේ,

(A) කැලෝස දේහවලට වහාම පහළින් පිහිටයි.

(B) එය ශ්වේත හා ධූසර ද්‍රව්‍ය අඩංගු ගොනු 2 කින් සෑදේ.

(C) මස්තිෂ්ක වෘන්තයට ඇතුළත් ය.

(D) මෙය ප්‍රතිග්‍රාහකවලින් තොරතුරු ලබාගන්නා ප්‍රධාන මධ්‍යස්ථානයයි.

(E) පූර්ව මොළයෙන් තැලමස විකසනය නොවේ.

(03) මධ්‍ය මොළය පිළිබඳව අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

1. මස්තිෂ්කය හා වැරෝලි සේතුව අතර මස්තිෂ්කයට පහළින් හා වැරෝලි සේතුවට ඉහළින් පිහිටයි.
2. මධ්‍ය මොළය දෘෂ්ටි හා ශ්‍රවණ ප්‍රතීක සමායෝජනය කරයි.
3. මධ්‍ය මොළය, මස්තිෂ්ක වෘන්තයේ ඉහළ කොටසයි.
4. තුන්වන හා හතරවන මස්තිෂ්ක කෝෂිකා සම්බන්ධ කරමින් ඇති මස්තිෂ්ක සුෂුම්නා තරලය මධ්‍ය මොළය වටා පවතී.
5. මෙය ආරෝහණ හා අවරෝහණ ස්නායු තන්තු හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි.

(04) නිවැරදිව ගලපා නැති යුගලය වන්නේ,

1. හයිපොතැලමස - දේහයේ ජල තුල්‍යතාව යාමනය
2. වැරෝලි සේතුව - විශාල පරිමාණයෙන් සිදුවන දේහ චලන සමායෝජනය
3. අනුමස්තිෂ්කය - ඉරියව්ව හා සමබරතාව පවත්වා ගැනීම
4. සුෂුම්නාව - දිවීම, නැගීම වැනි විවිධ දේහ චලන සමායෝජනය
5. මස්තිෂ්කය - ඉච්ඡානුග පේශි සංකෝචනය ආරම්භය හා පාලනය

(05) පහත ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

1. අනුමස්තිෂ්කය වැරෝලි සේතුවට පිටුපසින් හා මස්තිෂ්කයේ මධ්‍ය කොටසට පහළින් පිහිටයි.
2. ප්‍රතීක මධ්‍යස්ථාන කීපයක්ම සුෂුම්නා ශීර්ෂකයේ පිහිටයි.
3. සුෂුම්නාව මධ්‍යයේ ශ්වේත ද්‍රව්‍යවලින් වටවී ඇති මධ්‍ය නාලය පිහිටයි.
4. තැලමස හා පිට්යුටරි ග්‍රන්ථියේ අපර ඛණ්ඩිකාව ස්නායු තන්තු මගින් එකිනෙකට සම්බන්ධිතව පවතී.
5. මස්තිෂ්ක අර්ධගෝලවල බාහිකය හා මජ්ජාව ඛණ්ඩිකා 4 කට බෙදී පවතී.

5.6.3 - ස්නායු ආවේග ජනනය හා සම්ප්‍රේෂණය

(01) පර්යන්ත ස්නායු පද්ධතියට අදාලව අසත්‍ය වන්නේ,
1. ස්වයංසාධක ස්නායු පද්ධතියට සිනිඳු පේශි හා හෘත් පේශිද අදාළ වේ.
2. අනුවේගී පද්ධතිය හා ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය සාමාන්‍යයෙන් දේහයේ අනිච්ඡානුග ක්‍රියාවලි පාලනය කරයි.
3. අනුවේගී ස්නායු පද්ධතිය මඟින් මුත්‍රාශය හිස් වීම දිරිගන්වයි.
4. පිත්තාශයේ ක්‍රියාවලි උත්තේජනය ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතියෙන් සිදු වේ.
5. පෙනහැලි තුළ ශ්වාසනාලිකා ඉහිල්වීම අනුවේගී ස්නායු පද්ධතියෙන් සිදු වේ.

(02) පහත ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය වන්නේ,
1. දේහයේ සෛල අතරින් න්‍යුරෝනවල පමණක් ප්ලාස්මා පටලය දෙපස අසමාකාර ආරෝපණ ව්‍යාප්තියක් දැකිය හැකිය.
2. අක්‍රිය විභවයේ ඇති නියුරෝනයක විභව අන්තරය -50mV වියහැකිය.
3. අක්‍රිය පටල විභවය පවත්වා ගැනීමට අක්‍රිය හා සක්‍රිය පරිවහන ක්‍රම දායක වේ.
4. අක්‍රිය විභව අවස්ථාවේදී විවෘතව පවතින Na^+ නාලිකා සංඛ්‍යාව K^+ නාලිකා සංඛ්‍යාවට වඩා විශාලය.
5. සෝඩියම් පොටෑසියම් පොම්පය සාන්ද්‍රණ අනුක්‍රමණයකට අනුව ක්‍රියාත්මක වේ.

(03) ක්‍රියා විභවයට අදාළව අසත්‍ය වන්නේ,
1. උත්තේජයක් හේතුවෙන් පටල විභවය දේහලීය අගයකට වඩා වැඩි අගයකට වෙනස්වූ විට ක්‍රියා විභවයක් ඇති වේ.
2. විධ්‍රැවනයේදී සෛලයක පටල විභවය එහි පිටතට සාපේක්ෂව ඇතුළත අඩු සෘණ අගයක් වන පරිදි වෙනස් වේ.
3. ප්‍රතිධ්‍රැවණයේදී Na^+ ඇතුළට ගැලීම වළකී.
4. උපරිධ්‍රැවණයේදීද සෝඩියම් නාලිකා වැසී පවතී.
5. ප්‍රතිධ්‍රැවණයේදී පොටෑසියම් නාලිකා විවෘතව පවතින අතර උපරිධ්‍රැවණයේදී පොටෑසියම් නාලිකා ද වැසී පවතී.

(04) පහත ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. සමහර වායු වර්ග ස්නායු සම්ප්‍රේෂක ලෙසට ක්‍රියාත්මක වේ.
2. හීනෝන්මාදය ඇති අයගේ ස්නායු සම්ප්‍රේෂක ලෙස ඩෙපමයින් භාවිතා කරන ස්නායුක මාර්ගවලට බාධා ඇතිවේ.
3. පේශී චලනවල සමායෝජනය හා පාලනය නැති වී යෑම සිදුකරන ප්‍රගාමී චාලක ආබාධයක් ලෙස පාකින්සන්ස් රෝගය දක්විය හැකිය.
4. මතකය නැතිවීමට අදාල රෝගී තත්ත්වයක් ලෙස ඩිමෙන්ශියාව දක්වීමට පුළුවන.
5. ස්නායු පද්ධතියට අදාල ඇල්ශයිමර් රෝගය ඵලදායී ප්‍රතිකාර හරහා සම්පූර්ණයෙන්ම සුව කළ හැකිය.

(05) යාන්ත්‍ර ප්‍රතිග්‍රාහක සම්බන්ධව සත්‍ය වන්නේ,
1. මැද කනෙහි බිත්තියෙහි ඇති විකරණය වූ ස්වේද ග්‍රන්ථිවලින් කලාඳුරු ස්‍රාවය වේ.
2. මැද කන හා ඇතුළු කන අතර පවතින අණ්ඩාකාර ගවාක්ෂය තුනී තන්තුමය පටකයකින් වැසී පවතී.
3. ආලින්ද නාලය අණ්ඩාකාර ගවාක්ෂයෙන් හටගනී.
4. ආලින්ද නාලය හා කර්ණපටහ නාලය අන්තෝවසා තරලයෙන් පිරී පවතී.
5. කෝර්ටි අවයවයේ ශ්‍රවණ සංවේදන ලෙස චාලක ස්නායුවල අනුශාඛිකා ක්‍රියාකරයි.

(06) මානව අන්තරාසර්ග පද්ධතියට අදාලව අසත්‍ය වන්නේ,
1. ක්ෂුද්‍රාන්තය හා වෘක්ක වැනි අවයව වල අන්තරාසර්ග සෛල දැකීමට පුළුවන.
2. TSH හෝර්මෝනය මඟින් තයිරොයිඩ් ග්‍රන්ථියේ වර්ධනය උත්තේජනය කරයි.
3. වර්ධක හෝර්මෝනය මඟින් පරිවෘත්තීය යාමනය සිද කරයි.
4. පූර්ව පිටියුටරිය මඟින් බහුලවම සංස්ලේෂණය කරනු ලබන්නේ වර්ධක හෝර්මෝනයයි.
5. සෑම හෝර්මෝනයකම පරිවහනයට රුධිර සංසරණ පද්ධතිය හරහාම සෑමවිටම සිදුවේ.

(07) පහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,
(A) ප්‍රොලැක්ටින් පෝෂී හෝර්මෝනයක් නොවුනද ප්‍රොලැක්ටින් ස්‍රාවී හෝර්මෝනය පෝෂී හෝර්මෝනයකි.
(B) වර්ධක හෝර්මෝනය පෝෂී හෝර්මෝනයක් ලෙස කිසිවිටෙක ක්‍රියා නොකරයි.
(C) හයිපොතැලමස මඟින් පූර්ව පිටියුටරියෙන් මුදාහරින හෝර්මෝන 2 ක් නිපදවයි.
(D) TSH ස්‍රාවය නිශේදනයට හයිපොතැලමසෙන් ස්‍රාවය කරන සමහර හෝර්මෝන බලපායි.
(E) CRH පෝෂී හෝර්මෝනයක් නොවේ.

(08) පහත ප්‍රකාශවලින් අසත්‍ය වන්නේ,
1. සැකිලි හා ස්නායු පද්ධතිවල සාමාන්‍ය වර්ධනයට හා විකසනයට තයිරොයිඩ් හෝර්මෝන අවශ්‍ය වේ.
2. තයිරොයිඩ් ග්‍රන්ථියෙන් නිපදවෙන සමහර හෝර්මෝන බහිස්ස්‍රාවී පද්ධතිය මත ක්‍රියා කරයි.
3. පැරාතයිරොයිඩීය හෝර්මෝන මඟින් කැල්සිටොනින් වලට ප්‍රතිවිරුද්ධ ආකාරයට ක්‍රියාකරයි.
4. තයිමොසින් වසා සෛල මත ක්‍රියාකර T වසා සෛලවල විකසනයේ හා පරිණතිය යාමනය කරයි.
5. මෙලටොනින් මඟින් වැඩිවියට පත්වීමට පෙර ලිංගික ග්‍රන්ථිවල වර්ධනය හා විකසනය උත්තේජනය කරයි.

(09) අධිවෘක්ක ග්‍රන්ථි සම්බන්ධව අසත්‍ය වන්නේ,
1. අධිවෘක්ක බාහිකයෙන් හා මජ්ජාවෙන් ස්‍රාවය වන හෝර්මෝන දේහයේ ආතති ප්‍රතිචාර සඳහා මැදිහත් වේ.
2. අධිවෘක්ක ග්‍රන්ථිය මගින් නිපදවන ප්‍රධාන මිනරලකෝර්ටිකෝයිඩ් හෝර්මෝනය වන්නේ ඇල්ඩොස්ටෙරෝන්ය.
3. ඇල්ඩොස්ටෙරෝන් මගින් වෘක්කීය නාලිකාවලින් Na^+ හා K^+ ප්‍රතිශෝෂණය දිරිගන්වයි.
4. ඇල්ඩොස්ටෙරෝන් මගින් ජලය හා විද්‍යුත් විච්ඡේද්‍ය වල සමතුලිතතාවය පවත්වා ගනී.
5. අධිවෘක්ක මජ්ජාව මගින් ස්‍රාවය කරන හෝර්මෝන ප්‍රධාන වශයෙන් දායක වන්නේ ඉක්මන් භාවිතාව සඳහා පවතින රසායනික ශක්තිය වැඩිකිරීමයි.

(10) අලිංගික ප්‍රජනන ක්‍රම සම්බන්ධව සත්‍ය වන්නේ,
1. පෘෂ්ඨවංශිකයන් සියල්ලම පෙන්වන්නේ ලිංගික ප්‍රජනනය පමණි.
2. Hydra පුනර්ජනනය පෙන්වන අපෘෂ්ඨවංශීන් කාණ්ඩයකි.
3. පාතෙනොහවනයෙන් ඇතිවන ප්‍රජනිතයන් කුඩිත්තන් හා බඹරුන් සෑමවිටම ද්විගුණ වේ.
4. අලිංගික ප්‍රජනන ක්‍රමවලදී මාතෘ ජීවියාට ප්‍රවේණිකම සර්වසම නොවන ජනිතයින් ඇතිවේ.
5. සමහර මත්ස්‍යයන් අලිංගික ප්‍රජනන ක්‍රම පෙන්වයි.

(11) ශුක්‍රාණුජනනය පිළිබඳව අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. ශුක්‍රාණුජනනයේදී එක් ශුක්‍රාණු මාතෘ සෛලයකින් පරිණත ශුක්‍රාණු 4 ක් ඇති කරයි.
2. ශුක්‍රාණුජනනය සඳහා ආසන්නව සති 7 ක කාලයක් ගත වේ.
3. මෙම ක්‍රියාවලිය වැඩිවියට පත්වීමේ සිට මරණය දක්වාම සිදුවේ.
4. ශුක්‍රාණු මූලික සෛල ප්‍රවේණිකව ප්‍රාථමික ශුක්‍රාණු වලට සර්වසම වේ.
5. එක් ශුක්‍රාණු මාතෘ සෛලයකට අදාලව නිපදවෙන පරිණත ශුක්‍රාණු 4 ප්‍රවේණිකව එකිනෙකට සර්වසම වේ.

5.8.3 ස්ත්‍රී ප්‍රජනන පද්ධතියට අදාළව නිවැරදි නොවන්නේ,
1. ඩිම්බ කෝෂ දෙකෙහිම පිටත ස්ථරයේ සම්බන්ධක පටක පවතින අතර එය ජනක අපිච්ඡදයෙන් වැසීඇත.
2. පැලෝපීය නාළයේ පළල ගර්භාෂය ආසන්නයේදී උපරිමයට ළඟා වේ.
3. ගර්භාෂයේ විදූර කෙළවර පටු වී ඇති අතර එය ග්‍රීවය නම් වේ.
4. අණ්ඩෝද්භවයේදී ඩිම්බ මෝචනය වන විට අණ්ඩ සෛලයේ මුළු වර්ණදේහ 46 ක් පවතී.
5. යෝනි මාර්ගය මගින් බාහිර ප්‍රජනක අවයව හා අභ්‍යන්තර ප්‍රජනක අවයව සම්බන්ධ කරයි.

(13) සත්ත්ව රාජධානියේ සැකිලි ආකාර සම්බන්ධව නිවැරදි වන්නේ,
1. ත්‍රිප්‍රස්තරික ජීවීන් ද්‍රවස්ථිතික සැකිලි නොදරයි.
2. ආත්‍රොපෝඩාවන්ගේ බාහිර සැකිල්ල ප්‍රෝටීන හෝ කැල්සියම් කාබනේට් වලින් නිර්මාණය වී ඇත.
3. එකම ජීවියෙකුගේ තිබිය හැක්කේ එක් සැකිළි අකාරයක් පමණි.
4. බාහිර සැකිල්ල සෛලීය හෝ අසෛලීය විය හැකිය.
5. කෝඩේටාවන්ට කාටිලේජමය අභ්‍යන්තර සැකිලි තිබිය නොහැකිය.

(14) පහත ප්‍රකාශ සලකන්න.
(A) සියලුම මොලුස්කාවන් කවච දරති.
(B) ආත්‍රොපෝඩාවන් සියල්ලම කයිටිනීමය බහිස්සැකිළි දරති.
(C) සත්ත්ව රාජධානියේ සෑම අන්තඃසැකිල්ලක්ම සෛලීය වේ.
(D) කෝඩේටාවන් දරන සියලුම සැකිලි සෛලීය වේ.

මින් සත්‍ය වන්නේ,

1. b හා d පමණි.	2. b, c හා d පමණි.	3. b පමණි.
4. a, b, c, d සියල්ලමයි.	5. වෙනත් සංයෝජනයකි.	

(15) මානව ග්‍රෛවී කශේරුකාවල ලාක්ෂනික සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. කශේරුවේ ඉහළින්ම ප්‍රමාණයෙන් සමාන ග්‍රෛවී කශේරුකා 7 ක් දක්නට ලැබේ.
2. සියලුම ග්‍රෛවී කශේරුකාවලට කශේරු ධමනි නාල හා ද්විභින්න කණ්ටක ප්‍රසර ඇත.
3. හිස්කබල හා ඇට්ලස් කශේරුකාව දත්තාකාර ප්‍රසරය මගින් සම්බන්ධ වේ.
4. පළමු ග්‍රෛවී කශේරුකාව අපර කපාල අග්‍ර සමඟ සන්ධානය වීමට උත්තල සන්ධාන පෘෂ්ඨ දරයි.
5. දෙවන ග්‍රෛවී කශේරුකාව වන අක්ෂ කශේරුකාවේ පමණක් විශේෂිත ප්‍රසරයක් ලෙස දත්තාකාර ප්‍රසරය පිහිටයි.

(16) මානව හිස්කබල පිළිබඳව අසත්‍ය වන්නේ,
1. වක්ත්‍ර අස්ථි 13 අතර යුගලමය නොවන අස්ථි 3 ක් ඇත.
2. මානව කපාල ධාරිතාව 1500 ml පමණ වෙයි.
3. වයස අවුරුදු 4 ක පමණ දරුවෙකුගේ රණ්ඩු පැවතිය නොහැකිය.
4. ඌර්ධව හනුක අස්ථිය පමණක් චලනය කළ හැකිය.
5. ඌර්ධව හනුක අස්ථිය හා අධෝහනුක අස්ථිය කපාලය සමඟ සම්බන්ධව පිහිටයි.

(17) පූර්ව ගාත්‍රය පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න. නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ප්‍රගණ්ඩාස්ථියේ අවිදූර කෙළවර අරාස්ථිය හා අන්වරාස්ථිය සමඟ සන්ධානය වීමට පෘෂ්ඨ පවතී.
2. අරාස්ථිය හා අන්වරාස්ථිය විදූර කෙළවරේදී පමණක් එකිනෙක හා සන්ධානය වෙයි.
3. වැලමිට සන්ධිය මගින් යටිබාහුවේ සම්මිංජන හා ප්‍රසර්ජන චලන සඳහා පමණක් අවස්ථාව සලසයි.
4. හස්ථකූර්චාස්ථි හත අවිදූර හා විදූර ලෙස පේළි 2 කට සැකසී ඇත.
5. සෑම ඇඟිල්ලක්ම ඇඟිලි පුරුක් 3 බැගින් දරයි.

(18) අපර ගාත්‍රය පිළිබඳව සත්‍ය වන්නේ,
1. කලව සැදී ඇති උරෝස්ථිය දේහයේ ඇති බරම අස්ථියයි.
2. ඌර්වස්ථියේ විදූර කෙළවර අනුජංඝාස්ථිය හා දණිස්කටුව සමඟ සම්බන්ධිතය.
3. කෙණ්ඩය සාදන අස්ථි 2 න් මධ්‍යයේ අනුජංඝාස්ථිය පිහිටයි.
4. ජංඝාස්ථියේ හා අනුජංඝාස්ථියේ විදූර කෙළවර විශේෂිත පාදකූර්චෝපරියක් සමඟ සන්ධානය වෙයි.
5. පාදයට අන්වායාම වක්‍ර 2 ක් හා තීර්යක් වක්‍ර 1 ක් ඇත.

(19) මානව කංකාල පද්ධතියේ සන්ධි ආශ්‍රිතව වැරදි වන්නේ,
1. ගෝල කුහර සන්ධි - උකුළු සන්ධිය
2. අසව් සන්ධි - දණහිසේ සන්ධිය
3. අසව් සන්ධි ආශ්‍රිතව සිදුකළ හැක්කේ සම්මිංජනය හා ප්‍රසර්ජනය පමණි.
4. වැඩිම භ්‍රමණ පරාසයක් ලබාදෙන්නේ ගෝල කුහර සන්ධි මඟිනි.
5. හිස භ්‍රමණය කිරීම සිදුවන්නේ අසව් සන්ධියක් මඟිනි.

(20) නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ
(A) අස්ථි පර්වදාහයේදී සිදුවන්නේ අස්ථි පටකය ක්ෂය වීම වේ.
(B) අස්ථි වෛර්වය සාපේක්ෂව වයස්ගත පිරිමින් අතර බහුලය.
(C) සන්ධි වේදනාව හා අස්ථි බිඳීම අස්ථි පර්වදාහයේ රෝග ලක්ෂණ වේ.
(D) ආර්තවහරණයෙන් පසුව ඇතිවන හෝර්මෝන අසමතතුලිතතාව අස්ථි වෛවර්වයට හේතු වේ.
(E) අස්ථි වෛවර්වයේදී සන්ධි වල සන්ධාන කාටිලේජය ගෙවීයාම සිදුවේ.